

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021

පරිසර අමාත්‍යාංශය

පරිසර අමාත්‍යාංශය

ගරු මහින්ද අමරවීර මැතිතුමා

පරිසර අමාත්‍ය

අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන්

වෛද්‍ය අනිල් ජාසිංහ මහතා
ලේකම්

ආර් ඒ ආර් ආර් රූපසිංහ මහතා
අතිරේක ලේකම් - පාලන

ඩබ් ජී ඩබ් එම් ඩබ් ටී බී දිසානායක මහතා
අතිරේක ලේකම් - පරිසර ප්‍රතිපත්ති

ඩබ් ඩී එස් සී වැලිවත්ත මහතා
අතිරේක ලේකම් - ස්වභාවික සම්පත්

පී මුදලිගේ මහතා
අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රමසම්පාදන

ඒ එච් එල් ඩී ගාමිණී විජේසිංහ මහතා
අතිරේක ලේකම් - පරිසර ව්‍යාපෘති අධ්‍යාපන පුහුණු

ආර් ඩි එස් ජයතුංග මහතා
අතිරේක ලේකම් - පරිසර සංවර්ධන

සුනේත්‍රා පතිරණ මිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන

මධ්‍යම පරිසර අධිකාරිය	- එස් අමරසිංහ මහතා, සභාපති
	- පී බී හේමන්ත ජයසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල්
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්‍යාංශය	- අනුර වල්පොල මහතා, සභාපති
	- ඉංජි සජ්ජන ද සිල්වා මහතා, අධ්‍යක්ෂ ජනරාල්
සිමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම	- ආර් එම් එස් ප්‍රියන්ත කුමාර රත්නායක මහතා ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්	- ජී ඒ එම් සී ආරියතිලක මහතා ප්‍රධාන විධායක නිලධාරී

		පටුන	පිටු අංක
1.		1 පරිච්ඡේදය	
	1.1	හැඳින්වීම	01
	1.2	අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර	02
	1.3	ප්‍රධාන කාර්යයන්	03
	1.4	සංවිධාන සටහන	04
	1.5	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන	05
	1.6	අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/ ආයතනය යටතේ පවතින අරමුදල්	05
	1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	05
2.		2 පරිච්ඡේදය - ප්‍රගතිය	09
	2.1	පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රගතිය	09
	2.1.1	පාරිසරික ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ක්‍රියාකාරී සැලසුම්	09
	2.1.2	ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය	10
	2.1.3	දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම	11
	2.1.4	වායු සම්පත් කළමනාකරණය	13
	2.1.5	පරිසර සැලසුම් හා ආර්ථික	14
	2.1.6	පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය	15
	2.1.7	භූමි සම්පත් සංරක්ෂණය	16
	2.1.8	පරිසර අධ්‍යාපන හා දැණුවත්කිරීම්	17
	2.1.9	අන්තර්ජාතික පාරිසරික සබඳතා	20
	2.1.10	පාරිසරික දින සැමරීම	22
	2.1.11	සුරකිමු ගංගා ජාතික වැඩසටහන	23
	2.1.12	හුස්ම දෙන තුරු ජාතික රුක්රෝපණ වැඩසටහන	24
	2.1.13	ආයතනික කටයුතු	25
	2.1.14	අභ්‍යන්තර විගණන	25
	2.1.15	පරිසර ගැටළු පිළිබඳ මහජන පැමිණිලි, අභියාචනා හා මාධ්‍ය වාර්තා	25
	2.1.16	නෛතික කටයුතු	25
	2.2	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය	26
	2.2.1	පාරිසරික සංවේදී භූමි ප්‍රදේශ වල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ (ESA) ව්‍යාපෘතිය	26
	2.2.2	පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කලමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය	27
	2.2.3	මිනමාටා සම්මුතිය යටතේ "රසදිය මූලික තක්සේරු වාර්තාව" පිලිබඳ ව්‍යාපෘතිය	28
	2.2.4	ගෝලීය පාරිසරික පහසුකම යටතේ පවතින එක්සත්ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියට අදාල ජාතික වාර්තාකරණ ක්‍රියාවලිය	28
	2.2.5	මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනුරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	29
	2.2.6	ශ්‍රී ලංකා තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	30
	2.2.7	දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය	31

			පිටු අංක
	2.2.8	ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත තුල භාවිතයෙන් පසු ඉවතලන කෘෂිරසායන ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතිය	32
	2.2.9	ශ්‍රී ලංකාවේ තිරසාර හා කාර්යක්ෂම විදුලි සංචලතා පද්ධතියක් ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යාපෘති යෝජනාව පිළියෙල කිරීම	32
	2.2.10	"ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මකභාවය තිරසාර කිරීම: කොවිඩ්-19 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට පියවර 25ක්" ව්‍යාපෘතිය	32
	2.2.11	ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුලින් වන, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය	33
	2.2.12	ජෛව සුරක්ෂිතතාවය පිලිබඳ කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛව සුරක්ෂිතතා රාමුව ක්‍රියාත්මක කිරීම	35
	2.3	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල ප්‍රගතිය	36
	2.3.1	මධ්‍යම පරිසර අධිකාරිය	36
	2.3.2	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	41
	2.3.3	ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම	45
	2.3.4	ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්	48
3.		**තුන්වන පරිච්ඡේදය -** වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	50
	3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	50
	3.3	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	52
	3.4	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	53
	3.5	මූල්‍ය ප්‍රකාශ සටහන්	54
	3.6	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	54
	3.7	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	55
	3.8	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	55
	3.9	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	55
	3.10	විගණකාධිපතිවරයාගේ වාර්තාව	56
4.		**හතරවන පරිච්ඡේදය -** කාර්ය සාධන දර්ශක	68
	4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	68
5.		**පස්වන පරිච්ඡේදය -** තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය	68
	5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	68
	5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	70
6.		**හයවන පරිච්ඡේදය -** මානව සම්පත් පැතිකඩ	70
	6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	70
	6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි	70
	6.3	මානව සම්පත් සංවර්ධනය	71
7.		**හත්වන පරිච්ඡේදය** – අනුකූලතා වාර්තාව	73

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද අංක 2187/27 දරණ 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අංක 2196/27 දරණ 2020.10.06 දිනැති අති විශේෂ සංශෝධිත ගැසට් නිවේදනය අනුව **"පරිසර අමාත්‍යාංශය"** පිහිටුවන ලදි. **මෙම අමාත්‍යාංශයට තිරසර සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය හා ස්වභාවික සෞන්දර්ය රැක ගනිමින් ස්වභාවික සම්පත් පරිහරණය කිරීම මෙන්ම වන, වෘක්ෂලතා, වෙරළ, වගුරු බිම්, ඇළ, දොළ, ගංහා හා වන ජීවීන් ආරක්ෂා කිරීම, කැළිකසළ වළක්වා ගැනීම හා ඉවත් කිරීම, පිරිසිදු නේවාසික පරිසරයක් හා තිරසර ආර්ථික සංවර්ධනයකට ගැලපෙන පරිදි පරිසර ප්‍රතිපත්ති හා ආයතනවලට අදාළ කටයුතු සිදු කිරීමේ කාර්යයන් පවරා ඇත. වර්තමානය වන විට පරිසර අමාත්‍යධුරය ගරු මහින්ද අමරවීර මැතිතුමා විසින් හොඹවනු ඇත.**

"සෞභාග්‍යයේ දැක්ම" නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අනෙකුත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "තිරසර පරිසරයක් " නිර්මාණය කිරීම සඳහා නීති සහ අණපනත්වලට අනුකූලව පරිසර විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ප්‍රමුඛ කාර්යයන් සඳහා **පරිසර අමාත්‍යාංශය** නායකත්වය සැපයීම සිදු කරණු ලබයි.

තවද

1. තිරසර පරිසර සංකල්පය, පාසැල් අධ්‍යාපනයේ සිට ප්‍රජාව තුළ ආකල්පමය වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

2. පරිසර ආශ්‍රිත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කොට පරිසර හිතකාමී මෙන්ම ජනතා හිතකාමී ලෙස එම ක්‍රියාවලිය මෙහෙයවීම සරල කිරීම.

3. පරිසර හිතකාමී නිෂ්පාදන, බෙදාහැරීම, ප්‍රවාහන සේවා, යටිතල පහසුකම්, නාගරික සංවර්ධන සහ ආයෝජන හා ආර්ථික කලාප කටයුතු මෙහෙයවීමේ දී ව්‍යාපාරික හා සංවර්ධන අවශ්‍යතා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ තුලනය කිරීම.

4. පරිසර සංරක්ෂණය සඳහා නවීන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම.

යන සුවිශේෂී ප්‍රමුඛතාවයන් ඔස්සේ පරිසර හිතකාමී මහජන සේවයක් ලබාදීම ප්‍රමුඛ කාර්යය වේ.



ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, සිමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම හා ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන සමග පරිසර අමාත්‍යාංශය රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත්වීමත්, ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස්වීමත්, හේතුවෙන් පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේම ආයතනික, නෛතික හා තාක්ෂණික රාමුව ශක්තිමත් කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය තිරසරව හා සකසුරුවම්ව ගොඩනැංවීම සඳහා සුවිශේෂී කාර්යයක් ඉටුකරයි.

මෙම වාර්තාව මගින් පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන, අමාත්‍යාංශයේ සියළු අංශ හා ව්‍යාපෘති මගින් 2021 වර්ෂයේ සිදු කරණ ලද සංවර්ධන හා සංරක්ෂණ කාර්යය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ දැක්ම

“තිරසර සංවර්ධිත ශ්‍රී ලංකාවක්”

අමාත්‍යාංශයේ මෙහෙවර

ස්වාභාවික සම්පත් මනාව කළමනාකරණය තුළින් පරිසර ආරක්ෂණය තහවුරු කරමින් තිරසර පරිසර කළමනාකරණය සඳහා නායකත්වය ලබාදීම.

1.3 පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්:

⇒ තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශවකරුවන්ගේ සහාගිත්වයෙන් පරිසර හා ස්වාභාවික සම්පත් ක්ෂේත්‍ර තුළ ඇති ගැටලු හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීම.

⇒ පරිසර හා ස්වාභාවික සම්පත් සංරක්ෂණයට සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාළ පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

⇒ පරිසර හා ස්වාභාවික සම්පත්වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි උපායමාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම හා නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

⇒ පරිසර හා ස්වාභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ තිරසර පරිසර සංකල්පය මෙන්ම වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම.

⇒ ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම.

⇒ පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම.

⇒ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.

⇒ යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා රාජ්‍ය රාජ්‍ය නොවන අංශවල හා මහජනතාවගේ කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන - පරිසර අමාත්‍යාංශය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන :

- මධ්‍යම පරිසර අධිකාරිය
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- සිමාසහිත GSMB තාක්ෂණික සේවා
- ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/ ආයතනය යටතේ පවතින අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ) ව්‍යාපෘතියේ නම	**1. පාරිසරික සංවේදි භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා**
ආ) දායක නියෝජිතායතනය	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන UNDP
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි.387.30
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2015-2021
අ) ව්‍යාපෘතියේ නම	2. **පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී**
ආ) දායක නියෝජිතායතනය	එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි.685.10
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2016-2022
අ) ව්‍යාපෘතියේ නම	**3.මීනමාටා සම්මුතිය යටතේ '' රසදිය මූලික තක්සේරු වාර්තාව පිලිබඳ ව්‍යාපෘතිය**
ආ) දායක නියෝජිතායතනය	එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි.12
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2016 –2022
අ) ව්‍යාපෘතියේ නම	**4. පරිහානියට පත් කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය**
ආ) දායක නියෝජිතායතනය	ආහාර කෘෂිකර්ම සංවිධානය FAO
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. 227
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2016-2021

අ) ව්‍යාපෘතියේ නම	**5. ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම**
ආ) දායක නියෝජිතායතනය	බහුපාර්ශවික අරමුදල MLF
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. 30
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	වාර්ෂික වැඩසටහනකි

අ) ව්‍යාපෘතියේ නම	**6. දේශගුණ විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය**
ආ) දායක නියෝජිතායතනය	ලෝක බැංකුව WB
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ඇ.ඩො.මි 1.8
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2020—2021

අ) ව්‍යාපෘතියේ නම	**7. එක්සත් ජාතින්ගේ කාන්තාරීකරනය පිටුදැකීමේ සම්මුතියේ වාර්තාකරණ ව්‍යාපෘතිය**
ආ) දායක නියෝජිතායතනය	එක්සත් ජාතින්ගේ කාන්තාරීකරනය පිටුදැකීමේ
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි.11.5
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2019-2022

අ) ව්‍යාපෘතියේ නම	**8. ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාටජිනා සංධානයට අනුකූලව ජාතික ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාර්ය රාමුව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය**
ආ) දායක නියෝජිතායතනය	ආහාර කෘෂිකර්ම සංවිධානය FAO
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ඇ.ඩො. 2,365"964
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2016—2022

අ) ව්‍යාපෘතියේ නම	**9. ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුලින් වන, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය.**
ආ) දායක නියෝජිතායතනය	**ගෝලීය පාරිසරික පහසුකම (GEF)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	**රු.මි 635.9**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021 - 2024**

අ) ව්‍යාපෘතියේ නම	**10.** පාරිසරික හා සමාජීය වශයෙන් සංවේදී කෘෂි පාරිසරික පද්ධති ස්ථාපිත කිරීම තුලින් භූමි හායනය අවම කිරීම හා ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් සෞඛ්‍ය සම්පන්න ගොවිජනතාවක් හා සමෘද්ධිමත්භාවය තහවුරු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය.
ආ) දායක නියෝජිතායතනය	ගෝලීය පාරිසරික පහසුකම **(GEF)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. **383**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021 - 2023**

අ) ව්‍යාපෘතියේ නම	**11.** සමුද්‍රීය අපද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික්: ප්ලාස්ටික් අපද්‍රව්‍ය පරිසර හිතකාමී කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය ජනනය වැළැක්වීම සහ අවම කිරීම.
ආ) දායක නියෝජිතායතනය	සංවර්ධන සහයෝගීතාව සඳහා වූ නෝර්වීජියානු නියෝජිතායතනය **(NORAD)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. **10.37**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021 - 2022**

අ) ව්‍යාපෘතියේ නම	**12.** ආසියා-පැසිෆික් රටවල එක් වරක් පමණක් භාවිතා කර ඉවතලන ප්ලාස්ටික් සහ එහි අපද්‍රව්‍ය පරිසර හිතකාමී කළමනාකරණය පිළිබඳ ධාරිතා වර්ධනය.
ආ) දායක නියෝජිතායතනය	සංවර්ධන සහයෝගීතාව සඳහා වූ නෝර්වීජියානු නියෝජිතායතනය **(NORAD)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. **5.4**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021 - 2023**

අ) ව්‍යාපෘතියේ නම	**13.** රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන වැඩසටහන.
ආ) දායක නියෝජිතායතනය	මිනමාටා සම්මුතියේ විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. **32.15**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021 - 2023**

අ) ව්‍යාපෘතියේ නම	**14.** ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත තුල භාවිතයෙන් පසු ඉවතලන පලිබෝධනාශක ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතිය
ආ) දායක නියෝජිතායතනය	ලෝක සෞඛ්‍ය සංවිධානය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. **2.585**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021**

අ) ව්‍යාපෘතියේ නම	**15.** අක්මා සෛල පිලිකා තත්ත්වය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් අක්මා ආරක්ෂාකාරී ප්‍රතිකාර ක්‍රමයක් ලෙස රසදිය අඩංගු ‘‘ලෝකනාථරස’’ ඖෂධ භාවිතය පිළිබඳ අධ්‍යනය.
ආ) දායක නියෝජිතායතනය	ස්විට්සර්ලන්ත රජය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු. මි. **4.81**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	**2021 - 2022**

02 පරිච්ඡේදය – ප්‍රගතිය

2.1 පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

2.1.1 පාරිසරික ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ක්‍රියාකාරී සැලසුම්

ජාතික පරිසර ප්‍රතිපත්තිය

2003 වෂර්යේදී ජාතික පරිසර ප්‍රතිපත්තිය හා උපායමාගර් හඳුන්වා දුන් පසු දේශියව මෙන්ම ගෝලීයව සිදු වෙමින් පවතින සංවධර්න ක්‍රියාදාමයන් හමුවේ ඇති වී තිබෙන නව පාරිසරික අභියෝග ජයගැනීමට මෙම ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය දැඩිව මතු වීය. මෙම පසුබිම තුළ "රට හඳන - සෞභාග්‍යයේ දැක්ම", පාරිසරික කළමනාකරණයේ වෙනස් වන ප්‍රමුඛතා, ඇති වූ නව අභියෝග සහ අනෙකුත් අදාල ජාතික ප්‍රතිපත්ති හඳුන්වා දීමත් සමග ප්‍රතිපත්තිවල දැක්ම වෙනස් කිරීම යන කරුණු ඉස්මතු කරමින් පරිසර අමාත්‍යාංශය අනෙකුත් පාශර්වකාර ආයතන සමඟ එක්ව පරිසර ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම ආරම්භකර ඇති අතර දැනට අවසන් කෙටුම්පත මහජන අදහස් සඳහා යොමු කර ඇත.

පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රතිපත්තිය

රක්ෂිත ප්‍රදේශයන් ගෙන් පරිබාහිරව ජෛව විවිධත්වය, පරිසර පද්ධති සේවාවන් හා දේශගුණ විපයර්යසයන්ට ඔරොත්තුදීමේ හැකියාව සපයන පාරිසරික සංවේදී ප්‍රදේශ වල සිදුවන අවිධිමත් මානව ක්‍රියාකාරකම් වලින් පරිසර පද්ධති වලට සිදුවන හානිය අවම කර සංරක්ෂණය කිරීමටත්, පරිසර පද්ධති තිරසාර ලෙස සංවධර්නයට දායක කර ගැනීමටත්, උපායමාගර්ක ප්‍රවේශයක් ලෙස පාරිසරික සංවේදී ප්‍රදේශ පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කරන ලදී. රාජ්‍ය අංශය, පුද්ගලික අංශය, ප්‍රජාව හා විද්වතුන් යන සියළු පාශර්වයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින් සම්පාදනය කල පාරිසරික සංවේදී ප්‍රදේශ පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත

ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම

පරිසර අමාත්‍යාංශය විසින් 2021-2030 සඳහා වූ ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති අතර එය ජාතික පරිසර ප්‍රතිපත්තියට අනුකූල උපායමාගර් සහ ක්‍රියාකාරී සැලැස්මක් සහිත මෙහෙයුම් සැලැස්මකි. පාරිසරික සැලසුම් හිඩැස පිරවීමේදී, එක්සත් ජාතීන්ගේ තිරසර සංවධර්න අභිමතාථර් (SDGs) හා බැඳුනු තිරසර සංවධර්නය සාක්ෂාත් කර ගැනීමේදී 21 වන සියවසේදී ඇති වූ පාරිසරික අභියෝගයන් ආමන්ත්‍රණය කෙරෙන තේමාවන් නවයකින් සමන්විත වේ. පාශර්වකරුවන් සමඟ අභ්‍යන්තර සාකච්ඡා සහ වලංගුකරණ රැස්වීම් පවත්වා ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අවසන් කර ඇත.

පාරිසරික අභියෝගයන් ආමන්ත්‍රණය කෙරෙන තේමාවන්
1. වායු තත්ත්ව කළමනාකරණය.
2. ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර භාවිතය.
3. තිරසාර බව සඳහා දේශගුණික ක්‍රියාමාගර්.
4. වෙරළබඩ සහ සමුද්‍ර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම.
5. තිරසාර ඉඩම් සම්පත් කළමනාකරණය.
6. සමස්ථ අපද්‍රව්‍ය කළමනාකරණය.
7. ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය.
8. නගර සහ මානව ජනාවාස වල පාරිසරික කළමනාකරණය.
9. හරිතකරණ කමර්ාන්ත.

කඩොලාන පිළිබඳ උපායමාගර්ක ක්‍රියාකාරී සැලැස්ම

කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, එම ප්‍රතිපත්තියේ තිරසාරභාවය සහ එහි සඳහන් පරිදි සංරක්ෂණය, පයේර්ෂණ, ඉඩම් භාවිතය වෙනස්වීම් සහ තිරසාර සම්පත් නිස්සාරණය සහ ප්‍රතිස්ථාපන නිණර්ායකවලට අනුකූලව උපායමාගර්ක ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අවසන් කර ඇත.

"ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2021-2030"

Global Environmental Strategies (IGES)/Centre for Collaborating with UNEP on Environmental Technologies (CCET) ආයතනයේ සහයෝගයෙන් යුතුව 2021 අගෝස්තු 25 දින දියත් කරන ලද අතර එම අවස්ථාවෙන් අනතුරුව දෙදින පුහුණු වැඩසටහනක් පැවැත්විණි. ප්ලාස්ටික් අවභාවිතය සහ ප්ලාස්ටික් දීසර් කාලීන හායනයෙන් හා නිෂ්පාදනය මගින් ඇතිවන ක්ෂුද්‍ර ප්ලාස්ටික් මගින් පරිසරයට හා මානව සෞඛ්‍යයට සිදුවන බරපතල ගැටලු විසඳීම සඳහා මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

ජාතික තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සඳහා ජාතික තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ක්‍රියා ඇතුළත් කර ජාතික තිරසාර පරිභෝජන හා නිෂ්පාදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගන්නා ලදි.

ජෛවවිවිධත්වය හා බැඳුනු පාරම්පාරික දැනුම හා ව්‍යවහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපායමාර්ග

2021.04.07 දින අදාළ පාර්ශවකාර ආයතන සම්බන්ධ කර ගනිමින් එළිදක්වන ලදී.

හරිත ප්‍රසම්පාදන ජාතික ප්‍රතිපත්තිය මගින් පාරිසරික බලපෑම් අවම කරන භාණ්ඩ, සේවා සහ වැඩ තෝරා ගනිමින් සමාගමක් හෝ සංවිධානයක් විසින් තම නිෂ්පාදනවල නිෂ්පාදන චක්‍රයේ විවිධ අවධීන්හි සිදුවන පාරිසරික බලපෑම් තක්සේරු කිරීම මෙමගින් අපේක්ෂිත අතර මෙම සඳහා මහජන අදහස් ලබා ගැනීම සඳහා 2021.12.15 වැනි දින කටයුතු සිදු කරන ලදී.

2.1.2 ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය

ශාක පිළිබඳ ජාතික රතු දත්ත ලැයිස්තුව - 2020 සහ මිරිදිය මත්ස්‍යයින් පිළිබඳ ජාතික රතු දත්ත ලැයිස්තු තක්සේරුව –2020 එළිදැක්වීම



වෘක්ෂලතා පිළිබඳ ජාතික රතු දත්ත ලේඛණය - 2020 හි ශ්‍රී ලංකාවේ ශාක විශේෂ වල, විශේෂයෙන් සපුෂ්ප ශාක හා පර්ණාංග ශාක වල ජාතික සංරක්ෂණ තත්ත්වය හා මෙයට අමතරව පරිණාමිකව හටගත් ශාක (ඇල්ගී, ලයිකන, බ්‍රයෝෆයිට්) සහ ශ්‍රී ලංකාවේ දිලීර වල ලැයිස්තුන්ද ඇතුළත් කර ඇත.

මෙම ග්‍රන්ථය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ජාතික ශාකාගාරයේ ද සහාය ඇතිව ජෛවවිවිධත්ව අංශය විසින් පිළියෙල කරන ලදී. 2020 -මිරිදිය මත්ස්‍යයින් පිළිබඳ ජාතික රතු දත්ත ලැයිස්තු තක්සේරුවේදී මිරිදිය මත්ස්‍ය විශේෂ 97 ක් IUCN රතු ලැයිස්තු නිර්ණායකවලට අනුව සංරක්ෂණ තත්ත්වය තක්සේරු කරන ලදී. මෙම ප්‍රකාශන දෙකම 2021 සැප්තැම්බර් 03 දින පරිසර අමාත්‍ය ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමන්ගේ සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ පාර්ශවකරුවන් සහ විද්‍යාඥයින්ගේ සහභාගීත්වයෙන් එළිදක්වන ලදී .

ජාතික රතු දත්ත ලේඛණය - ශ්‍රී ලංකාවේ පක්ෂීන්ගේ සංරක්ෂණ තත්ත්වය පිළිබඳ ඇගයීම- 2021

ජාතික රතු දත්ත ලේඛණය යාවත්කාලීන කිරීමේදී පක්ෂීන් පිළිබඳ විශේෂඥ කමිටුවේ තාක්ෂණික සහාය ඇතිව ජෛවවිවිධත්ව අංශය විසින් මෙම ග්‍රන්ථය පිළියෙල කරන ලදී. ශ්‍රී ලංකාවේ පක්ෂී විශේෂයන්හි විවිධත්වය, ආවේණිකත්වය මෙන්ම ඔවුන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරීමේදී හා රටේ සංරක්ෂණ සැලසුම් සකස් කිරීමේදී අවශ්‍ය මාර්ගෝපදේශ සපයනු ලබයි.



“Flower Visiting Fauna of Sri Lanka පරාග වාහකයන්ගේ ලැයිස්තුව" ප්‍රකාශයට පත් කිරීම

“Flower Visiting Fauna of Sri Lanka – An Inventory of Pollinators” ජෛවවිවිධත්ව අංශය විසින් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී.

අරුවක්කාරු ප්‍රදේශයේ පුරාජෛවවිවිධත්ව සංරක්ෂණය

අරුවක්කාරු ප්‍රදේශයේ පුරාජෛවවිවිධත්ව වටිනාකමක් සහිත ස්ථාන 3ක් (මැනුම් කුළුණ, අලිවල සහ පැරණි වෙඩිපිටිය) පුරාවිද්‍යා පනත යටතේ “පුරාවිද්‍යාත්මක රක්ෂිත” ලෙස 2021 පෙබරවාරි 19 දින ප්‍රකාශයට පත් කරන ලදී.

"ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසාර භාවිතය"

කඩොලාන සංරක්ෂණය හා භායනයට පත් කඩොලාන පරිසර පද්ධති ප්‍රතිස්ථාපනට මග පෙන්වන පර්යේෂණ 3ක් සඳහා රජරට හා රුහුණු විශ්ව විද්‍යාලයට මෙන්ම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාද් උපාධි ආයතනය වෙත මුල්‍යමය පහසුකම් සලසා දෙන ලදී.
කඩොලාන සංරක්ෂණය හා තිරසාර භාවිතය පිළිබඳ ජාතික විද්වත් කමිටුවේ සහ ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය සඳහා වූ කාර්ය සාධක බලකායේ රැස්වීම් පවත්වනු ලැබීය.

ඕස්ට්‍රේලියාවේ පිහිටි පොදුරාජ්‍ය මණ්ඩලීය විද්‍යා හා කර්මාන්ත පර්යේෂණ සංවිධානයේ සහයෝගීතාවයෙන් කඩොලාන විශේෂයන්හි කාබන් සංචිත තක්සේරු කිරීමට සහ ඒ සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීම.
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, පුබුදුගම සංරක්ෂිත වනාන්තරයේ පුනරුත්ථාපනය කරන ලද හෙක්ටයාර 02 ක පමණ භූමියේ කඩොලාන රැකබලා ගැනීම සඳහා ප්‍රජාව දිරිගැන්වීමේ වැඩසටහන් සඳහා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්තුමිය සමාරම්භය තබන ලදි.
දුර්ලභ හා තර්ජනයට ලක්ව ඇති කඩොලාන විශේෂ තවාන් කිරීම හා නඩත්තුව පිළිබඳව වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

2.1.3 දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම

ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව(NDCs) යාවත්කාලීන කිරීම

2016 වසරේදී සකස් කොට ඉදිරිපත් කරනු ලැබූ ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව යාවත්කාලීන කිරීම සිදු කර 2021 ජූලි 30 වන දින එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය වෙත ඉදිරි පත් කරනු ලැබීය.

හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සඳහා විදුලිබල, ප්‍රවාහන, කර්මාන්ත, අපද්‍රව්‍ය , කෘෂිකර්ම, පශුසම්පත් හා වනාන්තර යන ක්ෂේත්‍ර ද, දේශගුණ විපර්යාස වලට අනුහුරුවීම සඳහා කෘෂිකර්මය, පශුසම්පත්, ධීවර, ජලසම්පත් , වාරිමාර්ග, සෞඛ්‍ය, වෙරළ හා සාගර සම්පත්, සංචාරක, ජෛවවිවිධත්වය, නගර සැලසුම් හා මානව ජනාවාස යන ක්ෂේත්‍ර ද, දේශගුණ විපර්යාස නිසා ඇතිවන ආපදා වලින් වන හානි හා පාඩු යන ක්ෂේත්‍ර ද ඇතුලත් කරන ලදී.

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ඉහත කී ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුල්‍ය සම්පාදනය, ධාරිතා වර්ධනය, තාක්ෂණ හුවමාරුව ආදී කරුණු ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය යටතේ ඇතුලත් කරන ලදී.
අදාල ක්ෂේත්‍ර සඳහා ක්‍රියාකාරී සහ පසු විපරම් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණ කිරීමේ කමිටු ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය විය.

වර්තමානයේ පවතින ක්‍රමවේදයට සාපේක්ෂව 2021 -2030 කාල පරාසය තුල හරිතාගාර වායු විමෝචනය 14.5% කින් අඩු කිරීමට කැපවීම සඳහා එකඟතාව (4% දේශීය ධාරිතාවය මගින් හා 10.5% විදේශ ප්‍රතිපාදන හා පහසුකම් ලැබීමේ පදනමට යටත්ව) ශ්‍රී ලංකාව එකඟතාවය පළකරනු ලැබිණි.

2030 වන විට විදුලිබල උත්පාදනයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්තිය මගින් සපුරා ගැනීමට අදහස් කිරීම; 2050 වන විට විදුලි උත්පාදනයේදී කාබන් උදාසීනභාවය සාක්ෂාත් කර ගැනීම; ගල් අඟුරු බලාගාර වල ධාරිතාවයක් ඉහල නොදැමීම හා කාබන් උදාසීනභාවය ලබා ගැනීමට අපේක්ෂා කිරීම; යන ඉහල අභිලාෂයන් ඇතුලත් කිරීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල සටහන් දෙකක් මගින් අනුමැතිය ලබාගැනීම.

ජාතිකව නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවේ පළමු රැස්වීම 2021 දෙසැම්බර් මස පවත්වන ලදී.

දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ ජාතික විශේෂඥයන්ගේ 16 වන කමිටු රැස්වීම දෙසැම්බර් මස 28 වන දින පැවැත්වුණු අතර දේශගුණ විපර්යාස සඳහා අනුහුරුවීමේ විෂය පථය පුළුල් කිරීම, පාඩු සහ හානි ක්ෂේත්‍ර අන්තර්ගත කිරීම මෙන්ම ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ලබාදීම සිදුකෙරිණ.

දේශගුණික විපර්යාස අවම කිරීම පිළිබඳ ජාතික විශේෂඥ කමිටුව

හරිතාගාර වායු විමෝචන අවම කිරීමේ ක්‍රියාවලියේදී මගපෙන්වීම සඳහා පිහිටුවා ඇති මෙම ජාතික විශේෂඥ කමිටුව ප්‍රගතිය වාර්තා කරන කාලසීමාව තුල, රැස්වීම් දෙකක් පවත්වන ලද අතර පහත ක්‍රියාකාරකම් සඳහා අනුකමිටු දෙකක් පත්කරන ලදී.

- නගර සඳහා හරිතාගාර වායු විමෝචන ඉන්වෙන්ටරිය සකස් කිරීම හා පවත්වා ගැනීම සඳහා වන අත්පොත සකස් කිරීම අධීක්ෂණය.
- 2050 දී කාබන් උදාසීනභාවය ලබා ගැනීම සඳහා මාර්ගගත සිතියම සැකසීම.

දේශගුණික විපර්යාස හේතුවෙන් මානව ජනාවාස සහ යටිතල පහසුකම් සඳහා වන අයහපත් බලපෑම්වලට කාර්යක්ෂමව හා ඵලදායීව ඔරොත්තු දීමට විවිධ පාර්ශවකරුවන් විසින් ගනු ලබන සියළුම මැදිහත්වීම් ඒකාබද්ධ කිරීම සඳහා දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන මානව ජනාවාස සහ යටිතල පහසුකම් සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලදී.

හරිත දේශගුණික අරමුදල (GCF) යටතේ නම් කරන ලද සෘජු මූල්‍ය ප්‍රවේශ ආයතන සඳහා පහසුකම් සැලසීම සඳහා GCF ප්‍රාදේශීය කාර්යාලය සමඟ රැස්වීම් 3 ක් පැවැත්වූ අතර DFCC බැංකුව හරිත දේශගුණික අරමුදල වෙත ප්‍රතීතනය ලබාගැනීම ඵලබෙන GCF මණ්ඩල රැස්වීමේදී ලබා ගැනීමට නියමිතව ඇත. HNB, HDFC, NDB සහ කොමර්ෂල් බැංකු සඳහා Online Accreditation System Account ගිණුම ලැබී ඇත.

හරිත දේශගුණික අරමුදල සඳහා ඉදිරිපත් කල ව්‍යාපෘති යෝජනා තුනෙන් දෙකක් සඳහා අනුමැතිය ලැබිණ.

- 2021 වර්ෂයේ හරිත දේශගුණ අරමුදලේ සුදානම් වීමේ අරමුදල් ඉලක්ක කරගෙන ශ්‍රී ලංකාවේ පහළ ජලාධාර සහ වෙරළබඩ කලාප කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ගෝලීය ජල හවුල්කාරිත්වය (GWP) සමඟ ඉදිරිපත් කරන ලද ජාතික බලයලත් අධිකාරිය (NDA) සුදානම් කිරීමේ දෙවන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලැබී ඇත.
- තෙවන ව්‍යාපෘතිය හරිත දේශගුණ අරමුදලේ 2022 වර්ෂයේ සුදානම් වීමේ අරමුදල් ඉලක්ක කරගෙන ඉදිරිපත් කිරීම සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ සාකච්ඡා තාර්කික ක්‍රියාරාමුව සකසා ඇත.

ජාතිකව බලයලත් අධිකාරිය (NDA) සුදානම් කිරීමේ පළමු ව්‍යාපෘතිය මගින්

- ශ්‍රී ලංකාව සඳහා හරිත දේශගුණ අරමුදලේ ක්‍රියාකාරිත්වය සඳහා ජාතික වැඩසටහන සකසන ලදී.
- හරිත දේශගුණික අරමුදල සඳහා මෙහෙයුම් අත්පොත සහ පාර්ශවකරුවන් සම්බන්ධ වීමේ උපායමාර්ගය සඳහා අත්පොත් මුද්‍රණය කරන ලදී.
- හරිත දේශගුණික අරමුදල සඳහා මෙහෙයුම් අත්පොත සහ පාර්ශවකරුවන් සම්බන්ධ වීමේ උපායමාර්ගය සඳහා සාරාංශ අත්පොත් මුද්‍රණය කරන ලදී.
- හරිත වර්ධන සැලැස්ම කෙටුම්පත් කිරීම සඳහා ඌව, මධ්‍යම සහ සබරගමුව පළාත් සඳහා වැඩමුළු තුනක් පවත්වන ලදී.
- හරිත සංවර්ධන උපාය උපායමාර්ගය සඳහා පාර්ශවකරුවන්ගේ වලංගු කිරීමේ රැස්වීමක් (validation meeting) පවත්වන ලදී

ශ්‍රී ලංකාවේ අනුහුරුවීමේ ජාතික සැලසුම් ක්‍රියාවලිය සහ ක්‍රියාත්මක කිරීමේ ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතිය

ගෝලීය හරිත වර්ධන ආයතනය (GGGI) හරහා හරිත දේශගුණ අරමුදලේ අනුහුරු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සුදානම් කිරීමේ ප්‍රතිපාදන සඳහා ශ්‍රී ලංකාව අයදුම් කර අනුමැතිය ලබාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ මුළු අයවැය ඇමරිකානු ඩොලර් 2,975,000 ක් වන අතර එය 2020 අගෝස්තු මස සිට මාස 42 ක කාල සීමාවක් සඳහා ක්‍රියාත්මක වේ.

පළාත් සංවර්ධන සැලසුම් සඳහා දේශගුණ විපර්යාස ක්ෂේත්‍රය ඇතුලත් කිරීම

මෙම ව්‍යාපෘතියේ මගින් ප්‍රාදේශීය වශයෙන් දේශගුණ විපර්යාස සඳහා වන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පසුබිම සැකසීම වෙනුවෙන් අනුහුරු කරවීමේ සහ හරිතාගාර විමෝචනය අවම කිරීම සඳහා මාර්ග සිතියමක් සැකසීම, ප්‍රාදේශීය දේශගුණ කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා දේශගුණ ඒකක ස්ථාපිත කිරීම, දේශගුණ සම්පත් බෙදීමේ සැලසුම් සහ උපදෙස් මාලාවක් සැකසීම, ජාතික දේශගුණ සම්බන්ධ ප්‍රාදේශීය දත්ත පද්ධතියක් ගොඩ නැගීම ප්‍රධාන වේ.

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස හේතුවෙන් සිදුවන මානව සංක්‍රමණය, පරිසර බිඳවැටීම් හඳුනාගැනීම සඳහා වන ව්‍යාපෘතිය

මානව සංක්‍රමණය, පරිසරයේ ගුණාත්මකබව පිරිහීම, ආශ්‍රිත අර්බුදයන් සහ දේශගුණ විපර්යාස අතර වන අනොන්‍ය සම්බන්ධතාවයන් හඳුනා ගැනීමටත් දේශගුණ විපර්යාස වල බලපෑම නිසා වන ආපදා සහ ස්වභාවික විපත් සඳහා ප්‍රජාවේ දරා ගැනීමේ හැකියාව වර්ධනය සහ ප්‍රජාව දේශගුණ විපර්යාස සඳහා අනුහුරු කරවීම පිණිස ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදු කිරීම සහ දැනටමත් මෙම තොරතුරු අන්තර්ගත කරමින් පුවත්පත් වාර්තා සහ විවිධ මාතෘකා ඔස්සේ අන්තර්ජාල සාකච්ඡාවන් පවත්වන ලදී.

2.1.4 වායු සම්පත් කළමනාකරණය

ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය

පිරිසිදු වායු 2025 ක්‍රියාකාරී සැලැස්මේ එක් ප්‍රධාන උපායමාර්ගයක් ලෙස ගෘහස්ථ වායු ගුණාත්මක කළමනාකරණ මාර්ගෝපදේශ මාලාවක් සකස් කිරීම හඳුනා ගන්නා ලදි. ඒ අනුව, මූලික පියවර වශයෙන් මාර්ගගත රැස්වීම් ගණනාවක් පැවැත්වූ අතර ගෘහස්ථ වායු දූෂණය පාලනය කිරීම සඳහා වන මාර්ගෝපදේශ මාලාවේ පස්වන කෙටුම්පත සකස් කර ඇත.

ස්ථාවර ප්‍රභවයන් මගින් සිදුවන වායු දූෂණය පාලනය

ස්ථාවර මූලාශ්‍ර විමෝචන ප්‍රමිතීන් සහ වායු දූෂණය කෙරෙහි ඇති වන සෞඛ්‍ය බලපෑම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක්ව 2021 මාර්තු මාසයේදී උතුරුමැද පළාතේ විශාල හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් පාදක කරගනිමින් පවත්වන ලදි. ඉහත ප්‍රමිති පිළිබඳව අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා එක් මාර්ගගත වැඩසටහනක් ද පවත්වන ලදී.

ශබ්ද දූෂණය පාලනය කිරීමට අදාළ ක්‍රියාකාරකම්

වාහන වලින් සිදුවන ශබ්ද දූෂණය වැළැක්වීම සඳහා ප්‍රශස්ත විසඳුම් සෙවීමේ අරමුණින් යුතුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය සහ මධ්‍යම පරිසර අධිකාරිය වැනි ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් බහු පාර්ශවීය රැස්වීම් පවත්වන ලදි. ඒ අනුව, පවතින රෙගුලාසි වැඩිදියුණු කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවරා ඇත.

වාහන වායු විමෝචනය පාලනය කිරීම

වාහන විමෝචන පරීක්ෂණ (VET) වැඩසටහන සමඟ මග දෙපස වාහන වායු විමෝචනය පරීක්ෂා කිරීමේ වැඩසටහන් වලට සහභාගී විය. සියලුම වාහන වායු විමෝචව පරීක්ෂණ මධ්‍යස්ථාන ප්‍රතීතනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සමඟ මූලික සාකච්ඡාවක් පවත්වන ලදි. තවද, ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව කළමනාකරණයට අදාල ප්‍රවීණයින්ගේ සහයෝගය ඇතිව දැනට ක්‍රියාත්මක වන වාහන වායු විමෝචන වැඩසටහන නැවත පණ ගැන්වීම සඳහා මාර්ග සිතියමක් සකස් කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා වාහන වායු විමෝචන අරමුදලට ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ විදුලි වාහන භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා කමිටු පත් කිරීම

ශ්‍රී ලංකාවේ විදුලි වාහන භාවිතය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව පරිසර අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ විදුලි වාහන භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමත නිලධාරී කමිටුවට සහාය වීම සඳහා තාක්ෂණික කමිටුවක් ද පත් කරන ලදී.

විද්‍යුත් සංචලනයට මාරුවීම සඳහා රටවලට සහාය වීමේ ගෝලීය වැඩසටහන

ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් සංචලතාව ප්‍රවර්ධනය කෙරේ. තිරසාර හා කාර්යක්ෂම විදුලි සංචලතා පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘති සූදානම් කිරීමට ගෝලීය පරිසර පහසුකමෙහි (GEF) ජාතික කේන්ද්‍රස්ථානය වන පරිසර අමාත්‍යාංශය වෙත මූල්‍ය ප්‍රදානයක් ලැබී ඇත.

විද්‍යුත් වාහන සඳහා වන තාක්ෂණයන්, විද්‍යුත් ද්වි රෝද රථ, විද්‍යුත් ත්‍රිරෝද රථ සහ විද්‍යුත් බයිසිකල්, පුනර්ජනනීය බලශක්තිය යොදා ගනිමින් ආරෝපණය කිරීමට අවශ්‍ය වන යටිතල පහසුකම්, බැටරි කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණ විකල්ප ප්‍රදර්ශනය කිරීමද ඇතුළත්ව නියමු ව්‍යාපෘතිය අනුරාධපුර පූජා නගරයේ දී ඉදි කිරීමට සැලසුම් කර ඇත.



2.1.5 පරිසර සැලසුම් හා ආර්ථික

පරිසර ලේබල වැඩසටහන

ශ්‍රී ලංකාව පරිසර හිතකාමී කිරීම සඳහා වූ ජාතික රාමුවේ කෙටුම්පත SLAB සහ SLSI ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ වලංගු කරන ලදී. මෙම රාමුව වෙළඳ, කර්මාන්ත සහ තාක්ෂණ අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කෙරුනු අතර විද්වත් පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් පසුබිම් තොරතුරු එකතු කිරීමේ වෙළෙඳපොළ සමීක්ෂණය ආරම්භ කරන ලදී. දැනුවත් කිරීමේ වැඩසටහනක් 2021.03.30 දින පවත්වන ලදී.

ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමඟ කණ්ඩායම් සාකච්ඡා තුනක් පවත්වන ලදී.

හරිත ගිණුම්කරණය වැඩසටහන

හරිත ගිණුම්කරණය සඳහා පාර්ශවකාර සංවිධාන හා විද්වතුන්ගේ සහයෝගයෙන් මාර්ගගත සම්මන්ත්‍රණයක් සැලසුම් කරන ලදී. එහිදි සම්මන්ත්‍රණය සඳහා තාක්ෂණික දායකත්වය ලබා ගැනීම සඳහා වයඹ හා ජයවර්ධනපුර විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සහයෝගය ලබා ගැනීමට තීරණය විය. සම්මන්ත්‍රණය සඳහා හරිත ගිණුම්කරණ උපදේශ මණ්ඩලය දැනුම්වත් කොට උපදෙස් ලබා ගන්නා ලද අතර පරීක්ෂණාත්මක පරිසර පද්ධති සේවා ගිණුම්කරණය හා පරිසර පද්ධති සේවා වල මූල්‍යමය වටිනාකම් ගණනය කිරීම යන ක්ෂේත්‍රයන් යටතේ ඉදිරිපත් කිරීම් කිරීමට තීරණය විය.

හරිත වාර්තාකරණ ක්‍රමවේදය

ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ මෙම වසර තුලදී කර්මාන්ත ආයතන 15ක් ලියාපදිංචි විය. මේ සඳහා ලියාපදිංචි වීම Google ආකෘති පත්‍ර මගින් සිදු කරන ලැබේ. ලියාපදිංචි කර්මාන්ත කරුවන් සඳහා මාර්ගගත පුහුණු වැඩසටහන් හතක් පවත්වන ලදී.

හරිත නිෂ්පාදන දිරි ගැන්වීම හා හරිත රැකියා ප්‍රවර්ධන වැඩසටහන

නීල හරිත ගම්මාන වැඩසටහන යටතේ, දිවයිනේ ගම්මාන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් ක්‍රියාත්මක වේ.

පාර්ශවකරුවන් අට දෙනෙකු සමඟ පූර්ව සූදානම් වීමේ රැස්වීම් පවත්වන ලදී.





2.1.6 පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය

ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ සන්නිවේදන උපායමාර්ගය සකස් කර ඇත.



"වරක් භාවිත කර ඉවතලන ප්ලාස්ටික් භාවිතය තහනම් කිරීම" සඳහා 2021 වසරේ මුල් භාගයේදී රෙගුලාසි ගැසට් කිරීම.

i) පහත සඳහන්, එක් වරක් භාවිත කර ඉවතලන ප්ලාස්ටික් අයිතම, නිෂ්පාදනය, වෙළෙඳාම සහ භාවිතය තහනම් කිරීම (තෝරාගත් අයිතම -1 වන කොටස) - 2021 මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි 2021 ජනවාරි 21 දිනැති අංක 2211/51 දරණ ගැසට් පත්‍රය මගින්.

- කෘෂි රසායනික ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා යොදාගන්නා පොලිඑතිලීන් ටෙරෙපතලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) ද්‍රව්‍ය.
- ශුද්ධ පරිමාව මි.ලී 20 / ශුද්ධ බර ග්‍රෑම් 20 ට සමාන හෝ ඊට වඩා අඩු සැශේ ඇසුරුම් (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීම හැර).
- හුළං වලින් පිරවිය හැකි සෙල්ලම් බඩු (බැලුන්, බෝල, දියමත පාවෙන, පිහිනුම් තටාක වලදී භාවිතා කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැර)
- ප්ලාස්ටික් කූර (Stem) සහිත කොටන් බඩ් (Cotton buds) (වෛද්‍ය/සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන කොටන් බඩ්ස් හැර) තහනම් කරන ලදී.

ii) ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනා ගැනීමේ කේත සටහන් කිරීම - 2021 ජනවාරි 21 දිනැති සහ අංක 2211/50 දරණ ගැසට් පත්‍රය

"ශ්‍රී ලංකාවේ කසල කඳු ආරක්ෂිත ලෙස වසා දැමීම හා පුනරුත්ථාපනය පිළිබඳ මාර්ගෝපදේශය" දියත් කරන ලද අතර මේ සඳහා අරමුදල් IGES /CCET (ජපානය) ආයතනය මගින් සපයා ඇත. මෙම මාර්ගෝපදේශයේ ඉංග්‍රීසි සහ දෙමළ පිටපත් මුද්‍රණය කරන අවසන් අතර සිංහල පිටපත් මුද්‍රණය කරමින් පවතී.



එක් වරක් භාවිතා කර ඉවතලන ප්ලාස්ටික් නිෂ්පාදනය, වෙළඳාම සහ භාවිතය තහනම් කිරීම (තෝරාගත් අයිතම - 2 වන කොටස) සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇති අතර එම යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල නිර්දේශ ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ නාගරික, නිවාස, ආහාර සැපයුම් සේවා, සිල්ලර වෙළෙන්දන් සහ තොග වෙළෙඳුන් සඳහා වූ ආහාර අපද්‍රව්‍ය වැළැක්වීම සහ අඩු කිරීම පිළිබඳ මාර්ග සැලැස්ම, 2021 අගෝස්තු 17 දින දියත් කරන ලදී.

පෙර පාසල් සහ පාසල් සඳහා ඇස්බැස්ටෝස්/ විකල්ප භාවිත මාර්ගෝපදේශ කෙටුම්පත සාදා ඇත.

ඇල්ගී සෑදීමෙන් පාර්ලිමේන්තු වැවේ ජලයේ ගුණාත්මකභාවයට හානි වී ඇති අතර එය යථා තත්ත්වයට පත් කිරීම පිළිබඳ කාර්ය සාධක බලකායේ කාරක සභා රැස්වීම් පැවැත්වූ අතර එයට අදාළ වාර්තාව සහ කළමනාකරණ සැලැස්ම සකසා ඇත.

"ගෘහාශ්‍රිතව එකතු වන භාවිතා කල මුව ආවරණ ආරක්ෂිතව බැහැර කිරීම" සඳහා මාර්ගෝපදේශන සකස් කරන ලදී.

“දිගුකල් පවත්නා කාබනික දූෂක පිළිබඳ ජාතික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (Persistent Organic Pollutant)” යාවත්කාලීන කිරීම සහ සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය සහ රසදිය කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන යෝජනාවක් UNDP ආයතනය විසින් ඉදිරිපත් කර අරමුදල් සැපයීම සඳහා GEF සංවිධානය වෙත යොමු කරන ලද අතර එම ව්‍යාපෘතිය අනුමත වී ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය යටතේ පවතින රෙගුලාසි සංශෝධනයට ඇතුලත් කිරීම සඳහා සිලි සිලි මලු සඳහා (Carry bags) මිල නියම කිරීමට හැකි වන පරිදි අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර ෂොපින් බෑගයේ මිල නියම කිරීමේ වත්මන් නෛතික තත්ත්වය වාර්තා කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් කැබිනට් ලේකම්වරයාට නියෝග කර තිබේ.

ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ දැනුවත් කිරීමේ සන්නිවේදන මෙවලම් කිහිපයක් සකස් කරන ලදී.

2.1.7 භූමි සම්පත් සංරක්ෂණය

තිරසර භූමි කළමනාකරණ ආදර්ශණ ස්ථාන පිහිටුවීම- කිරිබත්ගොඩ “සෝජාන්” ව්‍යාපෘතිය

භූමි හායනය අවම කරමින් තෙත් බිම් ආශ්‍රිත පරිසර පද්ධති සුරක්ෂිත කරමින් කෘෂි ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා උපකාරිවන ඉන්දුනීසියානු සාම්ප්‍රදායික පහත් බිම් කෘෂි බෝග රටාවක් වන සොර්ජාන් (Sorjan) වගා ක්‍රමය කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිරිබත්ගොඩ ඇවිදින මංතීරුව ආශ්‍රිත වසර 40 ක් පමණ වගා නොකළ **තලවතුහේන්පිට උතුර කුඹුරු යායෙහි** මෙම ඉඩම් පරිහරණ ආදර්ශනය ඉදිකරන ලදී. මේ සඳහා රුපියල් මිලියන 2.4ක මූල්‍ය දායකත්වයක් 2021 වර්ෂයේ ප්‍රතිපාදන මඟින් සපයන ලදී.

ක්ෂුද්‍ර මූල්‍ය පර්යේෂණ වැඩසටහනට අදාළව තිරසර භූමි කලමනාකරණය හා භූමි හායනය වැලැක්වීම යටතේ පාංශු හා ඛනිජ යන අංශ පදනම් කරගනිමින් පර්යේෂණ 6ක් සිදුකරන ලදී. මෙම වැඩසටහන මගින් තිරසර භූමි කළමනාකරණයට අදාළ පර්යේෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීමත්, විවිධ ක්ෂේත්‍ර සඳහා පර්යේෂකයන් දිරිමත් කිරීමත් සිදුකරනු ලබයි. ශ්‍රී ලංකාවේ තිරසර භූමි කළමනාකරණය හා භූමි හායනය වැලැක්වීම සම්බන්ධයෙන් පවතින දත්ත හා තොරතුරු පිළිබඳව පවතින හිඳැස් පිරවීම සඳහා මෙම පර්යේෂණ බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

- Investigation on productivity in intensively cultivated vegetable Growing Soils in Sri Lanka when Amended with poultry Litter Biochar
- Contribution of burrowing crabs (Sisarmidae) on sediment carbon storage. A cross sectional study from a mangrove system of Southern Sri Lanka
- A feasibility study on potential for utilization of natural rubber processing waste water for enhance of soil fertility
- Exploring the potential of proximal soil sensing for delineating soil texture based management zones.
- Assessing potential of Sri Lanka Mica and Micaceous Rocks as Alternative Sources of K-Fertilizer
- Quantification and characterization of efficient water generated in the sheet rubber and Crepe rubber processing industry in Sri Lanka



2.1.8 පරිසර අධ්‍යාපන හා දැණුවත්කිරීම්

පරිසර අධ්‍යාපන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යටතේ සිසු දරුවන්, රාජ්‍ය ආයතනවල නිළධාරීන් සහ මහජනතාවගේ පරිසර සංවේදීතාව, පරිසරය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව පවත්වනු ලබයි.

මෙහිදී පරිසර සංවේදීතාව ඉහළ පිරිසක් බිහි කිරීම මඟින් පරිසර සංරක්ෂණය කිරීම හා පරිසර ගැටළු අවම කිරීම මූලික අරමුණ වේ. 2021 වර්ෂය තුළ පාසල් සිසුන් 250 දෙනෙකු වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මාතර ශාන්ත තෝමස් විද්‍යාලයේදී පවත්වන ලදි.

සොබා වලන කෙටි චිත්‍රපට තරඟාවලිය සහ සොබා සේයා පාරිසරික ඡායාරූප තරඟාවලිය පැවැත්වීම.

තරුණ සිනමා කරුවන් තුළ පරිසර සංරක්ෂණය පිළිබඳ ආකල්ප වර්ධනය කරමින් සාධනීය සමාජ කතිකාවතක් ගොඩනැගීම අරමුණු කරගෙන ජගත් පරිසර දිනයට සමගාමී වැඩසටහනක් ලෙසින් "සොබා වලන" කෙටි චිත්‍රපට තරඟාවලිය, " සොබා දහම කලාත්මකව දකිමු " යන්න තේමා කොට ගනිමින් "සොබා සේයා" පාරිසරික ඡායාරූප තරඟාවලිය සංවිධානය කරන ලදී.

"සොබා වලන" කෙටි චිත්‍රපට තරඟාවලියට සමගාමීව පවත්වනු ලැබූ පුහුණු වැඩමුළුව තරඟාවලියේ විනිසුරු මඩුල්ලෙහි සාමාජිකයින්ගේ සම්පත්දායකත්වයෙන් අයදුම්කරුවන් 70 කගේ පමණ සහභාගීත්වයෙන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

"සොබා සේයා" පාරිසරික ඡායාරූප තරඟාවලිය සඳහා ඡායාරූප ලබා ගැනීම විද්‍යුත් තැපැල් මඟින් සිදු කරන ලද අතර, තරඟකරුවන් 250ක් පමණ තම නිර්මාණ යොමු කරන ලදී.

"සොබා වලන" කෙටි චිත්‍රපට තරඟාවලියෙහි සහ "සොබා සේයා" පාරිසරික ඡායාරූප තරඟාවලියෙහි ජයග්‍රාහකයින් වෙනුවෙන් සම්මාන සහ සහතික පත්‍ර පිරිනැමීම ගරු පරිසර අමාත්‍යතුමාගේ සහ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ගෞරවණීය ආරාධිත අමුත්තන් රැසකගේ සහ තරඟකරුවන්ගේ සහභාගීත්වයෙන් 2021.12.15 දින අමාත්‍යාංශයේ අට වන මහල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

සොබා පරිසර සඟරාව සහ ක්ෂුද්‍ර ප්ලාස්ටික් සහ ඔබ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම

පාරිසරික වශයෙන් සංවේදී ප්‍රජාවක් බිහි කිරීමේ අරමුණ ඇතිව සෑම වසරකම පරිසර අමාත්‍යාංශය මගින් සොබා සඟරාව ප්‍රකාශනය එළි දක්වයි.



ක්ෂුද්‍ර ප්ලාස්ටික් සහ ඒ හා සම්බන්ධව ඇති වී තිබෙන ගැටළු පිළිබඳ දැනුමක් ලබාදීමේ අරමුණින් ”ක්ෂුද්‍ර ප්ලාස්ටික් සහ ඔබ” ග්‍රන්ථය මුද්‍රණය කරන ලදි. මෙම ග්‍රන්ථය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පිටපත් 1700ක් පමණ මුද්‍රණය කර ඇත





ජෛවවිවිධත්වය පිළිබඳව දැනුවත් කිරීම

2021 පුරා ජෛවවිවිධත්වය පිළිබඳ ඊ - පුවත් හසුන ප්‍රකාශයට පත් කිරීම

පුරා ජෛවවිවිධත්වය පිළිබඳ කාලීනව සිදු කරන ලද පර්යේෂණ තොරතුරුද ඇතුලත්ව ඊ - පුවත් හසුන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ තාක්ෂණික සහාය ඇතිව සකස් කර අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

ජෛව සුරක්ෂිතතාවය පිළිබඳව දැනුම සංවර්ධනය, මහජනතාව දැනුවත් කිරීම හා අධ්‍යාපනය හා සහභාගිත්වය

- ජෛව සුරක්ෂිතතා පශ්චාත් උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සහ පාඨමාලා ලිපි ද්‍රව්‍ය සකස් කරන ලද අතර ප්‍රාථමික (සාමාන්‍ය පෙළ), ද්විතීයික හා විශ්වවිද්‍යාල මට්ටමේ විෂයමාලා වැඩිදියුණු කිරීම තුළින් ජෛව සුරක්ෂිතතාව සඳහා වූ හිඩැස් පිරවීම ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) උපදේශනය මත සිදුවිය.
- ජෛව සුරක්ෂිතතාව සම්බන්ධ තොරතුරු අන්තර්ගත ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් දියුණු කර විවිධ මාධ්‍ය මඟින් බෙදා හරින ලදී.
- ඉලක්කගත දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී. (විශ්වවිද්‍යාල, SCAs, NCA, NGOs, මාධ්‍ය, පාසල්, ආදිය)
- ජෛව සුරක්ෂිතතා පුවත් හසුනේ හයවන ප්‍රකාශනය නිකුත් කරන ලදී

පාරිසරික සංවේදී ප්‍රදේශ සඳහා අත්පත්‍රිකා 05ක් සකස් කිරීම.

- විල්ලු සඳහා අත්පත්‍රිකාව
- වේවැල්-කැලේ සඳහා අත්පත්‍රිකාව
- මානෑව-කන්ද පාරිසරික සංවේදී ප්‍රදේශය සඳහා අත්පත්‍රිකාව
- ගඟේ-වාඩිය පාරිසරික සංවේදී ප්‍රදේශය සඳහා අත්පත්‍රිකාව
- කලාවැව- අවුකන පාරිසරික සංවේදී ප්‍රදේශය සඳහා අත්පත්‍රිකාව



නව පාරිසරික සංවේදී ප්‍රදේශ ප්‍රතිපත්තිය පිළිබඳ විද්‍යුත් මාධ්‍යය සාකච්ඡා පැවැත්වීම



- පාරිසරික සංවේදී ප්‍රදේශ ව්‍යාපෘතිය පිළිබඳ පුවත්පත් අතිරේකයක් සිළුමිණ පුවත්පත සමග පළ කරන ලදි.
- ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනාගැනීම හා පාලනය කිරීම පිළිබඳ මූලාශ්‍ර අත්පොතක් සකස් කරන ලදි.
- ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනාගැනීම පිළිබඳ කෙටි අත්පොතක් පිළියෙල කරන ලදි.
- සොබා සංහිතා නමින් පාසල් ළමුන් සඳහා කෙටි රූපමය අත්පොතක් (සිංහල හා ඉංග්‍රීසි) පිළියෙල කරන ලදි.

වායු සම්පත් කළමණාකරණය හා ඕසෝන් ප්‍රහීනකාරී හා ඉහළ ගෝලීය උණුසුමක් සහිත ශීතකාරක භාවිතය පාලනය හා භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

- **ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රය සඳහා හරිත තාක්ෂණය හඳුන්වාදීම.**
- නව තාක්ෂණික ක්‍රමවේදයන් හා කළමනාකරණය සම්බන්ධව පුහුණු වැඩසටහන් 17ක් මගින් පුහුණුව ලැබූ සංඛ්‍යාව 500 කි.



- **බාලදක්ෂිකාවන් සඳහා "ඕසෝන් මිතුරු" ලාංඡනය හඳුන්වා දීම**
- ඕසෝන් විද්‍යාව පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා දැනුම මෙවලම් ද්විත්වයක් සංවර්ධනය කිරීමට 2021වර්ෂයේදී පියවර ගන්නා ලදී .
- 2021ජාත්‍යන්තර ඕසෝන් දිනයට සමගාමීව ඕසෝන් දිනයේ තේමාව රැගත් පරිසර හිතකාමී

බෑගයක්, ටී ෂර්ට් සමඟ දැනුවත් කිරීමේ පත්‍රිකාවක්ද බෙදා දෙන ලදී.

ගෘහස්ථ වායු දූෂණය, රථ වාහන වලින් සිදුවන වායු දූෂණය , ශබ්ද දූෂණය සහ විවෘත දහනය යන තේමාවන් යටතේ ජන මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි කෙටි වීඩියෝ දර්ශන හතරක් නිර්මාණය කරන ලදී.

වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ඩේලි මිරර් පුවත්පත සමඟ එක්ව පුවත්පත් අතිරේකයක් ප්‍රකාශයට පත් කරන ලදී. “නිල් අහසක් සඳහා පිරිසිදු වාතය පිළිබඳ ජාත්‍යන්තර දිනය” ට සමගාමීව මෙම අතිරේකය නිකුත් විය.

ස්ථාවර වායු විමෝචන ප්‍රමිති නියෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය මට්ටමේ පරිසර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, සහල් මෝල් හිමියන් සහ කම්කරුවන් එහි ඉලක්කගත කණ්ඩායම විය.

තිරසර භූමි කළමනාකරණයට අදාළ දැනුවත් කිරීම්

- එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර මුද්‍රණය කර ඇති පාංශු සම්පත් හා තිරසර භූමි කළමනාකරණය පිළිබඳ පෝස්ටර් 04ක් සිංහල භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කිරීම,
- 2020 වර්ෂයේදී සම්පාදනය කරන ලද “Keep soil Alive, Protect Soil Biodiversity " පොත් පිංච “පාංශු ජෛව විවිධත්වය සුරැකීමට පස සජීවීව තබාගනිමු" මැයෙන් සිංහල භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කිරීම,
- කාන්තාරකරණය වැළැක්වීමේ හා නියඟය පිටු දැකීමේ ජාත්‍යන්තර දිනය හා සමගාමීව "ප්‍රතිස්ථාපනය තුළින් නිරෝගීමත් භූමියක් ගොඩනගමු" මැයෙන් පොත් පිංචක් මුද්‍රණය කිරීම,
- පාසල් දරුවන් කේන්ද්‍රගත කොට ගෙන පසෙහි ඇති වටිනාකම පැහැදිලි කිරීම හා පස සුරැකීම පිළිබඳව පොත් පිංචක් "WAYS TO PROTECT OUR SOIL" මැයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර මුද්‍රණය කිරීම,
- භූමි හායනය අවම කිරීම හා තිරසර භූමි කළමනාකරණයට ජනතාව යොමු කිරීමේ අරමුණින් භූමි සම්පත් අංශය විසින් 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන ලද භූමි ආදර්ශන පිළිබඳව තොරතුරු ඇතුලත් කර "තිරසර භූමි කළමනාකරණ ආදර්ශන" මැයෙන් ග්‍රන්ථයක් සම්පාදනය කර මුද්‍රණය කිරීම හා
- පස පිළිබඳව පාසල් සිසුන් හා ජනතාව දැනුවත් කිරීම සඳහා "ශ්‍රී ලංකාවේ පස" නමින් අත්පත්‍රිකාවක් සකස් කර මුද්‍රණය කිරීම සිදුකරන ලදී

පොලිස් නිලධාරීන් සඳහා පාරිසරික නීති හා රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2021 වර්ෂය සඳහා වූ පළමු වැඩමුළුව 2021.03.19දින පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගත් පොලිස් නිලධාරීන් 50 දෙනෙකු පවත්වන ලදී.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පාරිසරික විෂය සඳහා බදවා ගත් උපාධිධාරීන් සඳහා දෙදින නේවාසික වැඩමුළු දෙකක් පවත්වන ලදි. දකුණු පළාත සහ වයඹ පළාත් වැඩසටහන් සාර්ථකව අවසන් කළ අතර, පිළිවෙළින් උපාධිධාරීන් 43 ක් සහ 24 දෙනෙක් එම වැඩමුළු සඳහා සහභාගී වූහ.



2.1.9 අන්තර්ජාතික පාරිසරික සබඳතා

ශ්‍රී ලංකාව, 2021 නොවැම්බර් මස පැවැත්වෙන UN-FCCC COP26 සඳහා සූදානම් වූයේ ආසියා-පැසිෆික් කලාපයේ තානාපති කෙන් ඕ ෆ්ලැහර්ටි මහතාගේ ශ්‍රී ලංකා සංචාරයත් සමඟය. එහිදී පාර්ශවකරුවන්ගේ රැස්වීමක් 2021 අගෝස්තු 6 දා ආසියානු පැසිෆික් කලාපයේ COP 26 කලාපීය තානාපති සමඟ සංවිධානය කරන ලදී. ආසියා-පැසිෆික් කලාපයේ තානාපති කෙන් ඕ ෆ්ලැහර්ටි මහතා, ගරු අමාත්‍යතුමා සහ ලේකම්තුමා අතර හමුවක් ද මෙම සංචාරයේදී සිදු විය.



අතිගරු සන්තුෂ් චූන්ජීන් පෙඔන් තානාපති කොරියානු ජනරජය සහ ගරු අමාත්‍යතුමන් අතර හමුවක් 2021 අගෝස්තු 13 වන දින පැවැත්විණ.



දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහන (SACEP) අධ්‍යක්ෂ ජනරාල් - සකෙප් ආයතනයට අභිනවයෙන් පත් වූ නව අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම්තුමා අතර හමුවක් 2021 සැප්තැම්බර් 17 වන දින පැවැත්විණ.

ගෝලීය හරිත වර්ධන ආයතනය සමඟ සිදු කරන හා ඉදිරියේදී සිදු කිරීමට යෝජිත වැඩසටහන් පිලිබඳ සාකච්ඡා කිරීමට එහි අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම්තුමා ඇතුලු නිළධාරීන් අතර හමුවක් 2021 සැප්තැම්බර් 21වන දින පැවැත්විණ.

ලෝක ආහාර වැඩසටහනේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ - 2021 ජූනි 25 වන දින ලෝක ආහාර වැඩසටහනේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂ හා ලේකම්තුමා අතර සුහද හමුවක් පැවැත්විණ.

UNFCCC COP26 ආසියා-පැසිෆික් කලාපයේ තානාපති කෙන් ඕ ෆ්ලැහර්ටි මහතා ශ්‍රී ලංකා සංචාරය

ද්විපාර්ශ්වික පාරිසරික ගිවිසුම්

ක්ෂුද්‍ර ප්ලාස්ටික් පර්යේෂණ සඳහා ශ්‍රී ලංකා රජය සහ එක්සත් රාජධානියේ මහා බ්‍රිතාන්‍යය සහ උතුරු අයර්ලන්තය අතර අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීය. මෙම අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය විද්‍යාගාර වල ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණය කිරීමේ ධාරිතාව වැඩි කිරීමට හැකි විය.

- **එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) නිත්‍ය නියෝජිතයින්ගේ කාරක සභාව (CPR) සඳහා** පරිසර අමාත්‍යාංශයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පත් කිරීම
- **UNEP හි "ස්වභාවික ධනාත්මක ආහාර පද්ධති සැසිය" සඳහා කමිටු සාමාජිකයෙකු** ලෙස සහභාගී වීම
- **දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහන (SACEP) රැස්වීමේ උපදේශක** කාරක සභා සභාපති ලෙස ශ්‍රී ලංකාව පත් කිරීම
- **ගෝලීය පර්යේෂණ සඳහා වූ ආසියා - පැසිෆික් ජාලය (APN) හි මෙහෙයුම් කමිටුවේ උප** සභාපති ලෙස ශ්‍රී ලංකාව පත් කිරීම

2021 ඔක්තෝම්බර් 06 දින පවත්වන ලද ආසියානු පැසිපික් ශාන්තිකර කලාපීය අමාත්‍යවරුන්ගේ හා පරිසර අධිකාරීන්ගේ 4 වන සමුළුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරී මණ්ඩලයේ සභාපති ධුරය සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පත් කරන ලදී.



පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා සමඟ එක්සත් ජාතීන්ගේ සහකාර ලේකම් ජනරාල්තුමිය (UN-ASG) වන කන්නි විග්නරාජා ඇතුලු එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහකාර පරිපාලකතුමා හා ආසියානු පැසිපික් කලාපීය කාර්යාංශයේ අධ්‍යක්ෂතුමා අතර සුහද හමුව 2021 දෙසැම්බර් 14 වන දින පරිසර අමාත්‍යාංශයේදී සිදුවිය. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිත රොබට් ජූකම් මහතා සහ දේශගුණ හා පරිසර අංශ ප්‍රධානී ප්‍රතිපත්ති විශේෂඥ ආචාර්ය බුද්ධික හපුආරච්චි මහතා ද සහභාගි විය.

තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ පාරිසරික විසඳුම ක්‍රියාත්මක කිරීම

- **දේශගුණය සහ හරිත ප්‍රතිස්ථාපනය සඳහා නයිට්‍රජන් - මාර්ගගත වැඩසටහන**
- UNEP සම්බන්ධීකරණයෙන් 2021 ජූලි මාසයේදී මෙය පැවැත්වූයේ කොළඹ ප්‍රකාශයේ පාර්ශකරුවන් සහ අන්තර් ජාතික **නයිට්‍රජන්** කළමණාකරණ පද්ධතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ මහාචාර්ය මාර්ක් සූටන්ගේ ප්‍රධානත්වයෙනි.
- ජූලි හා දෙසැම්බර් මාසයන්හි **UNEP හි නයිට්‍රජන් පිළිබඳ අන්තර් සම්මුති සම්බන්ධීකරණ යාන්ත්‍රණය** (INCOM) සඳහා නිර්ණීය විෂය පථය (ToR) සකස් කිරීමේ කාර්ය කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස සහභාගී විය.
- **4 "නයිට්‍රජන් හා දේශගුණික අවස්ථා - දකුණු ආසියාවෙන් ලොව වෙත"-ශ්‍රී ලංකාව හා SACEP අතර පාර්ශ්වීය වැඩසටහන (COP 26 UNFCC)** පරිසර අමාත්‍යාංශයේ අන්තර්ජාතික සබඳතා අංශය මඟින් 2021 නොවැම්බර් 03 වන දින සාර්ථකව සංවිධානය කරන ලදී.
- 2021 ඔක්තෝම්බර් 31 වන දින ග්ලාස්ගෝ නුවර වෙළඳ නිවාසයේදී ශ්‍රී ලංකාව සමඟ GEF/UNEP "ජාත්‍යන්තර නයිට්‍රජන් කළමනාකරණ පද්ධතිය(INMS), GCRF දකුණු ආසියානු නයිට්‍රජන් කේන්ද්‍රය(SANH), දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහන (SACEP) හා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය මඟින් COP 26 UNFCC සඳහා "නයිට්‍රජන් නැවත සොයා ගැනීම" පාර්ශ්වීය වැඩසටහන පවත්වන ලදී.

♦ **5GEF කුඩා ප්‍රදාන වැඩසටහන් වල ප්‍රතිපත්ති සංවාද:** ගෝලීය පරිසර පහසුකමෙන් අරමුදල් සපයන කුඩා ප්‍රදාන වැඩසටහනේ මෙහෙයුම් අදියර 6 (OP 6) හි දර්ශන තුනක ක්‍රියාත්මක වේ, එනම් නකල්ස් සංරක්ෂණ වනාන්තරය සහ එහි ආරක්ෂක කලාපය, මන්නාරම සිට වෙරළ කලාපය සහ යාපනය දක්වා සහ කොළඹ තෙත්බිම්. GEFහි OP 6 අවසන් අදියරේ පවතින හෙයින් එම හි දර්ශන 3 සඳහා ප්‍රතිපත්ති 3 ක් සකස් කිරීමට ප්‍රතිපත්ති සංවාදය මඟින් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

♦ **හත්වන මෙහෙයුම් අදියර ගෝලීය පරිසර පහසුකම /කුඩා ප්‍රදාන වැඩසටහන GEF /SGP තහවුරු කිරීමේ වැඩමුළුව:** GEF ලේකම් කාර්යාලය වෙත ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීමට පෙර එය සාර්ථකව සැලසුම් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය UNDP ආයතනය එක්ව අදාළ පාර්ශවකරුවන් සමඟ තහවුරු කිරීමේ වැඩමුළුව සංවිධානය කරන ලදී.

♦ GEF කුඩා ප්‍රදාන වැඩසටහනේ සහය ඇතිව සකස් කළ ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළබඩ ප්‍රදේශයේ මල්වතු ඔය සිට පුනරීන් දක්වා වූ කඩොලාන, ලුණු වගුරු සහ වෙරළ තීරයේ ඇවිලස් සිතියම ගරු ඇමතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් දියත් කරන ලදී.

ජාත්‍යන්තර පාරිසරික සම්මුතීන්, සන්ධාන, සහයෝගිතා වැඩසටහන් සහ ජාත්‍යන්තර ආයතන සඳහා වර්ෂික **රාජ්‍ය** දායකත්ව මුදල් හා සත්කාරක පහසුකම් වලින් 2021 වර්ෂයේදී පහත සඳහන් ගෙවීම් සිදු කොට අවසන් කර ඇත.

- එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP)
- එක්සත් ජාතීන්ගේ කාන්තාරීකරණය පිටු දැකීම පිළිබඳ සම්මුතිය (UNCCD)
- එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) කියෝතෝ සන්ධානය
- උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශසීමා හරහා ප්‍රවාහනය හා බැහැර කිරීම් පාලනය සඳහා වන බාසල් සම්මුතිය (Basel)
- මිනමාටා සම්මුතිය
- ලෝක සංරක්ෂණ සංගමය (IUCN)
- ජෛව විවිධත්ව සම්මුතිය හා ජෛව සුරක්ෂිතාව පිළිබඳ සන්ධානය
- දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහන (SACEP)
- දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහන (SACEP) සත්කාරක පහසුකම්
- දකුණු ආසියානු පාරිසරික සහයෝගිතා වැඩසටහන යටතේ දකුණු ආසියානු සාගර වැඩසටහන
- දිගුකල් පවත්නා කාබනික දූෂ්‍යකාරක පිළිබඳ ස්ටොක්හෝල්ම් සම්මුතිය



2.1.10 පාරිසරික දින සැමරීම

ජාත්‍යන්තර ජෛවවිවිධත්ව දිනය සැමරීම

(2021 මැයි 22)

මෙවර තේමා පාඨය වූයේ "සුරක්ෂිත සෙබාදහමකට හවුල්කරුවන් වෙමු "යන්නයි.

මෙම වසරේ ජෛවවිවිධත්ව සම්මුතියේ තේමාවට අනුව විදුසර සහ විජය පුවත්පත්වල ලිපි දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී. තවද ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයේ හෙක්ටයාර 4ක පමණ භූමී ප්‍රදේශයක පාර දෙපස පැතිර ඇති ආක්‍රමණශීලී ආගන්තුක ශාක ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ඉවත් කිරීමේ ප්‍රායෝගික වැඩසටහනක් සිදු කිරීම.

ජගත් පරිසර දිනය 2021 සැමරුම් වැඩසටහන.

(2021 ජුනි 06)

මෙවර ජගත් පරිසර දිනය "පරිසර පද්ධති ප්‍රතිෂ්ඨාපනය" යන තේමාව යටතේ පරිසර පද්ධති ආරක්ෂා කිරීමේ වටිනාකම ඉස්මතු කරමින් සැමරීම සිදු කරන ලදි. මෙයට සමගාමීව 2021.06.05 දින පරිසර ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ සහභාගීත්වයෙන් zoom තාක්ෂණය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු සිදුකරන ලදි.

ලෝක කාන්තාරීකරණය හා නියඟය වැළැක්වීමේ දින සැමරුම් වැඩසටහන.

(2021 ජුනි 17)

2021 ජූනි 17 වන දිනට යෙදුනු ලෝක කාන්තාරකරණය වැලැක්වීමේ දිනයට සමගාමීව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීම

අන්තර්ජාතික කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණ දින සැමරුම් වැඩසටහන.

(2020 ජූලි 26)

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව, ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මේ සම්බන්ධයෙන් අදාළ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සමග කඩොලාන විශේෂ හඳුනා ගැනීමේ සහ ඒවායේ වැදගත්කම පිළිබඳ ක්ෂේත්‍ර වැඩසටහනක් 2021 දෙසැම්බර් මස 17 දින මැඩිල්ල රැකව කළපුව ආශ්‍රිතව පවත්වන ලදී.

නිල් අහස් තලයක් සඳහා පිරිසිදු වාතය පිළිබඳ පළමු ජාත්‍යන්තර දිනය සැමරීම

(2021 සැප්තැම්බර් 07)

"සෞඛ්‍ය සම්පන්න ලොවක් සඳහා සෞඛ්‍ය සම්පන්න වාතය" තේමාව පෙරදැරි කරගනිමින් නිල් අහස් තලයක් සඳහා පිරිසිදු වාතය පිළිබඳ දෙවන ජාත්‍යන්තර දිනය 2021 සැප්තැම්බර් 07 දින ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ලේකම් අනිල් ජාසිංහ මහතාගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදි.

මෙම අවස්ථාවට සමගාමීව වායු තත්ත්ව කළමනාකරණයෙහි වැදගත්කම පිළිබඳව ඩේලි මිරර් පුවත්පතේ පුවත්පත් අතිරේකයක් ප්‍රකාශයට පත් කිරීම මගින් මහජනතාව දැනුවත් කිරීම සිදු කෙරිණි.

ජගත් ඕසෝන් දිනය

(2021 සැප්තැම්බර් 16)

"මොන්ට්‍රියල් සන්ධානය : අපව ,අපේ ආහාර සහ එන්නත් සිසිල්ව තබයි" යන ගෝලීය තේමාව පෙරදැරි කර ගනිමින් ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ සහභාගීත්වයෙන් සූම් තාක්ෂණය ඔස්සේ මාර්ගගතව පැවැත්විණි.

ආහාර අපතේ යාම සහ ආහාර අපද්‍රව්‍ය අවම කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ ජාත්‍යන්තර දිනය සැමරුම් වැඩසටහන.

(2021 සැප්තැම්බර් 29)

සැමරුම් උත්සවය අමාත්‍යාංශ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. ආහාර අපතේ යාම සහ ආහාර අපද්‍රව්‍ය අඩු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව පුවත්පත් ලිපියක් ප්‍රකාශයට පත් කරන ලදී.

ලෝක පාංශු දිනය සැමරීම -2021
(2021 දෙසැම්බර් 05)

2021 වසරේ ලෝක පාංශු දිනය සැමරීම **ලවණතාවය අඩු කිරීම තුළින් භූමි ඵලදායීතාවය ඉහළ නංවමු** තේමාව යටතේ සැමරීම සිදුකෙරිනි. කිරිබත්ගොඩ ඇවිදින මංතීරුව ආශ්‍රිත ඌන පරිහරණ කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමේ අදහසින් සෝජාන් ආදර්ශන ස්ථානයක් ඉදිකිරීම කරන ලදී.

අන්තර්ජාතික කඳුකර දිනය සැමරීම

(2020 දෙසැම්බර් 11)

"තිරසර කඳුකර සංචාරය" යන තේමාව යටතේ විද්වත් කතිකාවතක් 2021 දෙසැම්බර් 11 වන දින ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශනය කිරීමට කටයුතු කරන ලදී.

2.1.11 සුරකිමු ගංගා ජාතික වැඩසටහන

"සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහනේ පරමාර්ථය වන්නේ කොට්ඨාශ, දිස්ත්‍රික්ක හා ජාතික මට්ටමින් අදාළ පාර්ශවකරුවන් අතර ඵලදායී සම්බන්ධීකරණයක් සහිත විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම තුළින් කෙටිම කාලසීමාව තුළදී දිවයිනේ ගංගා පද්ධති සඳහා පරිසර දූෂණය අවම කිරීම සහ මෙම විෂය පථය තුළ ඇති සියලුම රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන වල සම්පත් ඵලදායී ලෙස ආයෝජනය කිරීම හා ප්‍රයෝජනයට ගැනීම මෙන්ම පාරිසරික ආරක්ෂණ නීති හා රෙගුලාසි විනිවිදභාවයෙන් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම.

සුරකිමු ගංගා සමාරම්භක ජාතික පාරිසරික වැඩසටහන - කතරගම මැණික් ගඟ කේන්ද්‍රකර ගනිමින් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරම්භ කරන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල දැනුවත් කිරීමේ සැසි 25 ක් පැවැත්විණි. "සුරකිමු ගංගා" දිස්ත්‍රික් කමිටු 25 ක් පිහිටුවන ලදි. "සුරකිමු ගංගා" ප්‍රාදේශීය කමිටු 334 ක් පිහිටුවන ලදි. "සුරකිමු ගංගා" ලේකම් කාර්යාලයක් පිහිටුවන ලදී. සුරකිමු ගංගා වැඩසටහන සඳහා මාර්ගෝපදේශ සකස් කරන ලදි. ඇගයීම සඳහා ලැබුණු ව්‍යාපෘති යෝජනා අතුරින් අනුමත ව්‍යාපෘති යෝජනා 50ක් සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන යවා ඇත.





2.1.12 හුස්ම දෙන තුරු ජාතික රුක්රෝපණ වැඩසටහන

හුස්ම දෙන තුරු ජාතික රුක්රෝපණ වැඩසටහන යටතේ මොනරාගල, කොළඹ, කෑගල්ල, හම්බන්තොට, ගාල්ල හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල රුක්රෝපණ වැඩසටහන් මේ වනවිට ක්‍රියාත්මක කෙරෙමින් පවතී.



අලුත් අවුරුද්ද සැමරීම වස් අප්‍රේල් මස 16 වන දින උදෑසන 6.40 ට "නැකතට පැළයක්" ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාවට නැංවීම.



දීප ව්‍යාප්තව මී පැළ 50,000 ක් රෝපණය කිරීමේ වැඩසටහනෙහි සමාරම්භක උත්සවය ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන්ගේ සංගමය හා ස්වර්ණවාහිනී මාධ්‍ය ආයතනයේ දායකත්වයෙන් 2021.02.12 දින හම්බන්තොට වීරවිල වැව් තාවුල්ලේදී පැවැත්විය. මෙහිදී පැල 300 රෝපණය කරන ලදී.

බාලදක්ෂ දූ පුතුන් හරහා පැල 100,000 රෝපණය



කිරීමේ සමාරම්භක උත්සවය ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ප්‍රධාන කොමසාරිස් හා හෝමාගම දිසාවේ දිසා කොමසාරිස්ගේ සහභාගීත්වයෙන් පරිසර අමාත්‍යාංශයේදී 2021 පෙබරවාරි 22 දින පැවැත්විය.

2021 ජාතික වෙසක් උත්සවයට සමගාමීව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් යාපනය දිස්ත්‍රික්කයේ දී ක්‍රියාත්මක කළ රුක්රෝපණ වැඩසටහන සඳහා පැල 5000 ක් ලබා දෙන ලදී.

2021.10.24 දින ගාල්ලේ, ගෝනාපීණුවල ප්‍රදේශයේ රුක්රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.



2021.12.05 දින කෑගල්ල දිස්ත්‍රික්කයේ රුක්රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.



හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණය වැඩසටහන යටතේ දිවයින පුරා පැළ තවාන් 650 ක් ඇති කිරීමේ වැඩසටහන.

සියලුම දිස්ත්‍රික්ක වලින් අයදුම්පත් කැඳවන ලද අතර එම අයදුම්පත් ඇගයීමට ලක් කර දිස්ත්‍රික්ක 17 කින් තෝරා ගත් අයදුම්කරුවන් 331 ක් සඳහා මුදල් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කරන ලදී.

2.1.13 ආයතනික කටයුතු

සේවා ස්ථිර කිරීම්	
රාජ්‍ය කළමනාකරණ සේවය	04
ඒකාබද්ධ රියදුරු සේවය	02
කාර්යාල කාර්ය සහායක	02
උසස් කිරීම්	
දීපව්‍යාප්ත සේවා	06
රාජ්‍ය කළමනාකරණ සේවය	03
ඒකාබද්ධ රියදුරු සේවය	01
කාර්යාල සේවක සේවය	01
වැඩසටහන් සහකාර	14
විශ්‍රාම ගැන්වීම්	
කාර්යාල සේවක සේවය	01
ඉල්ලා අස්වීම්	
උපාධිධාරී අභ්‍යාසලාභී	01
ණය ලබා දීම්	
ආපදා ණය	88
දේපළ ණය	05
හැදුනුම්පත් සකස් කිරීම්	**35**
පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම්	**13**
වාර්ෂික වාර්තා හා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම්	**01**
සහනදායී පදනම් මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම්	**10**
අමාත්‍ය මණ්ඩල සංදේශ	**31**

2.1.14 අභ්‍යන්තර විගණන

අමාත්‍යාංශය හා ඊට අයත් ආයතනවල අභ්‍යන්තර පාලනය විධිමත්ව ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2021 වර්ෂය සඳහා සකස් කරන ලද විගණන සැලසුමට අනුව අභ්‍යන්තර විගණන පරීක්ෂණ 11 ක් ආරම්භකර ඇති අතර විගණන පරීක්ෂණ 9ක් සිදු කර වාර්තා නිකුත් කර ඇත. විගණන පරීක්ෂණ 02 ක් සඳහා විගණන කටයුතු අවසන් කර වාර්තාව නිකුත් කිරීමට ඇත. විගණන සැලැස්මට පරිබාහිරව විශේෂ විමර්ශන 02ක් සිදු කර ඇත.

අදාළ පාර්ශව වල සහභාගිත්වයෙන් කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ඇත.

2021.04.05 - වර්ෂයේ පළමු විගණන

2021.12.02 - වර්ෂයේ දෙවන විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

2.1.15 පරිසර ගැටළු පිළිබඳ මහජන පැමිණිලි, අභියාචනා හා මාධ්‍ය වාර්තා

වාර්තාකරණ කාලසීමාවට අදාලව රූපවාහිනී නාලිකාවල විකාශනය වූ පාරිසරික ගැටළු/ අවධානයන් නිරීක්ෂණය කර පරිසරයට අදාළ වූ ගැටළු 55 ක් සඳහා ක්‍රියාත්මක වන ලදි. තවද, පුවත්වල පලවූ පරිසර සංවේදී මාතෘකා පිළිබඳව අවධානය යොමු කරමින් ගැටළු 15 ක් සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදි.

විමර්ශන කටයුතු සඳහා පැමිණිලි 1,688 ක් ලැබී ඇති අතර 1,449 සඳහා වාර්තා කැඳවා ඇති අතර පිළිතුරු ලැබීම් 875ක් හා විමර්ෂණ 15ක් සිදුකරමින් පවතී.

ජාතික පාරිසරික පනත හා පතල් හා ඛනිජ පනත යටතේ අභියාචනා විභාගය පිලිවෙලින් 58 හා 39 ලැබී ඇත.

2.1.16 නෛතික කටයුතු

අමාත්‍යාංශයට අදාල නඩු/මානව හිමිකම් නඩු කටයුතු සඳහා සහාය දැක්වීම	85
නීති කෙටුම්පත් සම්පාදක සහ නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා අදාල නීතිමය ලියකියවිලි සකස් කිරීමට සහාය වීම (ගැසට්,පනත් හා රෙගුලාසි)	06
ගිවිසුම් සකස් කිරීම/පරීක්ෂා කිරීම	42
මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු සිදුකිරීම	07

2.2 පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

2.2.1 පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල (ESA) ජෛවවිවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය

පරිසර අමාත්‍යාංශය පස් අවුරුදු සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කරන පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛවවිවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහය ලැබෙන අතර, ජගත් පාරිසරික පහසුකම (GEF) මගින් මූල්‍යාධාර සපයනු ලබයි.



ජෛවවිවිධත්වයට සිදු වන තර්ජන අවම කර ගැනීම උදෙසා, ඉහළ සංරක්ෂණ වැදගත්කමක් සහිත පරිසර සංවේදී භූමි ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශිත ප්‍රදේශයන්ට පරිබාහිරව පවතින පරිසර පද්ධති සේවාවන් හා ජෛව විවිධත්වය අතින් අතිශයින් වැදගත්කමකින් යුතු පරිසර සංවේදී කලාප හඳුනාගෙන ජෛවවිවිධත්වය සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය මූලික කරගත් ඉඩම් පරිහරණ සැලසුම් රටාවක් තුළින්

පරිසර පද්ධති කළමනාකරණය සංවර්ධනය සමඟ අනුප්‍රවාහගත කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරිණි.

පරිසර පද්ධති කළමනාකරණය සමඟ සංවර්ධනය අනුප්‍රවාහගත කිරීම මඟින් ශ්‍රී ලංකාව තුළ දිගු කාලීනව තිරසර සංවර්ධනය තහවුරු කර ගැනීමට මෙම ව්‍යාපෘතිය හරහා මූලික පදනම සැලසෙනු ඇත. එසේම මෙම ව්‍යාපෘතියේ අත්දැකීම් ශ්‍රී ලංකාවේ අනෙකුත් පාරිසරික සංවේදී කලාප සඳහා ඉදිරියේදී යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

නිමැවුම 1: පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණය කිරීම සඳහා ආයතනික හා නීතිමය රාමුවක් ඇති කිරීම සහ මාර්ගෝපදේශ සැකසීම

නිමැවුම 2: කලා ඔය ද්‍රෝණියේ පාරිසරික සංවේදී කලාප වල ජෛවවිවිධත්ව සංරක්ෂණය

2021 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම්.

පරිසර සංවේදී භූමි කලමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ග සකස් කොට මහජන අදහස් ද ඇතුළත් කොට වලංගුකරණයට පත්කරන ලදි. අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට සකස් කොට ඇත.

අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික් තුළ දිස්ත්‍රික් පහසුකම් කමිටු 02 ක් සහ ප්‍රාදේශීය කළමනාකරණ කමිටු 02 දියත් කිරීම.

පුත්තලම එලුවන්කුලමෙහි ඒකාබද්ධ අධීක්ෂණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම .

පැල තවාන් 05 ක් පිහිටුවීම. (විල්ලුවලට ආවේණික ශාක විශේෂ)







ESA අඩවි 3 ක් සඳහා සහකළමනාකරණ සැලසුම් සකස් කරන ලදි.

1 ගඟේ-වාඩිය

2 මානෑව කන්ද

3 කලාඔය (වල්ලුවේගම)







ලංකාව පුරා ඇති පරිසර සංවේදී කලාප පාර්ශවකාර ආයතන සතුව ඇති දත්ත පදනම් කරගනිමින් හඳුනා ගැනීම පිළිබඳ ජාතික පරිමාණ සැලැස්ම (National Scale up plan) සකස් කොට වලංගුතාවයට පත් කොට ඇත. අන්තර්ජාල වෙබ් අඩවිය නිර්මාණය කිරීම. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු කිරීම.

ප්‍රජා මූල සංවිධාන (CBO) ස්ථාපිත කර පුහුණුව ආරම්භ කර සමාජ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සහාය වීම හා දින 20 ක පාරිසරික සංචාරක වැඩසටහන ගඟේ වාඩියේදී පැවැත්විණි.







2.2.2 පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් (PCB) අපද්‍රව්‍ය හා පොලික්ලෝරිනේටඩ් අඩංගු උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ විදුලි ට්‍රාන්ස්ෆෝමර් සහ වැල්ඩින් ට්‍රාන්ස්ෆෝමර් අතරින් **PCB** අඩංගු තෙල් සහිත ට්‍රාන්ස්ෆෝමර් හඳුනාගෙන එහි ඇති ට්‍රාන්ස්ෆෝමර් තෙල් සහ භාවිතයෙන් ඉවත් කරන ලද ට්‍රාන්ස්ෆෝමර් පරිසර ආරක්ෂිත ලෙස බැහැර කිරීමයි.

වෙල්ඩින් අංශයේ ඉන්වෙන්ට්‍රිය සාදා නිම කර ට්‍රාන්ස්ෆෝමර් තෙල් සාම්පල්, පරීක්ෂාව සඳහා ඉදිරිපත්කර ඇත. **PCB** සහිත තෙල් සඳහා පිරිසිදු තෙල් ලබාදීම සිදු කිරීමට අපේක්ෂා කෙරේ. බලශක්ති අංශයේ **PCB** ට්‍රාන්ස්ෆෝමර් ඉන්වෙන්ට්‍රිය සකස් කිරීම ද නිම කර ඇත.

2021/09/15 දින අංක 21/1573/321/018 කැබිනට් තීරණයට අනුව බැහැර කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා යටිතල පහසුකම් සැලසීම වෙනුවෙන් රජයේ දායකත්වය වන රුපියල් මිලියන 68ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දී ඇත.

බලශක්ති සහ වෑද්දුම් අංශ සඳහා PCB පුහුණු සහ ඉන්වෙන්ටරි අත්පොත සකස් කරන ලදි.

පාසල්, විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන වල පරිශීලනය සඳහා දිගුකල් පවතින ජෛව සමුච්චිත සහ විෂ රසායනික ද්‍රව්‍ය (PBT) පිළිබඳ අත්පොත සකස් කරන ලදී.

ජාතික රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීම

මේ ව්‍යාපෘතිය යටතේ **ජාතික** රසායනික ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය කෙටුම්පත සකස්කර ඇත. ප්‍රතිපත්තිය සඳහා මහජන අදහස් ලබාගෙන ඒවා ඇතුළත් කරන ලදී. ප්‍රතිපත්තිය සකස් කිරීම අවසන් අදියරේ පවතින අතර එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

2.2.3 මිනමාටා සම්මුතිය යටතේ "රසදිය මූලික තක්සේරු වාර්තාව"

මෙම ව්‍යාපෘතිය මගින් සෞඛ්‍ය, කාර්මික හා අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි රසදිය භාවිතය පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණයක් මගින් මූලික තක්සේරු වාර්තාවක් සකස් කිරීම සිදුවේ.

මිනමාටා මූලික ඇගයීම් ව්‍යාපෘතිය (දෙවන අදියර)

රන් භාණ්ඩ සාදන කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් පිළිබඳ සමීක්ෂණයක් කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර මේ වනවිට කොළඹ, ගම්පහ, මහනුවර, බදුල්ල, ගාල්ල, මාතර හා යාපනය යන දිස්ත්‍රික්ක වල සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

කුඩා පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදන අංශයේ රසදිය භාවිතය පිළිබඳ සමීක්ෂණයේ අවසාන වාර්තාව එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන ආයතනය (UNIDO) සහ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ නිර්දේශ ලබා ගන්නා ලදී.

කුඩා පරිමාණයේ රන් භාණ්ඩ සාදන්නන් සඳහා රසදිය නොවන විකල්ප සඳහා රසායනාගාර පරීක්ෂණ කෙරෙමින් පවතී. එක් විකල්පයක් පරීක්ෂා කිරීම අවසන් කර ඇත.

කුඩා පරිමාණ ස්වර්ණාභරණ කර්මාන්ත කරුවන්ගේ මිනිස් පටක වල, අවයව වල රසදිය තැන්පත් වීම අධ්‍යයනය කර එහි බලපෑම හඳුනා ගැනීම (Bio-monitoring) සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කර ඒ සඳහා ගිවිසුම්ගත වීමට යෝජිතයි.

2.2.4 ගෝලීය පාරිසරික පහසුකම යටතේ පවතින එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියට අදාල ජාතික වාර්තාකරණ ක්‍රියාවලිය

මෙම වාර්තාකරණ ව්‍යාපෘතිය මගින් එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියෙහි වර්තාකරණ ක්‍රියාවලිය සඳහා ජාතික මට්ටමින් දත්ත හුවමාරුකිරීම සඳහා අවශ්‍ය පසුබිම සලසයි. මෙම කර්තව්‍ය සඳහා භූමිය ආශ්‍රිත දත්ත උත්පාදනය කරනු ලබන රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන පාර්ශව ආයතන රැසක් හඳුනාගෙන ඇත. මෙම වාර්තාකරණය සඳහා පාංශු කාබන්, කාබනික භූමි ඵලදායීතාවය සහ භූමි වැස්ම යන කාණ්ඩ 03 යටතේ දත්ත එක්රැස් කිරීම සිදුකරනු ලබයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාංශු විද්‍යා අධ්‍යනාංශය හා සම්බන්ධව පාංශු කාබන් කාබනික දත්ත වාර්තාකරණ ව්‍යාපෘතිය සඳහා මේවන විට දිවයිනම ආවරණය වන පරිදී දත්ත රැස්කරමින් පවතී. පාංශු කාබන් කාබනික දත්ත සාම්පල රැස් කිරීම මේ වන විට දිවයිනේ උතුරු හා උතුරු මැද පළාත්වල හැර අනෙකුත් පළාත්වල සම්පූර්ණ කර ඇත. භූමි ඵලදායීතාවය පිළිබඳ දත්ත ලබා ගැනීමේ උපදේශන සේවය වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුම අත්සන් කර ඒ සඳහා මූලික ගෙවීම් සිදු කිරීමට කටයුතු සකස් කර ඇත.

භූමි ආවරණ දත්ත මූල්‍යමය ගෙවීමකින් තොරව ලබාදීමට හැකි බව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ලිපියක් මඟින් දන්වා ඇත.

දත්ත පද්ධතියක් පිහිටුවීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මොරටුව විශ්වවිද්‍යාලය සමඟ සාකච්ඡා කිරීම හා ඒ සඳහා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර ඇත.

වාර්තාකරණ ක්‍රියාවලිය සිදුකරන භූමි සම්පත් අංශයේ ධාරිතා වර්ධනය සඳහා තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සිදු කරයි. භූමි ඵලදායිතා දත්ත ලබාගැනීමේ උපදේශක සේවය වෙනුවෙන් දෙවන ගෙවීම් කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතී. වාර්තාකරණ දත්ත පද්ධතියට ඇතුලත්කර දත්ත පද්ධතියක් ඇතිකිරීමේ කාර්ය සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨය සමග ගිවිසුමක් අත්සන් කිරීම සිදුකර ඇත.

2.2.5 මධ්‍යම කඳුකරයේ හායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මධ්‍යම කඳුකරයේ මහනුවර, බදුල්ල සහ නුවරඑලිය යන දිස්ත්‍රික්කයන් හි කෘෂිකාර්මික ඉඩම් හායනය නැවැත්වීම සහ හායනයට පත් වූ ඉඩම් පුනරුත්ථාපනය කිරීමයි.

දැනට පවතින තිරසාර ඉඩම් කළමනාකරණය (SLM) ආශ්‍රිත ප්‍රතිපත්ති සමාලෝචනය කරන ලද අතර SLM ප්‍රමිතීන්ට අනුවර්තනය වීම සඳහා වූ නිර්දේශ සැකසීම සමාන සංවිධාන 15 කට වැඩි ගණනක සහභාගීත්වයෙන් අවසන් කරන ලදී.

එලදායි පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ උපාය මාර්ගයක් සකස් කිරීම එක් නිර්දේශයක් වූ අතර ව්‍යාපෘතිය මඟින් ඒ ඒ ප්‍රදේශයට විශේෂිත පොහොර යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ ක්ෂේත්‍ර මට්ටමේ අභියෝග විශ්ලේෂණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී.

ගොවි ක්ෂේත්‍ර පාසල් (FFS) තුළින් තිරසාර ඉඩම් කළමනාකරණය (SLM) ප්‍රවර්ධනය කිරීම

ගෙවතු වගාව, බීජ අර්තාපල් වගාව, GAP සහතික කළ එළවළු සහ කුඩා තේ වතු නිෂ්පාදනය ඇතුළු විවිධ ගොවිතැන් ක්‍රම සඳහා තිරසාර ඉඩම් කළමනාකරණයෙ (SLM) හි භාවිතා කරන ආකාරය පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව FFS වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. FFS ක්‍රම සම්බන්ධයෙන් සියලු පාර්ශවකාර ආයතනයන්හි ක්ෂේත්‍ර නිලධාරීන් හා පහසුකම් සපයන්නන් 128ක් පුහුණු කර ඇත. එසේ පුහුණුව ලැබූ පහසුකම් සපයන්නන්ගේ සහයෙන් ක්ෂේත්‍රයේ FFS සැසි පවත්වන ලද අතර එමඟින් ගොවි මහතුන් 1730 ක් ඍජුවම ප්‍රතිලාභ ලබා ගෙන ඇත.

ව්‍යාපෘතිය මඟින් ආදර්ශ ස්ථාන ඉදි කිරීම සඳහා සහය දෙන ලද අතර තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක තුළ තනි භූමි කොටස් 120 ක් සහ රජයේ ආයතන වලට අයත් පොදු ක්ෂේත්‍ර 04ක් ඒ අතර වේ. එනම්, බිඳුණුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ කුණ්ඩසාලේ පිහිටි පුහුණු මධ්‍යස්ථානය, පස්සර තේ පර්යේෂණ ආයතනය සහ සුරියගොඩ පිහිටි කුඩා තේ වතු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානය යි. 10,000 කට වැඩි ගොවි මහතුන් ප්‍රමාණයක් මෙම ආදර්ශ ස්ථාන මඟින් දැනුම සහ පුහුණුව ලබමින් ප්‍රතිලාභ ලබාගෙන ඇත.

ජාතික මට්ටමේ තොරතුරු හුවමාරු වේදිකාව, එනම් ශ්‍රී ලංකා සංරක්ෂණ ප්‍රවේශයන් සහ තාක්ෂණයන් සමාලෝචනය - SriCAT, පරිසර අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පිහිටුවන ලදි. එය ජාතික මට්ටමේ තොරතුරු හුවමාරු කිරීමේ වේදිකාවක් ලෙස තවදුරටත් දියුණු කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාංශු විද්‍යා දෙපාර්තමේන්තුවට භාර දෙනු ඇත.

කෘෂිකර්මාන්තය පුළුල් කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ සමාජ මාධ්‍ය භාවිතය නව්‍ය ප්‍රවේශයක් ලෙස ප්‍රවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය මඟින් Zoom තාක්ෂණය ඔස්සේ මාඟිගත ධාරිතා වර්ධනය, වාර්තාමය වීඩියෝ පට තුළින් අධ්‍යාපනය සහ ප්‍රාදේශීය මාධ්‍ය ක්‍රමවේද භාවිතය ඇතුළු බොහෝ විකල්පයන් භාවිතා කරමින් අත්හදා බලන ලද නමුත් ගොවිමහතුන් අතර හඳුන්වාදුන් වට්ස්ඇප් කණ්ඩායම් හරහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් කෘෂිකාර්මික ව්‍යාප්ති හඳුන්වා දීමේ උත්සාහය ඉතා සාර්ථක විය.



බීජ අර්තාපල් FFS –WhatsApp කණ්ඩායම් 13 ක ගොවින් 87

GAP සහතික කිරීම FFS – WhatsApp කණ්ඩායම් 12 ක ගොවින් 113

ගෙවතු වගාව FFS – WhatsApp කණ්ඩායම් 60 ක ගොවින් 846

2.2.6 ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මගින් ඕසෝන් වියන හායනය වැලැක්වීම උදෙසා ඉතා සුවිශේෂී දායකත්වයක් දැක්වූ අතරම 2016 වර්ෂයේදී කිගාලි සංශෝධනයට අනුගතවීමත් සමග වායුගෝලීය උෂ්ණත්වය ඉහලයාම වලක්වාලීම උදෙසා ද විශේෂ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම ආරම්භ කෙරිණි.

- 2021 වර්ෂයේදී අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතන 16 ක් සඳහා HCFC මෙට්‍රික් ටොන් 156.059ක් ආනයනය කිරීම සඳහා කෝටා නිකුත් කරන ලද අතර ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ජාතික ඕසෝන් ඒකකයේ නිර්දේශයන්ට අනුව HCFC ශීතකාරකය ආනයනය සඳහා ආනයන පාලන බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

- HFC ආනයනය කිරීම පාලනය කිරීම සඳහා 2024 වර්ෂයේ සිට කෝටා නිකුත් කිරීම අනුව බලපත්‍ර ලබාදීම සිදුකරනු ලැබේ.

- ඕසෝන් ප්‍රභීනකාරී ද්‍රව්‍ය පරිභෝජන දත්ත ශ්‍රී ලංකා රේගුව හා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව 2021 සැප්තැම්බර් මාසයේදී අදාල ආයතනයන් වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

- කාර්මිකයින්ගේ සේවාව ප්‍රමිතිගත කිරීම සඳහා ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ පරිසර මිතුරු තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ඔවුන්ට ලබාදීමෙන් පසු පැවැත්වෙන පරීක්ෂණයකින් ඔවුන් සඳහා Recognition for Prior Learning (RPL) නමින් හඳුන්වනු ලබන සහතිකපතක් නිකුත් කිරීම සඳහා ජාතික ඕසෝන් ඒකකය විසින් සහයෝගිතාව ලබාදේ. මෙම වසරේදී මෙම වැඩසටහන සඳහා නුපුහුණු කාර්මික මහතුන් 40 දෙනෙකු තෝරාගෙන ඇත.

- පරිසරයට ශීතකාරක ද්‍රව්‍ය මුක්තවීම අවම කිරීම සඳහා උපකරණ හා ආයුධ කට්ටල බෙදා දීම මොණරාගල, මිරිජ්ජවිල, හේනකඩුව, පැල්පොත, කිළිනොච්චිය යන වෘත්තීය පුහුණු ආයතන සඳහාත් බෙලිඅත්ත හා කිළිනොච්චිය යන කාර්මික අධ්‍යාපන ආයතන සඳහාත් බෙදා දෙන ලදී.

- ඕසෝන් ප්‍රභීනකාරී රසායන ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව සම්බන්ධ කරමින් මාර්ගගත ස්වයංක්‍රීය අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

- විකල්ප ශීතකාරකයන් භාවිතය සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) හඳුන්වා දීම සඳහා තාක්ෂණික කමිටුවක් පත්කරන ලදී.

- ශ්‍රී ලංකාව සඳහා ජාතික සිසිලන ප්‍රතිපත්තියක් සකස් කිරීම 2021 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

- ශ්‍රී ලංකාව සඳහා "ජාතික සිසිලන ක්‍රියාකාරී සැලැස්ම" යනු සිසිලන ක්ෂේත්‍රයට අදාල සියළුම අංශ සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාවේ සිසිලන බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට උපයෝගී කර ගත හැකි උපායමාර්ගික සැලැස්මකි. මෙම නිර්දේශ සහිත සැලැස්ම 2021 වර්ෂයේදී සකසා සම්පූර්ණ කරන ලදි

- පරිසර හිතකාමී වායු සමන යන්ත්‍ර 46 ක් මිලදී ගැනීම වෙනුවෙන් දිරි දීමනා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා ලබාදෙන ලදී.

- ඕසෝන් දිනයට සමගාමීව බීජ බෝල ව්‍යාප්ත කිරීම සඳහා "Throw & Grow" සංකල්පය හඳුන්වා දෙන ලදී. බීජ බෝල විසිර වීම යනු ශාක හා වනාන්තර වැඩීමට සහ හායනයට ලක්වූ ඉඩම් ප්‍රතිස්ථාපනය කිරීමට ආධාර කිරීම සඳහා වූ දේශීය ක්‍රමයකි.

- ජාතික ඕසෝන් ඒකකය සිය පාර්ශවකරුවන් අතර බීජ බෝල 100,000 ක් බෙදා හැරීම තුලින් කාබන් උදාසීන කිරීම සඳහා ශ්‍රී ලංකාව ගන්නා වූ උත්සාහයට දායක වීමට තීරණය කර තිබේ.



2.2.7 දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය

දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය වෙළඳපොළ සූදානම සඳහා වූ හවුල්කාරිත්වය මගින් ආධාර ලබා දෙන ව්‍යාපෘතියක් වන අතර මෙය හරිතාගාර වායු විමෝචන අඩු කිරීම සඳහා කාබන් මිලකරණ උපකරණ ඇතුළු දේශගුණික විපර්යාස අවම කිරීමේ ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීමට රටවලට ආධාර සපයන ලෝක බැංකුව විසින් පාලනය කරනු ලබන බහුපාර්ශ්වික භාරකාර අරමුදලකි. මෙම ව්‍යාපෘතිය 2019 අප්‍රේල් සිට 2021 පෙබරවාරි දක්වා ක්‍රියාත්මක වූ අතර එය 2021 පෙබරවාරි 28 දින අවසන් කෙරිණි.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූයේ

- කාබන් මිලකරණ උපකරණ හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම මගින් හරිතාගාර වායු විමෝචනය අඩුකර දේශගුණ විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් අවමකිරීම සඳහා වන ජාතික දායකත්වයන් (NDCs) යටතේ වන ඉලක්ක කරා ළඟා වීම.
- මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය (MRV) පද්ධතිය, කාබන් හර යෝජනා ක්‍රමය සහ කාබන් රෙජිස්ටරය වැනි නව යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මඟින් හරිතාගාර වායු විමෝචනය ප්‍රමාණාත්මක කිරීමට සහ වෙළඳාම් කල, ඉතිරි කල කාබන් වලින් ආදායමක් ලබා ගැනීමට උපකාරී වීම .

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද (Recepient Executed Trust Fund) අරමුදල තුළින් ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් වනුයේ

- මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ටරය (SLCR), ශ්‍රී ලංකා කාබන් හර යෝජනා ක්‍රමය (SLCCS) සහ කාබන් මිලකරණ උපකරණ (CPIs) ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රතිපත්ති පැකේජයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති අනුකූලතාවය සහ නිර්දේශ ඇගයීම.
- ජාතික දේශගුණ විපර්යාස දත්ත හුවමාරු කිරීමේ ජාල පද්ධතියක් සකස් කිරීම
- නව කාබන් මිලකරණ උපකරණයක් ලෙස (CPIs) විමෝචන වෙළඳ පද්ධතියක් (ETS) ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම.
- ලෝක බැංකුව විසින් PMR රටවලට සකස් කරන ලද MRV පද්ධතිය සහ රෙජිස්ටර් පද්ධතිය ශ්‍රී ලංකාවට ලබා ගැනීම සහ එය ජාතික අවශ්‍යතාවය මත සකස් කිරීම
- දේශගුණ විපර්යාස අවම කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වීඩියෝ පට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ඩිජිටල් හා සමාජ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම

ලෝක බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද (Bank Executed Trust Fund) අරමුදල තුළින් ව්‍යාපෘතිය මඟින් සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් වනුයේ

- ශ්‍රී ලංකාවේ විදුලිබල හා ප්‍රවාහන අංශ කාබනීහරණය කිරීමේදී කාබන් මිලකරණ උපකරණවල (CPI) කාර්යභාරය ගවේෂණය කිරීම පිළිබඳ තක්සේරු වාර්තාව සකස් කිරීම
- මැනීම, වාර්තාකරණය සහ සත්‍යාපනය (MRV), ශ්‍රී ලංකා කාබන් රෙජිස්ටරය (SLCR) සංවර්ධනය සඳහා අවශ්‍යතා තක්සේරුව, තාක්ෂණික හා ක්‍රියාකාරී පිරිවිතර වාර්තා සකස් කිරීම
- ශ්‍රී ලංකා කාබන් හර යෝජනා ක්‍රමය (SLCCS) ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ සැපයුම සහ ඉල්ලුම තක්සේරු වාර්තාව සකස් කිරීම, පළාත් මට්ටමේ සැපයුම ඉල්ලුම තක්සේරුව, ආයතනික නෛතික හා ක්‍රමවේද අවශ්‍යතා තක්සේරු කිරීම
- දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මගින් "දේශගුණ පිලිබඳ ශබ්දකෝෂය" සකස් කිරීම ආරම්භ කරන ලදී.

2.2.8 ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත තුල භාවිතයෙන් පසු ඉවතලන කෘෂිරසායන ඇසුරුම් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ භාවිතා කරන ලද කෘෂි රසායනික බහාලුම් එකතු කිරීම හා ඒවා පරිසර හිතකාමී ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීමයි. එතුළින් "තිරසර පරිසර කළමනාකරණය" පිළිබඳව දැනුවත් කිරීම සහ හිස් කෘෂි රසායනික බහාලුම් එකතු කිරීමේ සතියක් ප්‍රකාශ කෙරේ.

උතුරු මැද පළාතේ හිස් වීදුරු සහ ප්ලාස්ටික් බහාලුම් එකතු කිරීමේ ව්‍යාපෘතිය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ යොමු කළ කැබිනට් පත්‍රිකාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

මේ පිලිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් පොළොන්නරුවේ පැවැත්විණි.

2.2.9 ශ්‍රී ලංකාවේ තිරසාර හා කාර්යක්ෂම විදුලි සංචලතා පද්ධතියක් ප්‍රවර්ධනය පිළිබඳ ව්‍යාපෘති යෝජනාව පිළියෙල කිරීම

ශ්‍රී ලංකාව තුල විද්‍යුත් සංචලතාව ප්‍රවර්ධනය අරමුණු කර ගනිමින් ගෝලීය පරිසර පහසුකම් සැලසීමේ (GEF) මූල්‍ය ආධාර සඳහා ව්‍යාපෘති සංකල්පයක් සකස් කර ඉදිරිපත් කරන ලද අතර, GEF ආයතනය මගින් එම යෝජනාව අනුමත කර ඇත. ඒ අනුව, නාගරික වායු දූෂණය අවම කිරීම සහ ප්‍රවාහන අංශයේ හරිතකරණය ඉහළ නැංවීම සඳහා විද්‍යුත් සංචලතාව ප්‍රවර්ධනය පිළිබඳ සවිස්තරාත්මක යෝජනාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර, මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව විද්‍යුත්කරණය දෙසට මාරුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ ආයතනික රාමුවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රවාහන, විදුලිබල, බලශක්ති, කර්මාන්ත හා මුදල් වැනි පාරිසරික විෂය භාර (පාර්ශවකාර) අමාත්‍යාංශයන්ගෙන් සමන්විත නිලධාරී කමිටුවක සහ විශේෂඥ කමිටුවක සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ විද්‍යුත් සංචලනය ප්‍රවර්ධනය කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පරිසර අමාත්‍යාංශය පෙරමුණ ගෙන කටයුතු කරන ලදි. 2021 ජූලි මාසයේදී මෙම යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

2.2.10 “ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මකභාවය තිරසාර කිරීම: කොවිඩ්-19 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට පියවර 25ක්” ව්‍යාපෘතිය

උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සහ පරිසර අමාත්‍යාංශ අතර කුඩා පරිමාණ අරමුදල් ගිවිසුමක් (SSFA) අත්සන් කරන ලදි. සැමට නිල් අහසින් යුත් පිරිසිදු වායුවත් සහිත යහපත් අනාගතයක් ගොඩ නැංවීම උදෙසා නගරයන්හි ශක්තිමත් කරන ලද පිරිසිදු වායු විසඳුම් වල දෘශ්‍යතාව වැඩි කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන මගින් 2018 වසරේදී ආසියා පැසිෆික් කලාපයේ වායු දූෂණය: විද්‍යාව පදනම් කරගත් විසඳුම් නැමැති වාර්තාවේ නිර්දේශිත අංශ 25 ක් ඔස්සේ වාතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන ප්‍රතිපත්ති සකස් කළයුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සිදුකෙරේ.

2.2.11 ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුලින් වනාන්තර, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ අනුරාධපුර, මන්නාරම, වව්නියාව සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි මල්වතු ඔය ද්‍රෝණිය ආශ්‍රිතව වනාන්තර, කෘෂිකර්මය සහ සංචාරක ක්ෂේත්‍රයන් හි භූමි පරිහරණ සැලසුම්කරණය හා ආංශික තීරණ ගැනීමේදී සංරක්ෂණය හා තිරසර ක්‍රමෝපායන් අනුප්‍රවාහගත කිරීම තුලින් ගෝලීය වශයෙන් වැදගත්වන්නා වූ ජෛවවිවිධත්වය ආරක්ෂා කිරීම ශක්තිමත් කිරීමයි. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින්, රජයේ සහ සිවිල් සමාජය සම්බන්ධ කරගනිමින් මල්වතු ඔය ද්‍රෝණියේ භූමි ඒකක සඳහා (රිටිගල සිට මිහින්තලය දක්වා සහ යෝධ වැව/මඩු පාර-විල්පත්තු) සහ සමුද්‍රීය පරිසරය (මන්නාරම් බොක්ක, වංකලෙයි-අරිප්පු-සිලාවතුරේ) ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ ඉඩම් පරිහරණය සැලසුම් කිරීමේදී ජෛවවිවිධත්ව සංරක්ෂණය අනුප්‍රවාහගත කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ලබයි. ව්‍යාපෘතිය ප්‍රධාන සංරචකයන් 4 කින් සමන්විත වේ. එනම්,

පළමු සංරචකය:

තීරණ ගැනීම හා ක්‍රියාත්මකවීම සඳහා ආයතනික හැකියාවන් ධාරිතා වර්ධනය කිරීම.

පළමු සංරචකය යටතේ ප්‍රගතිය:

1. පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශය, සොබාදහම සංරක්ෂණ අන්තර්ජාතික සංගමය (IUCN) හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) එක්ව ව්‍යාපෘතියේ ආරම්භක වැඩමුළුව 2021 පෙබරවාරි 25 පවත්වන ලදී. පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩමුළුව සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නිළධාරීන්, පෞද්ගලික අංශයේ මෙන්ම අන්තර්ජාතික සංවිධාන නියෝජනය කරමින් පාර්ශවකරුවන් සහභාගී විය.

වැඩමුළුවේ ප්‍රධාන අරමුණු වූයේ (අ) ව්‍යාපෘති අරමුණු, අපේක්ෂිත ක්‍රියාකාරකම්, නිමැවුම්, ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම; (ආ) පවත්නා තත්ත්වයට අනුව ව්‍යාපෘති පදනම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන සමාලෝචනය කිරීම සහ ව්‍යාපෘති අනුමැතිය සහ ව්‍යාපෘති ආරම්භක දිනය අතර එකඟතාවයට පත් වූ කරුණු යාවත්කාලීන කිරීමට අදාළ යෝජනා ලබා ගැනීම; සහ (ඇ) පරිසරය සහ සමාජීය ආරක්ෂණ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ක්‍රියාකාරී සැලසුම්,වාර්තා කිරීම්, අරමුදල් සැපයීම් කොන්දේසි යනාදියට අනුකූලව ගෝලීය පාරිසරික පහසුකම් පිළිබඳ අවශ්‍යතා පිළිබඳව පාර්ශවකරුවන් සහ



ක්‍රියාත්මක කිරීමේ ආයතන දැනුවත් කිරීමයි.

2. දිස්ත්‍රික් ලේකම්, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් හා පාර්ශවකරුවන් සඳහා ව්‍යාපෘතිය හඳුන්වාදීමේ හා ක්‍රියාකාරකම් හඳුනාගැනීමේ වැඩමුළුවක් අනුරාධපුරයේදී පැවැත්විණි. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුකමිටුවක් ලෙස ව්‍යාපෘතියේ කටයුතු කරගෙනයාමට මෙහිදී තීරණය විය. දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අදාළ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සමග ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.

3. පළමු ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම 2021 ජූලි 2 දින පරිසර අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබීය.

4. ව්‍යාපෘති වෙබ් අඩවිය සංවර්ධනය කිරීම.

පරිසර අමාත්‍යාංශයේ සහ IUCN ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා සන්නිවේදන උපායමාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සති දෙකක වෙබ් සංවර්ධන පුහුණු වැඩසටහනක් සංවිධානය කර පවත්වන ලදී.

5. ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය පිළිබඳ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජනමාධ්‍ය භාවිතය මගින් ජනතාව දැනුවත් කිරීම.

ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය යනු සාමාන්‍ය ජනතාව අතර වඩා වැඩි දැනුවත්වීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරී සහයෝගය සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා සහභාගීත්වය අවශ්‍ය වන නව්‍ය සංකල්පයකි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සිංහල සේවයේ "මිහිතලය" ගුවන් විදුලි වැඩසටහන මගින් අවස්ථා 2 කදී මේ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට කටයුතු



කරන ලදී.

දෙවන සංරචකය: ජෛවවිවිධත්ව සංරක්ෂණයට හා තිරසර ජීවනෝපායන් සඳහා භූ දර්ශ පදනම් කරගත් උපායමාර්ග සැකසීම හා ඒවා දැනට පවතින ප්‍රතිපත්ති රාමුවට ඒකාබද්ධ කිරීම.

තෙවන සංරචකය: ජෛවවිවිධත්ව සංරක්ෂණය තුලින් ලැබිය හැකි සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සහභාගීත්ව ඉඩම් පරිහරණ සැලසුම් හා ජීවනෝපායන් ස්ථාපිත කිරීම.

දෙවන හා තෙවන සංරචකයන්හි ප්‍රගතිය:

•සවිස්තරාත්මක ජෛවවිවිධත්ව ඇගයීම්

මහකනදරාව (භූමිදර්ශය 1) හි සහ තන්තිරිමලේ (භූමිදර්ශය 2) හි ජෛවවිවිධත්ව තක්සේරු කිරීමේ කටයුතු අවසන් කරන ලද අතර එහිදී පහත ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලදී.

ප්‍රදේශයේ පිහිටි පරිසර පද්ධති

ආවේණික සහ තර්ජනයට ලක් වූ විශේෂයන්ගේ වර්තමාන තත්ත්වය සහ ඔවුන් සංරක්ෂණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග

සංරක්ෂණ ප්‍රදේශ යටතේ ආවරණය වී නොමැති පරිසර සංවේදී ප්‍රදේශ වල තත්ත්වය.

ආක්‍රමණශීලී විශේෂවල තත්ත්වය සහ ඒවා පාලනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග

ව්‍යාපෘතිය තුල ප්‍රතිස්ථාපන ක්‍රියාවන් සඳහා නිර්දේශ

- **මල්වතු ඔය ද්‍රෝණිය ආශ්‍රිත ජල තත්ත්ව අධ්‍යනය**

ජලයේ ගුණාත්මකභාවය කෙරෙහි මානව ක්‍රියාකාරකම් දැඩි ලෙස බලපායි. ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය ව්‍යාපෘතිය මඟින් මල්වතුඔය ද්‍රෝණිය ආශ්‍රිත ජල තත්ත්ව අධ්‍යනය ආරම්භ කර ඇති අතර විවිධ පරාමිතීන් සැලකිල්ලට ගනිමින් ස්නානය, පානීය කටයුතු



සහ මසුන් ඇල්ලීම සඳහා යොදා ගන්නා ස්ථානවල ජලයේ තත්ත්වය විශ්ලේෂණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

- **හඳුන්වාදීමේ වීඩියෝව**

ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශ ව්‍යාපෘතිය පිළිබඳ විශේෂයෙන්ම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයන්හි අදාළ පාර්ශවකරුවන් හා ජනතාව



දැනුවත් කිරීම සඳහා වාර්තාමය වීඩියෝවක් භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

සිව්වන සංරචකය: පසුවිපරම් හා දැනුම හුවමාරුව

2.2.12 ජෛව සුරක්ෂිතතාවය පිළිබඳ කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛව සුරක්ෂිතතා රාමුව ක්‍රියාත්මක කිරීම

කාර්ටජිනා සන්ධානයට අනුගතව ජාතික ජෛවසුරක්ෂිතතා මූලාකෘතිය ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීතිමය පසුබිම, ආයතනික හා තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

ව්‍යාපෘති සංරචක 4 කින් සමන්විත වේ;

1 වන සංරචකය:
ජෛව සුරක්ෂිතතාව සඳහාවූ ප්‍රතිපත්ති, ආයතනික හා නියාමන රාමු ශක්තිමත් කිරීම

- ජෛව සුරක්ෂිතතා ප්‍රධාන සැලැස්ම සකස් කර අවසන් කරන ලදී
- ජෛව සුරක්ෂිතතා රෙගුලාසි, ජෛව සුරක්ෂිතතාවය සඳහා වූ පරිපාලන හා මෙහෙයුම් පටිපාටි.
- ශ්‍රී ලංකා ජෛව සුරක්ෂිතතා නිශ්කාෂණ යාන්ත්‍රණ (BCH) වෙබ් අඩවිය එළිදක්වන ලදි. http://lk.biosafetyclearinghouse.net/

2 වන සංරචකය:
අවදානම් තක්සේරුව, අවදානම් කළමනාකරණය සහ අවදානම් සන්නිවේදනය සඳහා පද්ධතිය වැඩි දියුණු කිරීම

පහත මාර්ගෝපදේශ සම්පූර්ණ කරන ලදී.

- පරීක්ෂණාගාරය තුල ජාන විකිරණිත ජීවීන් ආරක්ෂිත ලෙස භාවිතය සඳහා වූ මාර්ගෝපදේශ



- ජාන විකිරණිත ශාක පිළිබඳ පාරිසරික ආපදා තක්සේරුව සඳහා වූ මාර්ගෝපදේශ
- ජාන විකිරණිත ශාක වල සීමිත ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදුකිරීම සඳහා වූ මාර්ගෝපදේශ
- ජාන විකිරණිත ශාක වලින් ලබාගත් ආහාරවල සුරක්ෂිතතාව තක්සේරු කිරීම සඳහා වූ මාර්ගෝපදේශ
- ජාන විකිරණිත මදුරුවන් පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා වූ මාර්ගෝපදේශ
- ආයතනික ජෛව සුරක්ෂිතතා කමිටු සඳහා වූ මාර්ගෝපදේශ
- අවදානම් විශ්ලේෂණ රාමුව
- ඉහත මාර්ගෝපදේශ භාවිතා කිරීම පිළිබඳව අදාල පාර්ශ්වකරුවන් පුහුණු කරන ලදී.
- අවදානම් සන්නිවේදන ක්‍රමෝපාය සහ අවදානම් විශ්ලේෂණය සඳහා අදාල ලියකියවිලි සකස් කරන ලදී.

3 වන සංරචකය:
ජාන විකරණය කළ ජීවීන් (LMOs)/(GMOs) විකරණිත ජීවීන් පරීක්ෂා කිරීම හා හඳුනා ගැනීම සඳහා තාක්ෂණික ධාරිතාව වර්ධනය කිරීම

- ජාතික පැලෑටි නිරෝධායන සේවය (NPQS), කර්මාන්ත තාක්ෂණ ආයතනය (ITI) සහ කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය (AgBC) යන ස්ථානවල විද්‍යාගාර වැඩි දියුණු කිරීම.
- මෙම විද්‍යාගාර ප්‍රතීතනය සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) සමඟ සාකච්ඡා ආරම්භ කරන ලදී.
- මෙම රසායනාගාර වල සේවය කරන විද්‍යාඥයින් ජාන විකරණය කළ ජීවීන් හඳුනාගැනීමේ GMO පරීක්ෂණ සඳහා පුහුණු කරන ලදී.
- නියැදී ලබා ගැනීම, අධීක්ෂණය සහ පරීක්ෂා කිරීම පිළිබඳ අත්පොත් සකස් කරන ලද අතර ආහාර හා පෝෂණ පරීක්ෂකවරුන්, බීජ පරීක්ෂකවරුන්, ශාක නිරෝධායන නිලධාරීන් සහ රේගු නිලධාරීන් 100 කට අධික සංඛ්‍යාවක් හට ජාන විකරණය කළ ජීවීන් හඳුනාගැනීමේ GMO පරීක්ෂා කිරීම, අධීක්ෂණය සහ නියැදී ලබා ගැනීම පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී.

4 වෙනි සංරචකය:
දැනුම වර්ධනය, මහජනතාව දැනුවත් කිරීම, අධ්‍යාපනය සහ සහභාගීත්වය
වර්ධනය කිරීම
ජාතික ජෛව සුරක්ෂිතතා සන්නිවේදන උපායමාර්ගය සකස් කරන ලදී.

2.3 අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රගතිය

2.3.1 මධ්‍යම පරිසර අධිකාරිය

පරිසර දූෂණ පාලන ක්‍රියාකාරකම්

වායු විමෝචන හා අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීමට අදාල මාර්ගෝපදේශ සපයමින්, 2021 වසරේදී අප අධිකාරිය විසින් පාරිසරික නිර්දේශ 822ක් නිකුත් කර ඇත. එසේම, මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2021 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත අතරින් මහා පරිමාණ කර්මාන්ත 10,414ක් (70%) සඳහා ද මධ්‍ය පරිමාණ කර්මාන්ත 7,772ක් (75%) සඳහා ද පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාදී ඇත.

පරිසර ආරක්ෂණ බලපත්‍ර කාණ්ඩය	නිකුත් කරන ලද පරිසර ආරක්ෂණ බලපත්‍ර	
	නව ආරක්ෂණ බලපත්‍ර	බලපත්‍ර අලුත් කිරීම්
මහා පරිමාණ දූෂකාරක කර්මාන්ත – “අ” කාණ්ඩය	931	7,474
මධ්‍ය පරිමාණ දූෂකාරක කර්මාන්ත – “ආ” කාණ්ඩය	517	1,587

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ ලියාපදිංචි වී ඇති කර්මාන්ත 1,118 ක පරිසර දූෂණය පාලනය කිරීමට අදාලව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව, 2021 වසරේ දී ආයෝජන ප්‍රවර්ධන කලාප 05 ක් සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දී ඇති අතර, පාරිසරික ප්‍රමිති හා උපමාන වලට අනුකූල නොවන පරිදි පවත්වාගෙන යනු ලබන සීතාවක ආයෝජන ප්‍රවර්ධන කලාපය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලිය සඳහා පළාත් පාලන ආයතනයන්හි නිලධාරීන් දැනුවත් කිරීම සඳහා 2021 වසර තුළ මාර්ගගත පුහුණු කිරීමේ වැඩසටහන් 4 ක් පවත්වන ලදී.
පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති මාර්ගෝපදේශ සංග්‍රහය මාර්ගෝපදේශය ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කර ඇත.

පාංශු අවශෝෂක සීස්‍රතාවයන්ට අදාල රෙගුලාසිය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලද අතර, පාංශු අවශෝෂක සීස්‍රතාවය මැනීම පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී.

කාර්මික අපද්‍රව්‍ය මුදාහැරීම තුලින් කැලණි ගඟ ආරක්ෂා කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු 8 ක් පවත්වා ව්‍යාපෘති 55 ක් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ ලබාදී ඇති අතර එමඟින් ප්‍රධාන වශයෙන් කැලණි ගඟ ඇතුළු පරිසර පද්ධති වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කර ඇත.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සහිතව ක්‍රියාත්මක වන නියමිත ක්‍රියාකාරකම් පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා නිලධාරීන්ගේ භාවිතය පිණිස මාර්ගෝපදේශ අඩංගු පොතක් සකස් කරන ලදී.

2021 වර්ෂයේදී ගලිබවුසර් සේවා සපයන ආයතන 27 ක් ලියාපදිංචි කරන ලදී. මේ වැඩසටහන යටතේ ගලිබවුසර් සේවා සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.

පැමිණිලි කාණ්ඩය	ලැබුණු පැමිණිලි සංඛ්‍යාව
"අ"කාණ්ඩය	2,491
"ආ"කාණ්ඩය	369
"ඇ" කාණ්ඩය	669

2021 වසර අවසානය වනවිට එම පැමිණිලි අතරින් පැමිණිලි 1,421 ක ප්‍රමාණයක් විසඳා ඇත.

ජල තත්ව පසුවිපරම් ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

2021 වර්ෂයේ වාර්ෂික සැලසුමට අනුකූලව තෝරාගන්නා ලද ජල දේහ 03ක් එනම් කැළණි ගඟ, මා ඔය සහ දියවන්නා ඔයහි පසු විපරම් සිදු කර ඇත. කැළණි ගඟෙහි ස්ථාන 17ක ද, මා ඔයෙහි ස්ථාන 8ක ද සහ දියවන්නා ඔයෙහි ස්ථාන 8ක ද මතුපිට ජල තත්වය පරීක්ෂා කිරීම සිදු කර ඇත. දියවන්නා ඔයෙහි ඇතිවූ ඇල්ගී තත්වය පරීක්ෂා කිරීම සඳහා දියවන්නා ඔයෙහි කඩුවෙල ජල පෝෂක කලාපය තුල හඳුනාගත් හා හඳුනානොගත් ප්‍රභවයන් 42ක් අධීක්ෂණය කිරීම සඳහා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ අධිකාරිය හා ඒකාබද්ධව කටයුතු කරන ලදි.

රසායනාගාර තත්ව කළමනාකරණ පද්ධතිය සංශෝධනය කර නව ISO IEC 17025:2017 ප්‍රමිතීන්ට අනුකූලව ලබාගත් ප්‍රමිති තත්ව සහතිකය වර්ෂ 03 ක් දක්වා ඉදිරියට එනම් 2023 වර්ෂය දක්වා දීර්ඝ කරන ලදි.

ක්ෂුද්‍රජීව විද්‍යා විශ්ලේෂණ අංශය නිසි ලෙස සැලසුම් කිරීම සහ පාරිසරික තත්ත්වයන්ට අනුකූලව වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.

රසායනාගාර සාම්පල විශ්ලේෂණ ක්‍රියාවලියේ දී වැදගත්ම උපකරණයක් වන ජල තත්ව මාපක (ජලයේ pH, විද්‍යුත් සන්නායකතාව, අවිලතාවය සහ උෂ්ණත්වය මැනීමට භාවිතා වන උපකරණය) 15 ක් මිලදී ගෙන ප්‍රාදේශීය රසායනාගාර 10 ක් සඳහා ලබාදෙන ලද අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදෙන ලදී.

ප්‍රාදේශීය රසායනාගාර වල පවතින ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන හෙයින් ඒ සඳහා විකල්පයක් ලෙස කන්ටේනර් තුල අංග සම්පූර්ණ යටිතල පහසුකම් සහිත රසායනාගාර 02ක් නැගෙනහිර සහ උතුරු මැද පලාත් වෙත ලබා දෙන ලදී. තවද, රසායනාගාර විශ්ලේෂණ කටයුතු වලදි නිකුත් වන වාෂ්පශීලී ද්‍රව්‍ය රසායනාගාර නිලධාරීන්ගේ සෞඛ්‍යාරක්ෂාවට හානියක් නොවන අයුරින් විමෝචනය සඳහා ගම්පහ සහ මධ්‍යම පළාත් කාර්යාලීය රසායනාගාර 2 සඳහා දුම් අවශෝෂක කුළුණු (Fume Hoods) ස්ථාපිත කරන ලදී.

ඉන්සි ඉකෝසයිකල් පුද්ගලික සමාගම සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට රසායනික අපජලය පරිසරයට බැහැර කිරීම වැලැක්වීමේ පරිසර හිතකාමී ක්‍රමවේදයක් 2021 වර්ෂයේදී ප්‍රධාන රසායනාගාරය වෙත හඳුන්වා දෙන ලදී.

අනෙකුත් ආයතන / අංශ සමඟ සම්බන්ධීකරණය කල වැඩසටහන්, පුහුණු වැඩමුළු, දේශන සහ රැස්වීම්

අ. අ	වැඩසටහනේ ස්වභාවය	වැඩසටහන් ගණන
01	පාරිසරික බලපෑම් ඇගයීම්/මූලික පාරිසරික බලපෑම් ඇගයීම් කමිටු රැස්වීම් සහ පරීක්ෂා කිරීම් සඳහා සහභාගි වීම	48
02	පුහුණු වැඩමුළු	21
03	දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගිත්වය	08
04	ක්ෂේත්‍ර අධ්‍යයන වලට සහභාගි වීම	06
05	මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි රසායනාගාර පසු විපරම් කිරීමේ ක්ෂේත්‍ර පරීක්ෂණ	18
06	අඹතලේ ස්වංයක්‍රිය ජලතත්ව පසුවිපරම් කිරීමේ කටයුතු පරීක්ෂා කිරීම	26
07	හදිසි/ අත්‍යාවශ්‍ය ක්ෂේත්‍ර පරීක්ෂණ	06
08	වෙනත්	04

2021 වසරේ දී ප්‍රධාන රසායනාගාර සහ පළාත් රසායනාගාර මඟින් විශ්ලේෂණය කරන ලද සාම්පල පිළිබඳ තොරතුරු



වායු තත්ව පසුවිපරම් ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

1996 අංක 01 දරණ ජාතික පාරිසරික (ඝෝෂා පාලන) රෙගුලාසි සංශෝධනයට අදාල අවසන් කෙටුම්පත සකස් කර, 2021.12.22 දින අදාළ පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කරන ලද අතර මාර්ගගතව දෙවන රැස්වීම පැවැත්විණි.

ස්ථානීය ප්‍රභව විමෝචන පාලන රෙගුලාසි ප්‍රතිසංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (SLEMA) සමඟ නව කාල රාමුවක් සකස් කිරීම සම්බන්ධව සාමූහික තීරණයක් ගන්නා ලදී.

වායු තත්ත්ව කළමනාකරණ හා පසුවිපරම් ඒකකය මඟින් කර්මාන්ත සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, පැමිණිලි විමර්ශනය හා නීතිමය කටයුතු සඳහා මෙන්ම වාණිජ පදනමින් ද පහත සේවාවන් සපයනු ලැබේ.

අං	මිනුම් සේවා සැපයීම පිළිබඳ විස්තර		සේවා කටයුතු සංඛ්‍යාව
01	ශබ්ද මට්ටම් මිනුම් කිරීම	දිවා කාලය	48
02		රාත්‍රී කාලය	39
03	සම්පූර්ණ අවලම්බිත අංශුමය ද්‍රව්‍ය		21
04	ඇස්බැස්ටස් තන්තු විමෝචන මිනුම් කිරීම		05
05	වායුගතික විශ්කම්භය මයික්‍රෝන මීටර 10 ට අඩු ක්ෂුද්‍ර අංශු (PM_{10}) මිනුම් කිරීම		02
06	මීතේන් නොවන කාබනික ද්‍රව්‍ය මිනුම් කිරීම		11
07	SO_2 සහ NO_2		03
08	වෙනත් මිනුම් කිරීම - නිශ්චිත නොවන මිනුම් (අලිවෙඩ් පරීක්ෂා		03

2021 වසරේ දී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) දායකත්වයෙන් බස්නාහිර පළාතේ ස්ථාන 25 ක එනම් පාසල් 09 ක, රජයේ ආයතන 10 ක හා නිවාස 06 ක ගෘහස්ත වායු තත්ත්වය මනින ලදි.

පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාකාරකම්

'නියමිත ව්‍යාපෘති' සඳහා පාරිසරික බලපෑම් ඇගයීම (EIA)/ මූලික පාරිසරික පරීක්ෂණ (IEE) ක්‍රියාවලිය පරිපාලනය කිරීම

විස්තරය	ව්‍යාපෘති
පාරිසරික අනුමැතිය ඉල්ලා සිටින මුළු අයදුම්පත්	85
පාරිසරික බලපෑම් ඇගයීම් (EIA) කාණ්ඩය	07
මූලික පාරිසරික පරීක්ෂණ (IEE) කාණ්ඩය	224
අනුමත ව්‍යාපෘතීන්හි EIA/IEE පරිසර	06
අනුයෝජිත ආයතන මඟින් පරිසර බලපෑම් ඇගයීම් අනුමැතිය ලැබීමට යොමු කරන ලද ව්‍යාපෘති ගණන	10
EIA/IEE ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අවශ්‍ය තාක්ෂණික සහයෝගය	52
පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටළු සහ අනෙකුත් අදාළ ගැටළු විසඳීම	22
EIA/IEE අනුමත ව්‍යාපෘති පසුවිපරම් කිරීම	24
නාගරික සංවර්ධන අධිකාරිය සඳහා කැබිනට් මණ්ඩල මඟින් පත් කරන ලද පරිසර උපදේශක කමිටු සඳහා තාක්ෂණික සහාය ලබාදීම	27

උපායමාර්ගික පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය ශ්‍රී ලංකාවට හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම සඳහා නීති විශාරදයින්, පරිසර විද්‍යා ක්ෂේත්‍ර විශේෂඥයින් හා තෝරාගන්නා ලද අදාල පාර්ශවකාර ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත උපදේශක කමිටුවේ 4 වන කමිටු රැස්වීම 2021.07.29 වන දින මාර්ගගත ක්‍රමයට සාර්ථකව පවත්වන ලද අතර ජාතික පාරිසරික පනතේ උපාය මාර්ගික පාරිසරික ඇගයීම් පිලිබඳ යෝජිත සංශෝධන සම්බන්ධයෙන් උපදේශක කමිටුවේ අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු කරන ලදී.

තෙත්බිම් කළමනාකරණය

ලෝක තෙත්බිම් දින ජාතික වැඩසටහන

2021 වසරේ ලෝක තෙත්බිම් දින ජාතික වැඩසටහන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම පරිසර අධිකාරිය සමඟ එක්ව "තෙත් බිම් සහ ජලය" යන තේමාව යටතේ ආනවිලුන්දාව අභය භූමියේ දී පවත්වන ලදි. එසේම, ජාතික වැඩසටහනට සමගාමීව සෑම දිස්ත්‍රික්කයකම පිහිටි තෙත්බිම් ආශ්‍රිතව දැනුවත් කිරීමේ වැඩසටහන්, නිරීක්ෂණ චාරිකා, ශ්‍රමදාන වැඩසටහන්, රුක් රෝපණ වැඩසටහන් ඇතුළු දිස්ත්‍රික් වැඩසටහන් 23 ක් පවත්වන ලදි.

තෙත්බිම් ශ්‍රී ලංකා සඟරාව

"තෙත් බිම් ශ්‍රී ලංකා" සඟරාවේ 5 වන වෙළුම තෙත්බිම් පිළිබඳ විද්වත් ලිපි 6 ක්, සමාලෝචන ලිපි, සංක්ෂිප්ත තාක්ෂණික සටහන්, සජීවී සහ අජීවී තෙත්බිම් සම්පත්, ඒවායේ භාවිතය සහ කළමනාකරණය යන තොරතුරු ඇතුලත්ව ප්‍රකාශයට පත් කරන ලදි.

පාරිසරික ආරක්ෂක ප්‍රදේශයන්ට අදාළ පැමිණිලි සහ ගැටළු හැසිරවීම

පැමිණිලි වර්ගය	පැමිණිලි ප්‍රමාණය	විසඳන ලද පැමිණිලි	කටයුතු කරමින් පවතින පැමිණිලි
'අ' කාණ්ඩය	10	06	04
'ආ' කාණ්ඩය	09	08	01
මුළු ප්‍රමාණය	**19**	**14**	**05**

අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම්

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 3R සංකල්පය ක්‍රියාත්මක කිරීම

ලංකා වාණිජ මණ්ඩලය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂඥයන්ගේ සහයෝගයෙන් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා 3R පුහුණු අත්පොතක් සකස් කරන ලදී.

2021 වර්ෂය තුල නැව්වලින් උපද්‍රවකාරී නොවන/ දූෂිත නොවන ප්‍රතිවක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතුකරන්නන් සඳහා වන පාරිසරික නිර්දේශ (ER) 17ක් නිකුත් කරන ලදී.

පොලිතීන් කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම

ජෛව හායනයට ලක්විය හැකි ආහාර දවටන නිෂ්පාදනය කරන්නන්ගේ ලියාපදිංචිය අලුත් කර අප අධිකාරියේ වෙබ් අඩවියේ දත්ත පද්ධතිය යාවත්කාලීන කරන ලදී. 2021 වර්ෂය තුළදී කොම්පෝස්ට් කළ හැකි ආහාර දවටන සඳහා අවශ්‍ය ප්‍රමිතිය සකස් කරන ලදි

ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනා ගැනීමට අදාළ ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීම

1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 32 වැනි වගන්තිය යටතේ 2021 අංක 01 දරණ ජාතික පාරිසරික නියෝග (ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනාගැනීමේ ප්‍රමිතීන්) 2021.01.21 දිනැති අංක 2211/50 දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

නියාමනය සහ නීතිය බලාත්මක කිරීම

තනි භාවිත ප්ලාස්ටික් පාලනය කිරීම තුළින් අනවශ්‍ය ප්ලාස්ටික් භාවිතය අවම කිරීමේ අරමුණින්, පහත දක්වන ලද ද්‍රව්‍ය තහනම් කිරීම සඳහා 2211/51 රෙගුලාසි 2021.01.21 දින ප්‍රකාශයට පත් කරන ලදී.

a. යම් ක්‍රියාවලියක් වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා පාවිච්චි කරනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා පොලිතීන් ටෙරෙෆ්තැලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) ද්‍රව්‍ය සහ

b. යම් ක්‍රියාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා මෙහි නිශ්චිතව දක්වා ඇති යම් ප්ලාස්ටික් ආයිතමයන් -

i. ශුද්ධ පරිමාව මි.ලි. 20ට/ ශුද්ධ බර 20ට සමාන හෝ ඊට අඩු සැෂේ (Sachets) (ආහාර හා ඖෂධ ඇසුරුම් කිරීමට භාවිතා කිරීම සඳහා හැර)

ii. සුළං වලින් පිරවිය හැකි සෙල්ලම් බඩු (බැලුම්, බෝල, දියමත පාවෙන/ පිහිනුම් තටාක වලදී භාවිතා කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැර)

iii. ප්ලාස්ටික් කූර සහිත කොටන් බඩ්ස් (වෛද්‍ය/ රසායනික ප්‍රතිකාර සඳහා භාවිතා කරන කොටන් බඩ් හැර) භාවිතා කිරීම තහනම් කර ඇත.

ප්ලාස්ටික් වර්ග කාණ්ඩ 07කට 1 සිට 7 දක්වා කේත කර ඇත.

ග්‍රීන්පාර්ක් ඒකාබද්ධ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය

2021 වසරේදී ග්‍රීන් පාර්ක් ඒකාබද්ධ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සිදු කරන ලද කසල කළමනාකරණය පිලිබඳ තොරතුරු

අපද්‍රව්‍ය වර්ග	අපද්‍රව්‍ය ප්‍රමාණය (කි.ග්‍රෑ)
දොම්පේ ප්‍රාදේශීය සභාව මගින් එකතු කර සනීපාරක්ෂක කසල රඳවනය වෙත යොමු කල අපද්‍රව්‍ය	817,530
දොම්පේ ප්‍රාදේශීය සභාව මගින් එකතු කරන ලද කොම්පෝස්ට් අංගනය වෙත යොමු කරන ලද දිරායන අපද්‍රව්‍ය	62,780
දොම්පේ ප්‍රාදේශීය සභාව තුළ පවතින කර්මාන්ත මඟින් යොමු කරන ලද අපද්‍රව්‍ය	773,380
වෙනත් කර්මාන්ත මගින් යොමු කරන ලද අපද්‍රව්‍ය (දොම්පේ ප්‍රාදේශීය සභාවෙන් පිටත ප්‍රදේශයේ)	953,770
විදුරු කුඩු	74,200
මුළු එකතුව	**2,681,660**

පරිසර ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

PET සහ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනික ද්‍රව්‍ය සකස් කිරීම



පරිසර ළමා සමාජ හා පරිසර නියමු වැඩසටහන් හි ප්‍රගතිය

- කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පරිසර ළමා සමාජ හා පරිසර නියමු වැඩසටහන සූම් තාක්ෂණය (Zoom technology) හා වෙනත් තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගෙන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වුවද, ජනාධිපති පදක්කම් පරීක්ෂණ පවත්වා ජනාධිපති පදක්කම්ලාභීන් 129 දෙනෙකු තෝරා ගන්නා ලදී.
- පෙර පාසල් ගුරුභවතුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය ගුරු අත්පොත් 2000 ක් නැවත මුද්‍රණය කර බෙදාහරින ලද අතර ගුරු භවතුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි.
- ළමා සමාජ වැඩසටහන සහ පරිසර නියමු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ගාල්ල දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ වැඩසටහනක් විදුහල්පතිවරුන් 30 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ලදි.
- ජනාධිපති පදක්කම් පූර්ව පරීක්ෂණ 05ක්, ජනාධිපති පදක්කම් පරීක්ෂණ 12ක්, හරිත පදක්කම් පරීක්ෂණ 50ක්, රජත පදක්කම් පරීක්ෂණ 31 ක් හා ස්වර්ණ පදක්කම් පරීක්ෂණ 14ක් පවත්වන ලදී.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශික්ෂණලාභීන් පුහුණු කිරීමේ වැඩසටහනේ ආරම්භක පියවරක් ලෙස අධ්‍යාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද අතර කථිකාචාර්යවරුන් පුහුණු කිරීමේ එක් වැඩසටහනක් කථිකාචාර්යවරුන් 33 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරයේදී අප්‍රේල් මස 22 වන දින පවත්වන ලදි.

- පරිසර නියමු පුවත්පත් 25ක් දිස්ත්‍රික්ක 25 මඟින් මුද්‍රණය කරන ලද අතර (එක් දිස්ත්‍රික්කයකින් පිටපත් 1000ක් පමණ) එම දිස්ත්‍රික්කයේ පාසල් හා රාජ්‍ය ආයතන අතර මෙම පුවත්පත බෙදා හරින ලදි.
- පරිසර නියමු කොමසාරිස්වරුන් හා සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 5ක් හම්බන්තොට ,ගාල්ල, මාතර ,මන්නාරම හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි පවත්වන ලදි.
- 2021 වසරේ දී ජාතික පරිසර නියමු මෙහෙයුම් කමිටු රැස්වීමක් පවත්වන ලදි.
- පරිසර නියමු වැඩසටහනේ දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම, දත්ත යාවත්කාලීන කිරීම හා දත්ත හුවමාරු කර ගැනීම අරමුණු කොට ජාතික පරිසර නියමු දත්ත පද්ධතිය 2021 වසරේ දී වැඩිදියුණු කරන ලදි.
- ජනාධිපති පදක්කම්ලාභී සංසදය මගින් පරිසර සංරක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම.
- 2021 වසරේ දී පරිසර නියමු ජනාධිපති පදක්කම්ලාභීන් විසින් නාගරික තුරුවියන් රුක්රෝපණ වැඩසටහන් 9ක් දිස්ත්‍රික්ක 9කදී (කොළඹ, කළුතර, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල, හම්බන්තොට හා මාතර) ක්‍රියාත්මක කරන ලදි.
- "පරිසරය පිළිබඳ ආගමික ඉගැන්වීම්" යන ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදි.
- අධිකාරියේ 40 වසරක ගමන්මග සැමරීම නිමිත්තෙන්“ මධ්‍යම පරිසර අධිකාරියේ 40වන සංවත්සර සැමරුම” යන පොත ප්‍රකාශයට පත් කරන ලදි.
- ජනාධිපති පරිසර පදක්කම සඳහා සුදුසුකම් ලැබීමට පරිසර නියමුවන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු වේ .එම ව්‍යාපෘති අතුරින් ඉහළ ඇගයීමක් ලැබූ හොඳම ව්‍යාපෘති 17 ක් දිනමිණ හා තිනකරන් පුවත්පත් වල පල කරන ලදි .
- පසුගිය වසරවල ජනාධිපති පදක්කම්ලාභීන්ගේ තොරතුරු ඇතුළත් කරමින් ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය පිළිබඳ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදි.
- විහඟ චිත්‍ර ඇතුළත්" ගෙත්තමක සිත්තම " පාරිසරික සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලදි.
- ගුවන් විදුලි වැඩසටහන් විකාශනය කිරීම.

i. “සංහිත” ගුවන්විදුලි වැඩසටහන - "රන්ගිරි ශ්‍රී ලංකා" ගුවන්විදුලි නාළිකාව ඔස්සේ සතිපතා සෑම සෙනසුරාදාවකම වැඩසටහන් 52ක් විකාශනය කරන ලදි.

ii. “මිටියාවත”ගුවන් විදුලි වැඩසටහන - පරිසර විෂය ක්ෂේත්‍රයට අදාළ විවිධ මාතෘකා පිලිබඳව නාට්‍ය ස්වරූපයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි වෙළඳ සේවය ඔස්සේ සතිපතා සෑම සෙනසුරාදාවකම මෙම වැඩසටහන විකාශනය කරන ලදි.

iii. “පරිසර වියමන” ගුවන් විදුලි වැඩසටහන - කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙරට පාසල් දරුවන්ගේ අධ්‍යයන කටයුතු අඩාල වීම වළක්වාලමින් ඔවුන් වෙත දැනුම ලබා දීම සඳහා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් Vision FM නමින් නව ගුවන් විදුලි නාළිකාවක් ආරම්භ කරන ලදි. එම ගුවන් විදුලි නාළිකාව ඔස්සේ දිනපතා මෙම පරිසර වැඩසටහන විකාශනය කරන ලදි.

- රූපවාහිනී වැඩසටහන් විකාශනය කිරීම

i. “තක්ෂිලාව” පරිසර අධ්‍යාපනික වැඩසටහන් මාලාව යටතේ ස්වාධීන රූපවාහිනී නාළිකාව ඔස්සේ වැඩසටහන් 10ක් ද, වසන්තම් ටීවී නාළිකාව ඔස්සේ දෙමළ වැඩසටහන් 7 ක් ද ලෙසින් වැඩසටහන් 17 ක් විකාශනය කරන ලදි.

ii. "මිස්ටර් ග්‍රීන්" යනු පරිසර ආරක්ෂණය හා සංරක්ෂණය සම්බන්ධයෙන් සමාජයට පණිවුඩයක් ලබාදෙන කෙටි වීඩියෝ පටයකි. මෙම වැඩසටහන මසකට වරක් ස්වාධීන රූපවාහිනියේ විකාශය විය.

iii. පාරිසරික පණිඩිඩ, ස්වාධීන රූපවාහිනිය, ජාතික රූපවාහිනිය, දෙරණ, සිරස, හිරු, ස්වර්ණවාහිනි හා හරිත රූපවාහිනි ඔස්සේ විකාශනය කරන ලදි.

2021 වසරේ දී පරිසර නියමු වැඩසටහන සක්‍රීයව පවත්වාගෙන යනු ලබන අවම පහසුකම් සහිත පහත නම් සඳහන් පාසල් පුස්තකාල 05ක් තෝරාගෙන එහි පාරිසරික අංශය සංවර්ධනය කිරීම උදෙසා පුස්තකාල ද්‍රව්‍ය සහ ගෘහ භාණ්ඩ ලබා දෙන ලදි.

ගාල්ල, මහනුවර හා අම්පාර යන ප්‍රාදේශීය කාර්යාල වෙත පරිසර පුස්තකාල 03 ක් ස්ථාපිත කිරීම සඳහා පොත් 2,227 ක් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන්) සහ අවශ්‍ය අනෙකුත් පුස්තකාල උපකරණ ලබා දෙන ලදි.



2.3.2 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

භූ විද්‍යා අංශයෙහි ප්‍රගතිය කාණ්ඩ 3 ක් යටතේ විස්තර කරනු ලැබේ.

1.භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රතිපාදන වලින් මූල්‍ය සම්පාදනය කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් කටයුතු

2.සේවාදායකයන්ගේ ඉල්ලීම මත ක්‍රියාත්මක කරනු ලබන සේවාදායක ප්‍රතිචාර ව්‍යාපෘති

3.කෙටි ක්ෂේත්‍ර සංචාර, රැස්වීම්, පුහුණු වැඩසටහන් සහ ප්‍රකාශන පළකිරීම ඇතුළත් අනෙකුත් කටයුතු

ක්‍රියාකාරී සැලසුම් කටයුතු (භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රතිපාදන)

2021 වර්ෂය සඳහා භූ විද්‍යා අංශයෙහි ක්‍රියාකාරී සැලසුම් කටයුතු ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර හතරක් යටතේ ක්‍රියාත්මක කරන ලදී.

1 වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය: සිතියම්ගත කිරීම, භූ විද්‍යාත්මක තොරතුරු සකස් කිරීම (භූ විද්‍යා දත්ත) සහ දත්ත බෙදා හැරීම

2 වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය : ඛනිජ ගවේෂණයන්, භූ-භෞතික පරීක්ෂණ සහ සම්පත් ඇගයීම

3 වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය : පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පෘථිවි ලක්ෂණ හා භූ කම්පන කටයුතු අධීක්ෂණය කිරීම

4 වන ප්‍රධාන භූ විද්‍යා ක්ෂේත්‍රය : යටිතල පහසුකම්, විද්‍යාගාර සේවා සහ විදුම් ධාරිතාවය සංවර්ධනය කිරීම

1 වන ප්‍රධාන භූවිද්‍යා ක්ෂේත්‍රය: සිතියම් ගත කිරීම, භූ විද්‍යාත්මක තොරතුරු (භූ විද්‍යා දත්ත) නිර්මාණය කිරීම සහ දත්ත බෙදාහැරීම

(අ) භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම

සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය කරමින් භූ විද්‍යා සිතියම් පළකිරීම කාර්යාංශයෙහි ප්‍රධාන කටයුතුවලින් එකක් වේ. ඛනිජ හා භූගත ජලය ගවේෂණය, ප්‍රධාන ඉදිකිරීම් හා සිවිල් ඉංජිනේරු කටයුතු සහ නායයාමේ උවදුරු පිළිබඳ සිතියම් සකස් කිරීම ආදිය ඇතුළත් කාර්යයන් ගණනාවක් සඳහා භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු අඩංගු භූ විද්‍යා සිතියම් භාවිතා කරනු ලැබේ. 2014 වර්ෂය තුළදී සමස්ත රටම ආවරණය කරමින් (1:100,000 පරිමාණයේ) භූ විද්‍යා සිතියම් 21 ද ඉන්පසු 1:250,000 සිතියම් 4 ද නිම කරන ලදි. 2021 වසරේදී 1: 500,000 සිතියම මුද්‍රණය සඳහා අවසන් අදියරේ සැකසෙමින් පවතී.

(ආ) චාතුර්ථීක සිතියම් (වෙරළ බඩ කලාපය) සැකසීමේ වැඩසටහන

භූ විද්‍යාත්මක කාල පරාසයෙහි චාතුර්ථීක කාලපරිච්ඡේදය මීට අවුරුදු මිලියන දෙකකට පෙර අතීතයේ සිට දිව එයි. ශ්‍රී ලංකාවෙහි චාතුර්ථීක සැකසීම ප්‍රධාන වශයෙන්ම වෙරළබඩ අවසාදිතය, ජල ගැලීම් සිදුවන තැනිතලා ප්‍රදේශවල දියලුමය අවසාදිත සඳහා පමණක් සීමාවී ඇති අතර පස් සැකසීම් මීට ඇතුළත් වේ. මෙම සැකසීම් තුළට ආර්ථිකමය වශයෙන් වැදගත් මැටි සහ වැලි නිධි, කොරල් නිධි, සශ්‍රීක පස් ආවරණය සහ භූගත ජල ප්‍රභව ඇතුලත් වන හෙයින් ඒවා අතිශයින්ම



සුවිශේෂී වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී "චාතුර්ථික භූ විද්‍යා සිතියම් සැකසීම" නම් වූ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. කල්පිටිය, සිලාවතුර හා තිස්සමහාරාමය සිතියම් සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර යාල හා විල්පත්තු සිතියම් වල කටයුතු කොවිඩ් තත්ත්වය නිසා කල් දමන ලදි.

චාතුර්ථික සිතියම් මුද්‍රණය කිරීමේ වැඩසටහන

සිලාවතුර සහ තිස්සමහාරාමය යන සිතියම් සැකසීමේ කටයුතු නිම කරනු ලැබ ඇති අතර ඒවා සංස්කරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

චාතුර්ථික සිතියම් සැකසීමේ වැඩසටහන

කල්පිටිය, යාල, ගාල්ල සහ විල්පත්තු කලාප වල සිතියම් සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතින අතර හලාවත සහ බදුලු ඔය 1: 50000 සිතියම් ප්‍රදේශ තුළ ක්ෂේත්‍ර කටයුතු නිම කරනු ලැබ ඇත.

(ඇ) පාංශු භූ රසායනික සිතියම් සැකසීමේ වැඩසටහන

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික සිතියම් සැකසීමේ වැඩසටහන ආරම්භ කරන ලදි. ඛනිජ ගවේෂණය, පාරිසරික අධීක්ෂණ කටයුතු සහ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු වල දී සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයන කටයුතු වල දී මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. පරමාණුක අවශෝෂණ වර්ණාවලිමානය සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලීමානය යොදාගනිමින් රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි ක්ෂේත්‍ර කටයුතු

කලාප අංක 19 (අලුත්ගම-ගාල්ල) හි ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත. ප්‍රසිද්ධ කරන ලද සිතියම්වල නිශ්චිත ප්‍රදේශ අධ්‍යයනය කිරීම සඳහා සවිස්තරාත්මක භූ රසායනික සිතියම් වැඩසටහන හඳුන්වා දෙන ලදි. මෙම වැඩසටහන යටතේ හම්බන්තොට කාර්මික කලාපයෙහි සවිස්තරාත්මක සිතියම් සැකසීමේ කටයුතු සම්පූර්ණ කරනු ලැබ ඇත.

(ඈ) වාර්ෂික ඛණිජ ග්‍රන්ථය

2019 සහ 2020 යන වර්ෂයන්හි වාර්ෂික ඛනිජ ග්‍රන්ථවල මුද්‍රණ කටයුතු සඳහා අවසාන පිටපත සූදානම් කර ඇත.

(ඉ) පළාත් ඛනිජ පරීක්ෂණ සහ පළාත් ඛනිජ සිතියම්

උතුරු මැද පළාතෙහි සහ සබරගමුව පළාතෙහි පළාත් ඛනිජ සිතියම් මුද්‍රණය කිරීමේ කටයුතු නිම කරන ලද අතර 2019 වර්ෂය අවසානයේදී මුද්‍රණය සඳහා නියමිත අවසන් පිටපත් ලබා දෙන ලදි. ඌව පළාතෙහි මුද්‍රණය සඳහා සූදානම් අවසන් පිටපත 2020 වර්ෂයේ පළමු කාර්තුවේ දී ඉදිරිපත් කරන ලදි. කෙසේ වුවද, මෙම සිතියම් චීනයෙහි මුද්‍රණය කරනු ලබන හෙයින් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්, මුද්‍රණය කරන ලද සිතියම් තවමත් ලැබී නැත.



(ඊ) ඛනිජ සුවිශේෂී සිතියම්/ වාර්තා පිළියෙල කිරීම

තිරිවානා ඉල්ලම් සහ ඛනිජ වැලි පිළිබඳ ඛනිජ සුවිශේෂී වාර්තාවන්හි අවසාන පිටපත් පිළියෙල කරනු ලබමින් පවතී.

3 වන ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍රය

පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පෘථිවි ලක්ෂණ හා භූ කම්පන කටයුතු අධීක්ෂණය කිරීම

ශ්‍රී ලංකාවේ නැගෙනහිර කොටසෙහි භූකම්පන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (2019 වර්ෂයේ සිට ඉදිරියට)

ඉදිකිරීම් කටයුතු සහ සංවේදක සවි කිරීමේ කටයුතු මාර්තු මස මුල් භාගයේ දී නිම කරන ලද අතර ''බල්ක්'' භූකම්පන මධ්‍යස්ථානය විසින් දත්ත ලබාගැනීමේ කටයුතු 2020 මාර්තු 4 වන දින ආරම්භ කරන ලදි.

භූ කම්පන මධ්‍යස්ථාන හතර සහ භූ කම්පන අධීක්ෂණ මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම

භූ කම්පන මධ්‍යස්ථාන හතර මගින් දත්ත ලබාගැනීම 2021 වර්ෂයේ දී සතුටුදායක මට්ටමක පැවති අතර භූවලන, භූ ස්පන්දන සම්බන්ධයෙන් රට තුළ වාර්තා වූ සිදුවීම් සහ ඉන්දියානු සාගරයේ ඇති වූ භූකම්පන සිදුවීම් සම්බන්ධයෙන් මහජනතාව විසින් සිදු කරන ලද විමසීම් සඳහා දත්ත මධ්‍යස්ථානය විසින් සාර්ථකව ප්‍රතිචාර දක්වන ලදි.

භූ කම්පන කලාප සිතියම් සකස් කිරීම

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ සිට කිලෝමීටර 500ක අරයක් ඇතුළත ප්‍රදේශ තුළ සිදුවූ අතීත භූකම්පන සිදුවීම් එමඟින් ආවරණය කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ සහ අවට භූ විද්‍යාත්මක ව්‍යුහයන්හි ශාස්ත්‍රීය සමාලෝචනයන් මත පදනම්ව නැවත ඇගයීමට ලක් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ මධ්‍යම පලාත තුල තාවකාලික භූ කම්පන නිරීක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම

ජී.එෆ්.ඉසඩ් ආයතනය විසින් ලබාදෙන ලද සංවේදක දහයක් දිගන ප්‍රදේශය අවට සවි කරන ලදි. 2021 ජූනි මස සිට දෙසැම්බර් මාසය දක්වා මාස හයක කාල පරිච්ඡේදය තුළ මෙම දත්ත එක්රැස් කිරීම සිදු කරනු ලැබේ.

දැනුවත් කිරීමේ වැඩසටහන්

1.දිගන ප්‍රදේශයේ දී පවත් වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

අපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. 2021 මාර්තු මස 8 වන දින සිට 10 වන දින දක්වා මෙම වැඩසටහන පවත්වන ලදි. මෙම වැඩසටහන සඳහා ඉලක්කගත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වූයේ කුණ්ඩසාලේ සහ පාතහේවාහැට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයි. මෙම දින තුන තුළ වැඩසටහන් හයක් පවත්වන ලදි.

2. මාධ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

පරිසර අමාත්‍යාංශයෙහි අධීක්ෂණය යටතේ 2021 සැප්තැම්බර් මස 23 වන දින මෙම වැඩසටහන සංවිධානය කරන ලදි. භූ කම්පන පිළිබඳව පොදු හැඳින්වීමක් සිදු කර ශ්‍රී ලංකාව තුළ මෑතක දී සිදු වූ භූ කම්පන පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම වැඩසටහන තුළ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදි.

4. වන ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රය යටිතල පහසුකම්, විද්‍යාගාර සේවා හා විදුම් වාර්තා ධාරිතාවය සංවර්ධනය කිරීම.

විද්‍යාගාර ප්‍රතීතනය අයි.එස්.ඕ -17025

තිරුවානාවල , ඩොලමයිට්වල සහ ජලයෙහි රසායනික විශ්ලේෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයෙහි අයි.එස්.ඕ/අයි.ඊ.එස්: 2017 ප්‍රතීතන සහතිකය 2021 ජනවාරි මාසයේදී විශ්ලේෂණ විද්‍යාගාරය වෙත ප්‍රදානය කරන ලදි.

කාර්යය	අපේක්ෂිත ඉලක්කය (සංඛ්‍යාව)	සටහන්
නව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම	1	මුලතිව් ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවන ලදි.
ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉඩම් අත්කර ගැනීම	2	රත්නපුර සහ පොළොන්නරුව
ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම	2	පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය – 75 % කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා – 100 %

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - කැණීම් අංශය කාර්යසාධන සාරාංශය (මූල්‍ය හා භෞතික)

- 2021 වර්ෂය ශ්‍රී ලංකාවේ කැණීම් කටයුතු නියාමනය කිරීම

	වාර්ෂික ඉලක්කය හා ප්‍රතිපාදන වෙන් කිරීම		අත් කරගන්නා ලද මූල්‍ය හා භෞතික ඉලක්ක		(%) ප්‍රගතිය	
	භෞතික ඉලක්කය	මූල්‍ය ඉලක්ක (රු.මිලියන)	අත් කර ගන්නා ලද භෞතික ඉලක්කය	අත් කර ගන්නා ලද මූල්‍ය ඉලක්කය	භෞතික	මූල්‍ය
බලපත්‍ර නිකුත් කිරීම						
ගවේෂණ බලපත්‍ර	35	8	42	8.15	120	101.9
කාර්මික කැණීම් බලපත්‍ර ඒ	150	22.5	117	20.13	78	89.5
කාර්මික කැණීම් බලපත්‍ර බී	400	12	178	5.78	44.5	48.2
කාර්මික කැණීම් බලපත්‍ර සී	1300	13	2,432	26.39	187.1	203
කාර්මික කැණීම් බලපත්‍ර ඩී	800	4	599	3.14	74.9	78.5
ශිල්පීය කැණීම් බලපත්‍ර ඒ	1,450	7.25	1,615	7.84	111.4	108.1
ශිල්පී කැණීම් බලපත්‍ර බී	2,500	5	2,105	4.20	84.2	84.0
වෙළඳ බලපත්‍ර ඒ	30	0.225	18	0.14	60	62.2
වෙළඳ බලපත්‍ර බී	4,400	22	4,229	21.15	96.1	96.1
වෙළඳ බලපත්‍ර සී	10	0.01	-	-	-	0.0
ප්‍රවාහන බලපත්‍ර	1,150,000	103.5	1,432,626	128.94	124.6	124.6
අපනයන බලපත්‍ර	700	3.5	666	3.29	95.1	94.0
රාජ්‍ය භාගය		2,100		2295.5		109.3
පරීක්ෂා කිරීමේ ගාස්තු		312		289.31		92.73
අනිකුත් ආදායම		50		27.16		54.3
පරීක්ෂණ පිපිරවීම් සිදු කිරීම	200	9.2	246	13.62	123	148

2021 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය

	විස්තරය	**2021 වර්ෂයෙහි ඉලක්කගත ආදායම (රු. මිලියන)**	**2021.12.31 දිනට ප්‍රගතිය(රු. මිලියන)**	**වාර්ෂික ප්‍රගතිය %**
1	රාජ්‍ය භාග ආදායම	1,966	2,450	124%
2	බලපත්‍ර ආදායම	246	232	94%
3	පරීක්ෂා කිරීම් වලින් ලද ආදායම	213	286	134%
4	ව්‍යාපෘති සහ විද්‍යාගාර සේවා	82	31	36%
5	වෙනත්	235	231	98%
	මුළු එකතුව	2,742	3,230	118%

ආදායම් විශ්ලේෂණය – 2021 වර්ෂය

2021 වර්ෂයෙහි ඉලක්කගත ආදායම (රු. මිලියන)	**2021.12.31** දිනට ප්‍රගතිය (රු. මිලියන)	වාර්ෂික ප්‍රගතිය %	මූල්‍ය ප්‍රතිපාදන (ස්ථිර තැන්පතු හෝ අනිකුත් ආයෝජන රු. මිලියන)	මහාභාණ්ඩාගාරයට ලබා දෙන ලද ප්‍රදානයන්
2,742	3,230	118	1,726.89	2,000

2.3.3 සිමාසහිත ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

1. කැණීම් අංශයේ ව්‍යාපෘති

- පිපිරුම් අධීක්ෂණ ව්‍යාපෘති
- ගොඩනැගිලි ව්‍යූහාත්මක සමීක්ෂණ
- ව්‍යාපෘති වාර්තා සේවාවන් වල උපදේශන සේවාවන්
- අධීක්ෂණ නිළධාරී සේවාවන්
- පරිසර සංරවක මිනුම් කටයුතු

2. භූ විද්‍යා අංශයේ ව්‍යාපෘති

- භූ විද්‍යාත්මක සිතියම්ගත කිරීම්.
- භූ භෞතික විද්‍යාත්මක සමීක්ෂණ
- භූ තාක්ෂණික සමීක්ෂණ
- ඛණිජ ගවේෂණ ව්‍යාපෘති
- ඛණිජ නිධි ප්‍රමාණ සමීක්ෂණ
- භූ රූපීතා මිණුම් කටයුතු
- පරිසර අධ්‍යන වාර්තා හා සේවාවන්

3. වැලි කැණීමේ ව්‍යාපෘති

- ජී එස් එම් බී ටී එස් - යක්කුරේ හන්දිය, මනම්පිටිය
- ජී එස් එම් බී ටී එස් - වඩමුන හන්දිය, වැලිකන්ද
- ජී එස් එම් බී ටී එස් - 503, හංසයා පාළම, අරලගංවිල
- ජී එස් එම් බී ටී එස් - නිදන්වල
- ජී එස් එම් බී ටී එස් - බෝඅත්ත
- ජී එස් එම් බී ටී එස් - පරෙයිපන්නන්
- ජී එස් එම් බී ටී එස් - කන්තලේ

4. වැලි තොග අංගන

- ජී එස් එම් බී ටී එස් - යක්කල වැලි තොග අංගනය
- ජී එස් එම් බී ටී එස් - හිඟුරක්ගොඩ
- ජී එස් එම් බී ටී එස් - මිණිහිරිගම, මින්නේරිය
- ජී එස් එම් බී ටී එස් - මන්ඩලගිරියගම, මැදිරිගිරිය
- ජී එස් එම් බී ටී එස් - බකමූණ
- ජී එස් එම් බී ටී එස් - නව නගරය
- ජී එස් එම් බී ටී එස් - අඹතලේ
- ජී එස් එම් බී ටී එස් - කෑගල්ල

ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමේ 2021.01.01 සිට 2021.12.31 දක්වා ප්‍රගතිය

සංරවකය	අයිතමය	ප්‍රධාන ක්‍රියාකාරකම	ඉලක්කය 2021 රු. මිලියන	ඒකකය (කියුබ්)	මූල්‍යමය	2021.01.01 සිට 2021.12.31 දක්වා අයවැයගත මුදල	2021.01.01 සිට 2021.12.31 දක්වා ලඟා කරගත් මුදල	%
වැලි කැණීම් ව්‍යාපෘති	1.1	මනම්පිටිය	495.97	144277.75	මූ	495.97	430.16	87%
					භෞ	144277.75	133,363.40	92%
	1.2	අරලගංවිල	20.72	3546	මූ	20.72	10.78	52%
					භෞ	3546	1,906.00	54%
	1.3	බෝ අත්ත	32.09	6124	මූ	32.09	23.71	74%
					භෞ	6124	4,189.00	68%
	1.5	නිදන්වල	24.61	4894.5	මූ	24.61	25.14	102%
					භෞ	4894.5	4,662.50	95%
	1.6	වැලිකන්ද	10.50	2069	මූ	10.5	11.33	108%
					භෞ	2069	2,228.00	108%
	1.7	පරෙයිපඳ්ඳං	17.57	3568.5	මූ	17.57	7.73	44%
					භෞ	3568.5	1,452.75	41%

සංරචකය	අයිතමය	ප්‍රධාන ක්‍රියාකාරකම	ඉලක්කය 2021 රු. මිලියන	ඒකකය (කියුබ්)	මූල්‍යමය	2021.01.01 සිට 2021.12.31 දක්වා අයවැයගත මුදල	2021.01.01 සිට 2021.12.31 දක්වා ලබා කර ගත් මුදල	%
වැලිතොග අංගන	**1.8**	නව නගරය	31.44	4623.35	මූ	31.44	23.30	74%
					භෞ	4623.35	3,345.25	72%
	1.9	හිඟුරක්ගොඩ	19.54	3826.25	මූ	19.54	17.06	87%
					භෞ	3826.25	3,212.00	84%
	1.10	මැදිරිගිරිය	24.83	3168.75	මූ	24.83	22.31	90%
					භෞ	3168.75	2,770.15	87%
	1.11	මින්නේරිය	22.94	3098.22	මූ	22.94	19.95	87%
					භෞ	3098.22	2,619.32	85%
	1.12	යක්කල	25.52	4667.55	මූ	25.52	23.28	91%
					භෞ	4667.55	4,298.65	92%
	1.13	හබරන	17.05	2100	මූ	17.05	10.49	62%
					භෞ	2100	1,239.80	59%
	1.14	කැගල්ල	12.05	2000	මූ	12.05	7.33	61%
					භෞ	2000	1,116.20	56%
	1.15	අඔතලේ	23.45	3750	මූ	23.45	7.77	33%
					භෞ	3750	1,127.30	30%
එකතුව			**780.22**	**192165.58**	මූ	**778.27**	**640.33**	**82%**
					භෞ	**191,713.87**	**167,530.32**	**87%**

භූ විද්‍යා අංශයේ ප්‍රගතිය

සංරචකය	අයිතමය	ප්‍රධාන ක්‍රියාකාරකම	ඉලක්කය 2021 රු. මිලියන	මූල්‍යමය	2021.01.01 සිට 2021.12.31 දක්වා අයවැයගත මුදල	2021.01.01 සිට 2021.12.31 දක්වා ලබා කර ගත් මුදල	%
භූ විද්‍යාත්මක ව්‍යාපෘති	**2.1**	සංචිත ඇස්තමේන්තු	3.56	මූ	3.56	2.85	80%
	2.2	පාරිසරික අධ්‍යන (EIA/IEE)	8.00	මූ	8	0.41	5%
	2.3	ඛණිජ ගවේෂණ	6.00	මූ	6	2.84	47%
	2.4	භූ තාක්ෂණික විමර්ශණ	4.50	මූ	4.5	1.77	39%
	2.5	වෙනත් භූ විද්‍යාත්මක ව්‍යාපෘති	43.00	මූ	43	0.41	1%
එකතුව			**65.06**	මූ	**65.06**	**8.28**	**13%**

කැණීම් අංශයේ ප්‍රගතිය

සංරචකය	අයිතමය	ප්‍රධාන ක්‍රියාකාරකම	ඉලක්කය 2021 රු. මිලියන	මූල්‍යමය	2021.01.01 සිට 20.12.31 දක්වා අයවැයගත මුදල	2021.01.01 සිට 2021.12.31 දක්වා ලභා කර ගත් මුදල	%
පිපිරුම් අධීක්ෂණ	3.1	පිපිරුම් අධීක්ෂණ	28.05	මූ	28.05	25.40	91%
පාරිසරික බලපෑම් අධ්‍යනය සහ අධීක්ෂණ නිළධාරී සේවාවන්	3.2	දූලි අධීක්ෂණ	17.43	මූ	17.43	20.44	117%
	3.3	ශබ්ද පරීක්ෂණ					
	3.4	කම්පන අධීක්ෂණ					
	3.5	ආර්ථික ශක්‍යතා වාර්තා					
	3.6	පිපිරුම් සමීක්ෂණ					
	3.7	GPS වාර්තා					
	3.8	තාක්ෂණික නිළධාරී උපදේශන	16.02	මූ	16.02	13.97	87%
	3.9	වෙනත් කැණීම් ව්‍යාපෘති	0.0593	මූ	0.06	0.08	132%
එකතුව			**61.57**	මූ	**61.57**	**59.88**	**97%**

මානව සම්පත් පැවරුම් හා වෙනත් ආදායම් හී ප්‍රගතිය

සංරචකය	අයිතමය	ප්‍රධාන ක්‍රියාකාරකම	ඉලක්කය 2021 රු. මිලියන	මූල්‍යමය	2021.01.01 2021.12.31 දක්වා අයවැයගත මුදල	2021.01.01 සිට 2021.12.31 දක්වා ලගා කර ගත් මුදල	%
මානව සම්පත් පැවරුම්	4.1	මානව සම්පත් පැවරුම්	30.04	මූ	30.04	29.50	98%
වෙනත් ආදායම්	4.2	ස්ථාවර තැන්පතු	14.25	මූ	14.25	14.49	102%
	4.3	වෙනත් පොලී සහ වෙනත් ආදායම්	1.43	මූ	1.43	38.84	2716%
එකතුව			45.72	මූ	**45.72**	**82.83**	**181%**

2.3.4 ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී වී 63781 යටතේ 2007 අංක 07 දරණ සමාගම් පනතින් පිහිටුවන ලද රජය සතු සමාගමකි. පරිසර අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති මෙම ආයතනය මගින් රාජ්‍ය හා පෞද්ගලික යන අංශයන් සඳහා තිරසර පාරිසරික ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කරණු ලබයි. ආරම්භයේ දී ශ්‍රී ලංකා කාබන් අරමුදල යනුවෙන් හැඳින් වුවද විවිධ පාරිසරික ව්‍යාපෘතීන් සිදු කරමින් වඩාත් පුළුල් ආයතනයක් ලෙස 2016 ජනවාරි 29 දින සිට ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස නම් කරන ලදී.

නිෂ්පාදන හා සේවා

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් තිරසාර පරිසරයක් උදෙසා වූ ව්‍යාපෘතීන් හා උපදේශන සේවාවන් ක්‍රියාත්මක කරයි.

හරිතාගාර වායු සත්‍යාපනය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ISO 14064–1 ;2018 හා ISO 14067 ; 2018 යනාදී අනුකූලතා සහතිකපත් රාජ්‍ය හා පෞද්ගලික අයතන සඳහා පිරිනමනු ලබයි. එසේ පිරිනමනු ලබන්නේ එම ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය අප ආයතනය විසින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුවයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අප ආයතනයට ඉහත සඳහන් සත්‍යාපනය ක්‍රියාවලිය සඳහා අවසර ලබා දී තිබේ. එය දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන්ද පිළිගැනීමට ලක් වේ.

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය යනු, ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පරිසර අමාත්‍යාංශයේ දේශගුණික විපර්යාස අංශයේ සෘජු අධීක්ෂණය යටතේ පරිපාලනය කරනු ලබන ජාතික හරිතාගාර වායු වැඩසටහනයි.මෙම යෝජනා ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරන අතර අපේක්ෂිත පාර්ශ්ව සඳහා ගුණාත්මක බව තහවුරු කළ ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (SCER) නිකුත් කරනු ලබයි.

පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM)

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD)" අධීක්ෂණ වාර්තාව සකස් (MR), කිරීම සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩු කිරීම්(CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි.

බලශක්ති විගණනය

මේ යටතේ ක්ෂේත්‍රයේ විශේෂඥයින් හා තාක්ෂණික උපකරණ මගින් බලශක්ති විගණනයක් සිදු කර එය පරිසර හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කර ඒ සඳහා එම ආයතන ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කර ඒ සඳහා දිරි ගන්වයි.

උපදේශන සේවාවන්

කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මගපෙන්වීම හා නායකත්වය සපයයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා උපදේශන සේවාවන් සපයයි.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් විවිධ පාරිසරික හා දේශගුණික විපර්යාසය සම්බන්ධ ව්‍යාපෘතීන් හා අරමුදල් කළමණාකරණය සිදු කරයි.

1.ගෝලීය පරිසර පහසුකම් අරමුදලෙන් ක්‍රියාත්මක කරන ලද නූතන ජෛව බලශක්ති තාක්ෂණ ව්‍යාපෘතීන්
2.හරිත ලංකා
3.ජාතික අනුහුරුවීමේ සැලසුම
4.අපේක්ෂිත ජාතික නිර්ණය කළ දායකත්වය



අං	ව්‍යාපෘතිය	ප්‍රගතිය
හරිතාගාර වායු විමෝචන ප්‍රකාශනයේ සත්‍යාපනය - ආයතනික මට්ටම		
01	සිටිසන් ඩිවලොප්මන්ට් මූල්‍ය ආයතනය (CDB)	සම්පූර්ණ කර ඇත
02	ඊ බී කේ්රසි ඇන්ඩ් කෝපර්රේෂන්	සම්පූර්ණ කර ඇත
03	ඇමේසන් ටේරසින් (ප්‍රයිවට්) ලිමිටඩ්	සම්පූර්ණ කර ඇත
04	මාස් හෝල්ඩින්ස් - මාස් කැපිටල් (ප්‍රයිවට්) ලිට්මඩ්	සම්පූර්ණ කර ඇත
05	මාස් හෝල්ඩින්ස් - ට්‍රිෂෙල් ෆැබ්රික් (ප්‍රයිවට්) ලිට්මඩ්	සම්පූර්ණ කර ඇත
06	මාස් හෝල්ඩින්ස් - ස්ක්‍රෙව්ලයින් (ප්‍රයිවට්) ලිට්මඩ්	සම්පූර්ණ කර ඇත
07	සීමාසහිත කොත්මලේ කිරි නිෂ්පාදන (පුද්ගලික) සමාගම	සම්පූර්ණ කර ඇත
08	හොරණ ප්ලාන්ටේෂන් පී එල් සී	සම්පූර්ණ කර ඇත
09	කොමර්ෂල් බැංකුව	සම්පූර්ණ කර ඇත
10	අෂ්රොෆ් රෝහල අක්කරපත්තුව (Ashraff Memorial Hospital, Kalmuani)	සම්පූර්ණ කර ඇත
11	ලංකා දුම්කොළ සමාගම	
ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති		
01	ඊ එම්ජේ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්	50% සම්පූර්ණ කර ඇත
02	තලවාකැලේ ටී එස්ටේට් (Thalawakelle Tea Estate PLC)	30% සම්පූර්ණ කර ඇත
03	සීමාසහිත කාගීල්ස් ෆුඩ්ස් සමාගම	20% සම්පූර්ණ කර ඇත
04	නොර් ලංකා පුද්ගලික සමාගම	80% සම්පූර්ණ කර ඇත
05	ඇල්පිටිය වැවිලි පීඑල්සී	80% සම්පූර්ණ කර ඇත
06	යුනිඩිල් පැකේජින් පීඑල්සී	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
07	සීමාසහිත කාගීල්ස් කොලිටි ෆුඩ්ස් පුද්ගිලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
08	සීමාසහිත කාගීල්ස් කොලිටි කන්ෆෙනරීස් පුද්ගලික සමාගම (cargills quality confectionaries (pvt) ltd*	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
09	බෝඩ්පැක් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
10	ස්කෑන්වෙල් ලොජිස්ටික් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
11	සේලයික් පුද්ගලික සමාගම	20% සම්පූර්ණ කර ඇත
12	ටෙක්ස්ට්‍රිප් පුද්ගලික සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
13	හැටන් නැෂනල් බැංකුව	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
14	ලංකා බැංකුව	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
15	සෙලින්කෝ ලයින් ඉන්ෂුවර්ස් සමාගම	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
16	මධ්‍යම පරිසර අධිකාරිය	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
17	නෙස්ලේ ලංකා පීඑල්සී	ගිවිසුම්ගත මට්ටමෙහි පවතී
පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය		
01	ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ජල විදුලි බලාගාර පවිත්‍ර සංවර්ධන වැඩසටහන යටතේ ලියාපදිංචි කිරීම	සම්පූර්ණ කර ඇත
	(a) කාබන් බැර කිරීමේ කාලය අලුත් කිරීම	
	(b) සහතික කරන ලද විමෝචන අඩු කිරීම් CER (මුළු ගණන 74, 147 t Co2e)නිකුත් කිරීම	
	(i) බුලතාවත්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාර	එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC* වෙත අධීක්ෂණ වාර්තා (MR* ඉදිරිපත් කර ඇත
	(ii) මස්කෙළිය ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර	
	(iii) දඹුලූ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර	
	(iv) මොරගහ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර	
	(v) ගෝමලේ ඔය කුඩා පරිමාණ ජල විදුලි බලාගාර	

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ -එෆ්

2021 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදාම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසිඒ -1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	**4**	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		655,409,195	444,774,162	ඒසිඒ -3
	තැන්පතු		117,210,006	37,367,360	ඒසිඒ -4
	අත්තිකාරම් ගිණුම් වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		14,334,709	28,869,905	ඒසිඒ -5
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**786,953,909**	**511,011,427**	
	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**786,953,909**	**511,011,427**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,260,757	11,500,390	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**782,693,152**	**499,511,038**	
	අඩු කළා: වියදම				
	පුනරාවර්තන වියදම්		-	-	
294,125,280	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	265,154,609	179,686,824	
116,203,985	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	103,649,690	77,767,535	ඒසිඒ -2(II) 1

804,000,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	801,126,538	688,140,874	
-	පොළී ගෙවීම්	8	-		
100,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-		
1,214,429,265	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,169,930,837**	**945,595,233**	
	මූලධන වියදම්				
14,003,615	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	9,833,132	4,009,416	
304,422,400	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	39,997,815	1,014,269	
55,000,000	ප්‍රාග්ධන පැවරීම්	12	55,000,000	69,182,745	ඒසිඒ - 2(II)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
3,000,000	හැකියා වර්ධනය	14	1,315,606	580,768	
728,170,000	වෙනත් මූලධන වියදම්	15	517,418,138	157,235,997	
1,104,596,015	**මුළු මූලධන වියදම් (උ)**		**623,564,691**	**232,023,196**	
	තැන්පතු ගෙවීම්		107,283,361	37,636,565	**ඒසිඒ -4**
	අත්තිකාරම් ගෙවීම්		10,907,184	12,461,016	**ඒසිඒ -5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**118,190,545**	**50,097,581**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**1,911,686,073**	**1,227,716,010**	
2,319,025,280	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(1,128,992,921)**	**(728,204,972)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(1,129,253,282)	(728,465,333)	
	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		260,361	260,361	
			(1,128,992,921)	**(728,204,972)**	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ -පී

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය වර්තමාන වර්ෂය රු.	 ඉකුත් වර්ෂය රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ -6	1,594,792,451	21,055,970,423
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ -5/5(අ)	28,558,065	31,985,589
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ -3	260,361	260,361
මුළු වත්කම්		**1,623,610,877**	**21,088,216,373**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		(14,898,043)	(1,543,874)
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		1,594,792,451	21,055,970,423
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ -5(ආ)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ -4	43,456,108	33,529,463
අග්‍රිම ශේෂය	ඒසීඒ -3	260,361	260,361
මුළු වගකීම්		**1,623,610,877**	**21,088,216,373**

පිටු අංක 04 සිට 50 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 51 සිට 86 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර : වෛද්‍ය අනිල් ජාසිංහ	තනතුර :	දිනය :
දිනය : ලේකම් පරිපාලන අමාත්‍යාංශය	දිනය :	ප්‍රධාන මූල්‍ය නිලධාරි පරිපාලන අමාත්‍යාංශය

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්‍ෂ	
	වර්තමාන වර්ෂය රු.	ඉකුත් වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලාභ		
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	18,852,467	22,968,019
අග්‍රිම ලැබීම්	655,409,195	444,774,162
අත්තිකාරම් අයකර ගැනීම්	11,753,408	29,014,320
තැන්පතු ලැබීම්	117,210,006	47,926,393
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**803,225,075**	**544,682,895**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සහනාධාර සහ මාරු කිරීම් වියදම්	328,363,360	274,943,423
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	783,867	77,988,766
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,260,757	14,520,646
අත්තිකාරම් ගෙවීම්	10,661,051	24,336,576
තැන්පතු ගෙවීම්	107,283,361	11,981,771
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**451,352,396**	**403,771,182**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**351,872,679**	**140,911,713**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		
ලාභාංශ		
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		
උපණය අය කර ගැනීම		
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩු කළා - මුදල් වැය කිරීම්:		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	351,872,679	142,153,004

ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**351,872,679**	**142,153,004**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(351,872,679)**	**(142,153,004)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**(1,241,291)**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්		
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**(1,241,291)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**260,361**	**1,501,652**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**260,361**	**260,361**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,121,700,000	1,214,429,265	1,169,930,837	96 %
ප්‍රාග්ධන	875,400,000	1,104,596,015	623,564,691	56 %

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය			1,140,000	302,000	26 %
2	ජනාධිපති කාර්යාලය			436,207	436,207	100 %

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	541,014,957	541,014,957		
9153	ඉඩම්	37,395,503	37,395,503		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරිගෙන යන වැඩ	1,016,381,991	1,016,381,991		
9180	බදු දෙන ලද වත්කම්				

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. FWL/B/ME/02/21/11

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 31 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

පරිසර අමාත්‍යාංශය

පරිසර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පරිසර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1 | Page

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.

වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම්

හයිඩ්‍රොක්ලෝරාෆ්ලෝරා කාබන් ශීතකාරක ආනයනයට අදාල කෝටා බලපත්‍ර නිකුත් කිරීමේදී ආනයන ශීතකාරක කිලෝග්‍රෑම්යකට රු.10ක් වශයෙන් රජයේ ගාස්තුවක් පරිසර අමාත්‍යාංශය විසින් අයකර තිබූ අතර ඒ අනුව 2021 වර්ෂය වෙනුවෙන් එකතු වූ මුළු රජයේ ගාස්තු ආදායම රු.1,560,394ක් විය. මෙම ආදායම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වගන්තිය අනුව හා මු.රෙ. 2 (i) අනුව වර්ෂය අවසානයේදී රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණි. එසේ වුවද මු.රෙ. 83 ප්‍රකාරව වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව තුල මෙම ආදායම ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. විදේශීය ප්‍රධාන මණින් ක්‍රියාත්මක වූ මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය ක්‍රියාත්මක කිරීමට අදාලව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල මෙම ආදායම ව්‍යාපෘති ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.6.1.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම්වල ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම යටතේ මධ්‍යම කඳුකරයේ මහනුවර, බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි නිසරු කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මුළු වියදම් වූ රු.1,179,220 ක මුදලක් දක්වා තිබුණි. ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික ඉඩම් පුනරුත්ථාපනයට අදාල පිරිවැය අමාත්‍යාංශයේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම යටතේ දැක්වීම තුළ අමාත්‍යාංශය සතු වත්කම් අගය වැරදි ලෙස නිරූපණය වේ.

(ආ) පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.261,000,000 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.2. අග්‍රිම ගිණුමේ ශේෂය

අමාත්‍යාංශයේ කළමනාකරණ සේවයේ නිලධාරියෙකු විසින් සිදු කර තිබූ වංචාවක් සම්බන්ධයෙන් කරන ලද විනය පරීක්ෂණයකදී ඔහු වැරදිකරුවෙකු වී තිබුණු අතර ඔහුගෙන් අයවිය යුතුව තිබූ රු.260,361 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. එම මුදල විගණිත දිනය වූ 2022 අප්‍රේල් 08 වන විටත් අයකර ගෙන නොතිබුණි.

1.6.3 පොදු තැන්පත් ගිණුම

කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් සම්බන්ධ භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම් අංක 6000-0-0-16-0-61 යටතේ රු.30,737,540 ක ශේෂයක් වර්ෂ දෙකකට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ පෙන්නුම් කරන අතර මුදල් රෙගුලාසි 570 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 06 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 89,400,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණු අතර වැය විෂයයන් 05 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුදල වූ රු. 225,100,000 න් රු.220,025,402 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරි කිරීම් වල ප්‍රතිශතය සියයට 54 ත් සියයට 97 ත් අතර පරාසයක විය.

(ආ) මුදල් රෙගුලාසි 03 ට අනුව සැලසුම් හා වැඩසටහන් වල ඇතුළත් කාර්යයන් කලින් තීරණය කර ඒවා සිදු කළ යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් පෙර රු.19,350,000 ක් වටිනා ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුනු අතර මෙම මුළු වටිනාකම ම 2021 වර්ෂයේ දෙසැම්බර් මස මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් ව්‍යාපෘති වලට මාරු කර තිබුණි.

(ඇ) 2020 දෙසැම්බර් 23 දිනැති අයවැය වක්‍රලේඛ අංක 07/2020-2021 වියදම් දැරීම සඳහා බලය දීම සහ රාජ්‍ය වියදම් කළමණාකරණය යන වක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී මුල් කාර්තුවේ සිට මිලදී ගැනීම් හා ගෙවීම් කිරීම් කිරීමට හැකිවන පරිදි කාර්යයන් සැලසුම් කල යුතු වන අතර අවසාන කාර්තුවදී ගෙවීම් කිරීමට සිදු වන පරිදි සැලසුම් කිරීම හේතුවෙන් ද්‍රවශීලතා අපහසුතාවලට මුහුණ දීමට සිදු වන බව පැහැදිලි කර තිබුණි. එසේ වුවද අමාත්‍යාංශයේ ගෙවීම් පරීක්ෂාවේදී 2021 වර්ෂයේ දී මුළු වියදමට සාපේක්ෂව පළමු කාර්තුවේ වියදම් සියයට 16 ක් වුවද අවසාන කාර්තුවේදී මුළු වියදමින් සියයට 41 ක ප්‍රමාණයක් වැය දරා තිබුණි. තවද අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනට අදාලව රු.15,541,881 ක් වටිනා බැරකම්වලට හා සුරකිමු ගංඟා ජාතික පරිසර වැඩසටහනට අදාලව රු.18,195,039 ක් වටිනා බැරකම්වලට ද එළඹ තිබුණි.

(ඈ) ඉහත වක්‍රලේඛයේ 06 ඡේදය අනුව අමතර ප්‍රතිපාදන ලබා දීම ඉතා අසීරු බැවින් 2021 වර්ෂය තුල පැන නඟින වියදම් ලබා දී ඇති ප්‍රතිපාදන හොඳින් ප්‍රමුඛතා ගත කරමින් කළමණාකරණය කර ගත යුතු වුවද පහත අවස්ථා සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(i) වැය ශීර්ෂ 160-2-3-145-2509 (ii) (සුරකිමු ගංඟා ජාතික පරිසර වැඩසටහන) සඳහා පරිපූරක ඇස්තමේන්තුවෙන් රු.200,000,000 ක් ලබා ගෙන තිබෙන අතර මින් රු.50,000,000 ක් වෙනත් වැය විෂයකට මාරු කර තිබියදීත් 2021 දෙසැම්බර් 31 දිනට රු.51,189,575ක මුදලක් ඉතිරි වී තිබුණි. මෙය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 34 ක් විය.

(ii) වැය ශීර්ෂ 160-2-6-146-2509 (13) ශ්‍රී ලංකාවේ තිරසාර හා කාර්යක්ෂම විද්‍යුත් වාහන සංචලන පද්ධතියක් ඇති කිරීම සඳහා වන ව්‍යාපෘතිය සඳහා පරිපූරක ඇස්තමේන්තුව මඟින් රු.8,500,000 ක මුදලක් ලබාගෙන තිබුණ ද රු.2,404,850 ක් වර්ෂය අවසාන වන විට ඉතිරි වී තිබුණි.

(ඉ) වැය විෂයය අංක 160-2-3-118-2507(II) වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 20 ක් වූ අතර වර්ෂය අවසානය වන විට වියදම රු.මිලියන 1.6 ක ඉතිරියට හේතු වශයෙන් 2021 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 21/196/304/134 අනුව කරන ලද ඉතිරි වීම් ලෙස දක්වා තිබුණි. උක්ත වැඩසටහනේ වියදම් පරීක්ෂාවේදී මුළු වියදමින් සියයට 75 ක වියදම් 2021 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. මේ අනුව ඉතිරි කිරීම් සඳහා ඉදිරිපත් කර තිබූ හේතු විගණනයේදී පිළිගත නොහැකි විය.

(ඊ) 160 – 2-8-2509-144 වැය විෂය යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 50 ක් වූ අතර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ACA -2(iii) සටහන අනුව ඉහත ශීර්ෂය යටතේ සංශෝධිත ඇස්තමේන්තුවද රු.මිලියන 50 ක් විය. මෙම ව්‍යාපෘතියට අදාලව මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 2(iii) සටහන යටතේ වියදම් ප්‍රකාශයේ වෙනස්වීම්වලට හේතු වශයෙන් 2021 අගෝස්තු 31 දිනැති අමාත්‍යමණ්ඩල තීරණ අංක 21/1596/304/134 අනුව රු.මිලියන 45 ක ප්‍රතිපාදන ඉතිරි කිරීම දක්වා තිබුණි. කෙසේවුවද 2021 ජනවාරි සිට සැප්තැම්බර් 30 දක්වා උක්ත ව්‍යාපෘතියේ කිසිදු වියදමක් දරා නොතිබුණු අතර අපේක්ෂිත වියදමින් ද දරා තිබුණේ සියයට 27 ක ප්‍රතිශතයක් පමණි. මේ අනුව ව්‍යාපෘති සැලැසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය වූ අතර ඉතිරි කිරීම් සඳහා ඉදිරිපත් කර ඇති හේතු විගණනයේදී පිළිගත නොහැකි විය. මේ අනුව අමාත්‍යාංශයේ රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් විවක්ෂණශීලී ක්‍රියාපිළිවෙතක් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන හා සුරකිමු ගංගා ජාතික පරිසර වැඩසටහන යටතේ පුද්ගලයින්, සමිති හා සංවිධාන සඳහා ගෙවීම් ලෙස පිළිවෙලින් රු.15,451,881 ක හා රු.18,195,039 ක බැදීම් හා බැරකම් ඇති කරගෙන තිබුණද ඊට අදාල තහවුරු කර ගැනීම සඳහා අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ගෙවීම් කිරීමේදී පසුවිපරම් කටයුතු ද සිදු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි 104 (1) (4)	හානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 මාර්තු 31 දින වන විටත් අමාත්‍යාංශය සතු වාහන 02 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.
(ආ) 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2018 ජුනි 30 දිනට පෙර රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතාකරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියා පදිංචි කළ යුතුව තිබුණද පරිසර අමාත්‍යාංශය භාවිතා කරන වාහන 03 ක් අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 අවිධිමත් ගණුදෙනු

මධ්‍යම පළාත් කාර්යාලයේ පළමු මහලේ ඉදිකිරීම සඳහා 2021 අගෝස්තු 09 දින අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත රු.5,000,000 ක මුදලක් ලබා දී තිබුණද අදාල කටයුත්ත සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබුණේ 2021 ඔක්තෝබර් මස 06 දින වේ. මේ අනුව අදාල කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමට පෙර මුදල් නිදහස් කර තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) 2021 – 2030 වර්ෂ වෙනුවෙන් ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති බව සඳහන් වුවද මෙම සැලැස්ම විගණිත දිනය වන විටත් කෙටුම්පත් තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2021 මැයි 25 දිනැති අංක අමප007/321/0833/21/ දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍යාංශය ක්‍රියාත්මක කර තිබූ හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණය වැඩසටහන වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දරා තිබූ වියදම රු. 36,462,821 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) වැය ශීර්ෂ අංක 160-02-02-124-2509 (11) යටතේ ක්‍රියාත්මක වූ හුස්ම දෙන තුරු රුක් රෝපණ වැඩසටහනේ කොළඹ දිස්ත්‍රික්කයේ කාර්යසාධනය පරීක්ෂාවේදී 2021 වර්ෂයට වැය කර තිබූ රු.730,250 ක මුදල මඟින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාර්ථක ලෙස කටයුතු කර නොතිබුණි.

3.2. විදේශාධාර ව්‍යාපෘති

(අ) ජනාධිපති ලේකම්ගේ 2019 දෙසැම්බර් 19 දිනැති හා අංක PS/SP/SB/Circular/06/2019 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය අනුව ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසන් වශයෙන් අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීමකින් තොරව තවදුරටත් කිසිදු බැඳීමක් ඇතිකර ගැනීමට හෝ අවබෝධතා ගිවිසුම් හෝ ගිවිසුම්වලට එළඹීමෙන් වැළකී සිටිය යුතු බව සඳහන් වුවද අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර ගිවිසුම්වලට එළඹ තිබුණි.

ව්‍යාපෘතියේ නම	ගිවිසුම් අංකය	ගිවිසුම් ගත වූ දිනය	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද දිනය
i. රසදිය භාවිතය අවම කිරීම සඳහා ජාතික ධාරිතාවය ශක්තිමත් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ රසදිය අඩංගු අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම.	Project ID 2019/01/AP/SRL	2021මාර්තු 15 දින	2021 සැප්තැම්බර් 28
ii. අක්මා සෛල පිළිකා තත්ත්වය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් අක්මා ආරක්ෂාකාරී ප්‍රතිකාර ක්‍රමයක් ලෙස රසදිය අඩංගු “ ලෝකනාථ රස” ඖෂධ භාවිතය	Contract No 300085144	2021 මාර්තු 23	2021 සැප්තැම්බර්

iii. ප්‍රජා පජදක පරිසර පද්ධති ප්‍රවේශය තුළින් වනාන්තර, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය	Project 00117353	ID-	2021 ජනවාරි 01	2021 පෙබරවාරි 09

3.3. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩ සමීක්ෂණයේදී CPU 15 ක්, Monitor 14 ක්, Printer 4 ක්, UPS 30 ක් හා Fax 3 ක් අතිරික්ත භාණ්ඩ ලෙස හඳුනාගෙන එම භාණ්ඩ ප්‍රධාන වවිටෝරු භාණ්ඩ ලේඛනයට ඇතුළත් කර තිබුණත්, එම භාණ්ඩ සිගාස් වැඩසටහන ඇතුළත් කර නොතිබුණි.

(ආ) පරිසර අමාත්‍යාංශය සතු සංචිත වාහන වලින් වාහන දෙකක් ගරාජවල සහ වාහන තුනක් අමාත්‍යාංශ පරිශ්‍රයේ රඳවා ඇති බව අණාවරණය වූ අතර ගරාජයේ ඇති වාහන අවුරුදු හතරක් දක්වා වූ කාලයක් ද අමාත්‍යාංශ පරිශ්‍රයේ ඇති වාහන අවුරුදු දෙකක සිට අවුරුදු හතරක් දක්වා කාලයක් මුදල් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අලුත්වැඩියා කර නොතිබුණි.

(ඇ) 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුව 2020 අගෝස්තු 31 දින වන විට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කරන ලද ධාවන තත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායි නොවන වාහන අපහරණය සිදුකර නොමැති නම් වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ අංක 05/2020 හි 02 (අ) මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි එවැනි වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට වහාම කටයුතු කළ යුතු වුවත් වාහනයක් 2020 දෙසැම්බර් 31 දින අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණද ඉහත චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුමත කාර්ය මණ්ඩලය තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව 17 ක් විය. තනතුරු මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට 44 ක් ලෙස නිරූපණය වීම තුලින් අමාත්‍යාංශයේ මෙහෙයුම් කාර්යසාධනය සඳහා සෘජුවම බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයේ ද්විතික මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරී තනතුරු අතිරික්ත සංඛ්‍යාව දෙකක් විය.

ඩී.වී. චන්ද්‍රලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
දේශගුණික විපර්යාස අවම කිරීම		√	
පරිසර පද්ධතිය සහ ජෛව විවිධත්වය තිරසාර සංරක්ෂණය		√	
තිරසාර පරිසර දූෂණ පාලනය හා අපද්‍රව්‍ය කළමනාකරණය		√	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		0%-49%	50%-74%	75%- 100%
6.b	සුරකිමු ගංඟා වැඩසටහන යටතේ ප්‍රජාව සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී	√		
	ගංගා දූෂණය වැළැක්වීම සඳහා ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීම	√		
12.1	තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුමත කර ඇත			√
12.4	අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කැබිනට් අනුමැතිය ලබා ගැනීම TEC(කාර්මික විද්‍යාල) සිසුන්, VTA (වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ඇති විද්‍යාල) සිසුන් සහ සමාගම් සේවකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	√		
12.7	හරිත ප්‍රසම්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට මහජන අදහස් කැඳවා ඇත. ඒකාබද්ධ කැබිනට් සංදේශය සකස් කිරීම.	√		
12.8	හරිත ගම්මාන පිහිටුවීම සඳහා මාර්ගෝපදේශ පද්ධතියක් සකස් කිරීම.	√		
13.1	අලාභ හා හානි පිළිබඳ අනුහුරුවීම් ජාතිකව නිර්ණය කරන ලද දායකත්වය (NDC) සහ NDC සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සම්බන්ධීකරණය, දේශගුණය ආශ්‍රිත ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ආධාර ලබාදෙන නියෝජිතායතන සහ අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය	√		
13.2	ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්ති සහ පරිසර ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම	√		
	දේශගුණික තිරසාරත්වය සඳහා වූ ක්‍රියාමාර්ග පිළිබඳ ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම හි 3 වන සහ 8 වන තේමාවන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම	√		
	ජාතික සන්නිවේදනයන් (ජාතිකව නිර්ණය කරන ලද දායකත්වය(NDCs), ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ තෙවන ජාතික සන්නිවේදන වාර්තාව (TNC)) එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) වෙත ඉදිරිපත් කිරීම			√
	ජාතික දේශගුණික විපර්යාස අනුහුරුවීම් සැලැස්මක් සකස් කිරීම			√
	දේශගුණයට අනුහුරුවීම සඳහා හරිත දේශගුණික අරමුදලට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම	√		
	දේශගුණික අනුහුරුවීම සඳහා හරිත දේශගුණික අරමුදලට ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම	√		
	හරිතාගාර වායු විමෝචනය ගණනය කිරීම සඳහා දත්ත හුවමාරු පද්ධතියක් ස්ථාපිත කිරීම	√		
13.3	ජාතික දේශගුණික විපර්යාස සැලැස්ම සම්බන්ධයෙන් පළාත් නවයේ අදාළ ආයතන දැනුවත් කිරීම			√
	දේශගුණික විපර්යාස පිළිබඳ පළාත් අනුහුරුවීම් සැලැස්ම ආරම්භ			√

	කිරීම			
	දේශගුණික විපර්යාස පිළිබඳ පළාත් ඒකක පිහිටුවීම ආරම්භ කිරීම			√
	ජාතික අනුහුරුවීම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සකස් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා හරිත දේශගුණික අරමුදලෙන් අනුමැතිය ලබා ගැනීම.			√
	දේශගුණ විපර්යාස අවම කිරීමේ හවුල්කාර ව්‍යාපෘතිය(PMR) යටතේ දේශගුණික විපර්යාස සම්බන්ධ දැනුම වර්ධනය කිරීම			√
	දේශගුණ විපර්යාස පිළිබඳ ජාතික අනුහුරු සැලැස්ම (NAP) ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සූදානම් කිරීම	√		
15.1	ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සැකසීම			√
	වර්ෂ 2022-2026 ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම	√		
	ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම			√
	ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) සඳහා ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම			√
	ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්මක්‍රියාත්මක කිරීම.	√		
	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ කඩොලාන වනාන්තර ප්‍රතිසංස්කරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.		√	
	භූමි හා ජලජ ප්‍රදේශ වල ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) ඉවත් කිරීම.	√		
	ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුලින් වන, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කලමණාකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම: වන, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශ සඳහා ප්‍රජාව කේන්ද්‍ර කරගත් පරිසර පද්ධතිය පදනම් කරගත් ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම	√		
	2022-2030 ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.			√
	ජාතික පාරිසරික සංවේදී කලාප (ESA)ප්‍රතිපත්තිය සකස් කිරීම.		√	
15.2	ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සැකසීම			√
	ශ්‍රී ලංකාවේ ජාතික ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) සඳහා ප්‍රතිපත්තිය සකස් කිරීම			√
	කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.		√	
	ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුලින් වන, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කලමණාකරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම	√		
	ජාතික පාරිසරික සංවේදී කලාප (ESA)ව්‍යාපෘති 3ක් සඳහා කළමණාකරණ සැලසුම් සකස්			√
15.3	ඉඩම් භායනය වැළැක්වීමට අදාළ ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම			√
	ශ්‍රී ලංකාවේ භූමි භායනය වැලැක්වීම සඳහා ඉලක්ක තැබීම			√
	තිරසාර ඉඩම් කළමනාකරණ වැඩසටහන් ආරම්භ කිරීම			√
15.4	ශ්‍රී ලංකාවේ ජාතික ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) සඳහා ප්‍රතිපත්තිය, ජෛව විවිධත්වයට අදාළ පාරම්පරික දැනුම සහ භාවිතයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම			√
	ශ්‍රී ලංකාවේ ජාතික ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) පිළිබඳ පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීම් සිදු කිරීම.		√	
15.5	ජීවී විශේෂ රතු ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලිය, පුහුණුව සහ දැනුවත් කිරීම 1. ශාක විශේෂ පිළිබඳ ජාතික රතු ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම 2020.			√
	2. මිරිදිය මසුන් පිළිබඳ ජාතික රතු ලැයිස්තුව ප්‍රකාශයට පත් කිරීම 2020.			√
	3. කුරුල්ලන් පිළිබඳ ජාතික රතු ලැයිස්තුව 2021 සකස් කිරීම.		√	
	4. ක්ෂීරපායින් පිළිබඳ 2022 ජාතික රතු ලැයිස්තුවේ තක්සේරුව අවසන් කිරීම.		√	

	5. උරගයන්, සමනලුන් සහ බත් කූරන් පිළිබඳ 2022 ජාතික රතු ලැයිස්තුවේ තක්සේරු කිරීම් ආරම්භ කරන ලදී.	√		
	2022-2026 ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා ජාතික උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.	√		
	ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා ජාතික මාර්ගෝපදේශ සකස් කිරීම.			√
	පාරිසරික සංවේදී කලාප (ESA)සංරක්ෂණය සඳහා මහජන සහ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම (ESA ව්‍යාපෘතිය යටතේ)	√		
15.6	ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය සඳහා ප්‍රවේශය සහ සාධාරණ හා සාධාරණ ප්‍රතිලාභ බෙදාගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.			√
	ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම.	√		
15.8	ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ජීවී විශේෂ (IAS) පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම			√
	ජාතික ආක්‍රමණශීලී විශේෂ විශේෂඥ කණ්ඩායම (NISSG) සහ ප්‍රාදේශිය කළමණාකරුවන්ගේ කමිටුව පිහිටුවීම සහ පවත්වාගෙන යාම		√	
	ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ශාක සහ සත්ත්ව විශේෂ හඳුනා ගැනීම, පාලනය කිරීම සහ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක් සමඟ එක්ව සිදු කරන ලදී.		√	
15.a	පරිසර සංවේදී ප්‍රදේශ (මානෑව කන්ද) සඳහා ව්‍යාපාර කළමනාකරණ සැලැස්මක් හඳුන්වා දෙන ලදී.			√
15.b	ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	68	52	16
තෘතීයික	11	11	-
ද්විතියික	115	298	183-
ප්‍රාථමික	61	50	11
වෙනත් (තාවකාලික)	03	02	01

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

යම් ආයතනයක් සතු සම්පත්වලින් ආයතනයේ කාර්ය සාධනය උදෙසා වඩාත්ම වැදගත් සාධකය වනුයේ මානව සම්පත වේ. ඒ අනුව පරිසර අමාත්‍යාංශයේ සමස්ත මානව සම්පත එක් එක් අංශවල මානව සම්පත් අවශ්‍යතාවය පරිදි ස්ථානගත කර ඇත.

මානව සම්පත අංශවලට බෙදා වෙන් කර ඇති ආකාරය අනුව එම නිලධාරීන්ගේ කාර්ය සාධනය අමාත්‍යාංශයේ සමස්ත කාර්යසාධනයට බලපානු ලබයි. එක් එක් අංශවල මාණ්ඩලික නිලධාරීන් මඟින් අදාළ අනෙකුත් නිලධාරීන්ගේ කාර්ය සාධනය මැන බලන අතර ඒ අනුව නිලධාරීන්ට ලබා දී ඇති රාජකාරී ලැයිස්තු හා වැඩ පියවර ලිඛිතව ලබා දී ඇත. ඒ අනුව පවත්නා සීමිත මානව සම්පත හැකි උපරිමයෙන් ආයතනයේ කාර්ය සාදනය උදෙසා ලබා ගෙන ඇත.

අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා නිරන්තරයෙන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතාවය හඳුනා ගනු ලබන අතර ඒ අනුව ලබා දෙන පුහුණුව තුළින් සමස්ත කාර්ය සාධනය ඉහළ යනු ඇත. තවද කාර්ය සාධනය මැන බැලීම තුළින්, නිලධාරීන් ඇගැයීම, ප්‍රශංසා කිරීම වැනි කටයුතු හරහා අනෙකුත් නිලධාරීන් අභිප්‍රේරණය වීම සිදු වන අතර එමගින් ආයතනයේ ඉලක්කයන් නියමිත කාල රාමුව තුළ හැකි උපරිමයට ලගා කර ගැනීමට පිටුබලයක් ලැබුණි. නිලධාරීන්ට යම්කිසි කාලයකට පසුව වෙනත් අංශවල රාජකාරී කටයුතු කිරීමට අවස්ථාව ලබා දීම තුළින් ඔවුන්ට විවිධ විෂයයන් ඉගෙන ගැනීමට හැකියාව ලැබී ඇත.

ඉහත පරිදි පරිසර අමාත්‍යාංශයේ මානව සම්පත විධිමත් පරිදි කළමනාකරණය කර ගැනීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට හැකි වී ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
The fifth session of the United Nations Environment Assembly (UNEA) of the United Nations Environment Programme	5	22.02.2021-26.02.2021			Virtual Meeting	
21-CP-28-GE-WSP-B:Workshop on Ecological Models of Agroforestry Systems	3	16.06.2021-18.06.2021			මාර්ගගත වැඩමුළුව	
The Regional Peer Network - 'Transport and Climate - Asia'	1					
Global Symposium on Soil Biodiversity	1	19.04.2021-22.04.2021			මාර්ගගත	
Online workshop, on Webex platform, on the topic of "Fight against Environmental Crime"	4	05.05.2021			Webinar	
Webinar on Port State Control and Maritime Safety and Security in the Indian Ocean Region	1	04.05.2021			Webinar	
Managing Coastal Biodiversity under Urbanization Pressures	2	05.07.2021-09.07.2021			මාර්ගගත	
Workshop Series on Effects of Climate Change on the Indian Ocean Marine Environment	1	10.05.2021			මාර්ගගත වැඩමුළුව	
Regional Meeting for the Asia-Pacific region in preparation for the online segment of the meeting of the conferences of the parties to the Basel, Rotterdam, and Stockholm conventions	2	08.06.2021-09.06.2021			මාර්ගගත රැස්වීම	
Regional Seminar on Biofouling Management and Invasive Aquatic species	2	16.06.2021			Webinar	
Invitation to the Meeting of the Conferences of the Parties to the Basel Rotterdam and Stockholm Conventions	2	26.07.2021-30.07.2021			මාර්ගගත රැස්වීම	
3rd Round of Political Consultation Meeting between Sri Lanka & Oman via a virtual platform	1	August			Virtual Meeting	
Regional Workshop for Asia and the Pacific "Delivering Energy Efficient and Climate Friendly Cooling through National Cooling Action Plans"	1	30.06.2021				
Webinar on Drought Monitoring and Management using Earth Observation and Weather Forecast Data	2	07.07.2021			Webinar	
43rd Meeting of the Open-ended Working Group	3	14.07.2021-17.07.2021			මාර්ගගත	
International Webinar on the road to Daker	1	13.07.2021			Webinar	

Fourth Meeting of the Conference of Parties to the Minamata Convention on Mercury	3	01.11.2021-05.11.2021			මාර්ගගත	
Dialogue Microplastics as Environmental Stressors: Risk Communication and Community Engagement	7	27.07.2021			මාර්ගගත	
IAEA: NV Technical Meeting on Protection of Nuclear Installation against External Hazards	2	05.10.2021-08.10.2021			මාර්ගගත	
Regional Workshop on health vulnerability and adaptation assessment and national adaptation planning	5	17.08.2021-25.08.2021			මාර්ගගත	
Ministerial Conference on Marine Litter and Plastic Pollution	1	01.09.2021-02.09.2021			මාර්ගගත	
Invitation to the Commemoration of the Second International Day of Clean Air for Blue Skies	6	07.09.2021			මාර්ගගත	
The 4th Forum of Ministers and Environment Authorities of Asia Pacific	2	05.10.2021-07.10.2021	1,376,984	445,060	විදේශීය	
Ecological Civilization -Building a Shared Future for All Life on Earth", the 2021-22 UN Biodiversity Conference	10	12.10.2021-13.10.2021			මාර්ගගත	
14th Regional Environmentally Sustainable Transport (EST) Forum in Asia	3	18.10.2021-20.10.2021			මාර්ගගත	
Singapore Cooperation Programme: Project Management	2	25.10.2021-29.10.2021			මාර්ගගත	
Registration and preparatory work of the COP12(II)/MOP33	4	23.10.2021-29.10.2021			මාර්ගගත	
The 26th UN Climate Change Conference of the parties (COP26)	5	01.11.2021-12.11.2021	2,149,806		විදේශීය	
Virtual Workshop on "Earth Observation for an Indian Ocean Blue Economy"	1	23.11.2021-25.11.2021			මාර්ගගත	
Workshop on "The Urgency of Climate Change and its Consideration as a Topic in IORA"	1	08.11.2021			මාර්ගගත	
UN Ocean Decade Kickoff Conference	1	25.11.2021-26.11.2021			මාර්ගගත	
Second ESCAP Executive Training on Environment and Development	3	29.11.2021-03.12.2021			මාර්ගගත	
21-CP-60-GE-WSP-B: Workshop on Agro-ecological Systems	1	14.12.2021-16.12.2021			මාර්ගගත	
Workshop on Strengthening Coordination for Measuring Progress on Responsible Consumption and Production and Policy Coherence	6	30.11.2021-02.12.2021			මාර්ගගත	
Regional Workshop on Enabling Sectoral Interventions for Clean Air in Cities through Breathe Life Initiative	1	08.12.2021-09.12.2021			මාර්ගගත	

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ආයතනයට නිරන්තරයෙන් නවක හා ස්ථාන මාරු වන නිලධාරීන් සම්බන්ධ වන බැවින් ආයතනයට අදාල වූ රාජකාරී සඳහා නිලධාරීන් පුහුණු කරවීම තුලින් ආයතනයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි වීම තුලින් ආයතනයේ ඉලක්ක කරා ලඟා වීම පහසු කරවයි.
2. ආයතනයේ නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන් / ධාරිතා වර්ධන වැඩසටහන් හරහා දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමෙන් ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

3. නව තාක්ෂණික ක්‍රමවේදයන් මානව සම්පත හරහා ආයතනයට අවශෝෂණය කර ගැනීම තුළින් ආයතනික ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරගැනීමට හැකිවීම හා වඩා ඵලදායී සේවාවක් ලබාදීමට හැකිවීම.
4. ආයතනයේ විධායක හා කළමනාකරණ මට්ටම හා පහළ ශ්‍රේණිවල නිලධාරීන් අතර මනා සන්නිවේදන ක්‍රමවේදයක් ඇතිකිරීම මඟින් ඔවුන් අතර සුහදතාවය වර්ධනය වන නිසා, ඇතිවන ගැටලුකාරී තත්ත්ව සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට හැකිවීමෙන් ආයතනයේ ඵලදායීතාව ඉහළ නැංවීම.
5. ආයතනික දැක්ම, මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතා වලින් හෙබි මානව සම්පත වර්ධනය කර ගත හැකිවීම.

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නැත.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත.		
1.6	වෙනත්	අදාල නැත.		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම			
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	i. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලින් ප්‍රමාද වී ඇති අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා ගැනීමට සිහිකැඳවීම් ලිපි යොමු කිරීම ii. ෑම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමකදීම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේ ප්‍රගතිය පසුවිපරම් කිරීම	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	රටතුල පැවති කොවිඩ්-19 තත්වය මත වර්ෂයක් තුල අවම වශයෙන් කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති අතර, ඒ අනුව වර්ෂය තුල විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇත.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිහහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිහහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	-	නැත	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.	-	
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ. සෑම කාර්තුවක් අවසානයේ ඊළඟ මාසයේ දිනට 15පෙර	-	
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	සකස් කර ඇත.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		මානව සම්පත් සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කරගැනීමට අපේක්ෂා කෙරේ
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මණින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය.